# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

# ප්‍රගති වාර්තාව - 2025

**(2025.01.01 – 2025.09.30)**

## වෙළුම I

## සාමාන්‍ය අධ්‍යාපනය

CM 043393 - 50 (2025/10) රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

# දැක්ම

ශ්‍රී ලාංකේය අනන්‍යතාවෙහි හවුල්කරුවන් වන දක්ෂ පුරවැසි පිරිසක් මඟින් විශ්ව සමාජයේ විශිෂ්ටත්වය කරා එළඹීම.

# මෙහෙවර

පාර්ශ්වකරුවන් තෘප්තිමත්භාවයට පත් වන්නා වූ, කාර්යක්ෂමතාව හා උසස් ගුණාත්මකභාවය තහවුරු කරන ලද්දා වූ, නවීකෘත අධ්‍යාපන ප්‍රවේශයක් තුළින් ජාත්‍යන්තර ප්‍රවණතාවන්ට සරිලන්නා වූ දක්ෂ පුරවැසි පිරිසක් බිහිකිරීම.

# පටුන


| | | |
|---|---|---|
| 01. | අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය | 01 |
| | විෂය පථය | 01 |
| | කාර්යයන් හා කර්තව්‍යයන් | 01 |
| | පාසල් පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් (2024) | 04 |
| 02. | අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ | 08 |
| 03. | 2025 වර්ෂයේ ප්‍රගතිය | 20 |
| | විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු - | 113 |
| | **( මහා පරිමාණ/විදේශ අරමුදල් ව්‍යාපෘති සාරාංශය )** | |
| 04. | මූල්‍ය ප්‍රගතිය | 115 |
| 05. | ශිෂ්‍ය සාධනය | 117 |
| 06. | සාමාන්‍ය අධ්‍යාපන අංශයට අනුබද්ධ ආයතන | 121 |
| | ජාතික අධ්‍යාපන ආයතනය | 121 |
| | අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව | 124 |
| | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | 137 |
| | යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව | 150 |
| | රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව | 154 |
| | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 156 |

## 01. අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
## අමාත්‍යාංශයේ කාර්යභාරය

**විෂය පථය**

ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අංශ සම්බන්ධ ප්‍රතිපත්ති සහ වැඩසටහන් සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම, කාර්යක්ෂම හා මහජන හිතකාමී අයුරින් රාජ්‍ය සේවා සැපයීම සහතික කිරීම සහ නාස්තිය සහ දූෂණය පිටුදැකීම සඳහා පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම, මුල් ළමාවියේ සිට උසස් අධ්‍යාපනය දක්වා ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම, විශේෂ අවශ්‍යතා ඇති දරුවන් ඇතුළු සියලු ම දරුවන්ට බාධාවකින් තොර අධ්‍යාපනයට ප්‍රවේශ වීම සහතික කිරීම, වෘත්තීය හා තාක්ෂණික අධ්‍යාපනය ප්‍රවර්ධනය, තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම, පර්යේෂණ සහ නවෝත්පාදන සඳහා සහාය වීම, ජාතික පාසල් අධීක්ෂණය, පුද්ගලික සහ ජාත්‍යන්තර පාසල් නියාමනය, රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය හා අධ්‍යාපන ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම, රැකියා වෙළෙඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා වෘත්තීය අධ්‍යාපනය නවීකරණය, බෞද්ධ හා පාලි අධ්‍යයනය ප්‍රවර්ධනය කිරීම, ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතිය ගෝලීය ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම ආදිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ.

**කාර්යයන් හා කර්තව්‍යයන්**

- රජය මගින් ක්‍රියාත්මක කරනු ලබන ජාතික ප්‍රතිපත්ති මත පිහිටා අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් දෙපාර්තමේන්තු හා ව්‍යවස්ථාපිත ආයතන හා රාජ්‍ය සංස්ථාවන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, උපායමාර්ග, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම
- අමාත්‍යාංශ විෂයය පථයට අයත් වන මහජන සේවා කාර්යක්ෂම ව හා මහජන හිතකාමී අයුරින් ලබා දීම
- නාස්තිය හා දූෂණය පිටුදකිමින් අමාත්‍යාංශයේ කාර්යභාරය ඉටු කිරීම සහතික කිරීමට ඉවහල් වන ආකාරයට නවීන කළමනාකරණ ක්‍රම හා තාක්ෂණය යොදා ගනිමින් සියලුම ක්‍රම සහ විධි ප්‍රතිසංස්කරණය කිරීම
- පූර්ව ළමාවිය, ප්‍රාථමික, ද්විතීයික සහ තෘතීයික අංශ අතර මනා සම්බන්ධතාවක් ඇති වන පරිදි අධ්‍යාපන සංවර්ධනයට අදාළ ආංශික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- ගෝලීය අභියෝගයන්ට ආත්ම විශ්වාසයකින් සහ සාර්ථකත්වය පිළිබඳ විශ්වාසයකින් යුතුව ශ්‍රී ලාංකික ළමා හා යෞවන පරපුරට ප්‍රවේශ වීමට හැකියාව ඇති කරවන අන්දමේ ජාතික අධ්‍යාපන ක්‍රමයක් නිර්මාණය කිරීම
- පෙර පාසල් අධ්‍යාපනයේ සිට උසස් අධ්‍යාපනය සම්පූර්ණ කරන තෙක් ම පැහැදිලි මාර්ග සැලැස්මක් සකස් කිරීම සඳහා ප්‍රතිපත්තිමය මගපෙන්වීම ලබා දීම
- පෙර පාසල් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කිරීම
- සෑම දරුවෙකුට ම අධ්‍යාපනය සඳහා ප්‍රවේශ අයිතිය සහතික කිරීම

- ජාතික ආර්ථිකයට සාධනීය දායකත්වයක් සහ ක්‍රියාශීලී ව සාමාජීය වගකීම් ඉටු කළ හැකි පුරවැසියන් බවට පත්කිරීමෙහිලා දරුවන් සූදානම් කරවීමට පාසල් තුළ විෂයය බාහිර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම
- ජාතික පාසල් සඳහා අවශ්‍ය මානව හා භෞතික සම්පත් සැපයීම
- ජාතික අධ්‍යාපන ප්‍රතිපත්තියට අනුකූල ව ජාත්‍යන්තර සහ පෞද්ගලික පාසල් නියාමනය කිරීම
- අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, සිසු විනය සහ සදාචාරය මනා අයුරින් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය පියවර ගැනීම
- විශේෂ අවශ්‍යතා ඇති සිසුන් සඳහා අධ්‍යාපන අවස්ථා තහවුරු කිරීමට අවශ්‍ය පියවර ගැනීම
- ජාතික හා සන්ධාන භාෂා අධ්‍යාපනය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- බෞද්ධ හා පාලි අධ්‍යයන කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ආගමික අධ්‍යාපනයේ අරමුණු ඉටුවන අන්දමින් පිරිවෙන් අධ්‍යාපනය නඟාසිටුවීම
- ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවය, විදුහල්පති සේවය සහ ගුරු සේවයේ පරිපාලන සහ අනෙකුත් අධ්‍යාපන සේවාවන්වල පිරිස් කළමනාකරණ කටයුතු
- පාසල් පුස්තකාල ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- පාසල් පෙළ පොත්, නිල ඇඳුම්, වෙනත් ශිෂ්‍ය අවශ්‍යතා සහ පහසුකම් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම
- සියලු පාසල්වල සනීපාරක්ෂක කටයුතු, ළමා මිතුරු පංති කාමර, ගුරුවරුන්ගේ නේවාසික හා විවේකාගාර පහසුකම් ඇතුළු සියලු භෞතික පහසුකම් දියුණු කිරීම
- ඉගෙනුම් සහ ඉගැන්වීමේ ක්‍රියාවලිය සඳහා නූතන තාක්ෂණික පහසුකම් යොදා ගැනීම ප්‍රවර්ධනය සහ සංවර්ධනය
- වෘත්තීය අධ්‍යාපනය සඳහා ඇති නැඹුරුව ඉහළ නැංවීම සඳහා ක්‍රමෝපායන් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීම
- අධ්‍යාපන සුදුසුකම් නොසලකා වෘත්තීය අධ්‍යාපනය ලබා ගැනීමට අවස්ථා ඇති කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළට උචිත ශ්‍රම බලකායක් නිර්මාණය කිරීම සඳහා කාර්මික හා තාක්ෂණ අධ්‍යාපනය නවීකරණය කිරීම
- පාසල් අධ්‍යාපනය හැර යාමෙන් පසු විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා සුදුසුකම් නොලබන සිසුන්ට වෘත්තීය අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති සැකසීම හා පහසුකම් සැපයීම
- ආධුනිකත්ව පුහුණු අවස්ථා ප්‍රවර්ධනයට පියවර ගැනීම
- යෝග්‍ය වෘත්තීය පුහුණු ආයතන, තාක්ෂණවේදී උපාධි පිරිනමන ආයතන බවට පත් කිරීම
- දැනට පවත්නා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම් තල 7 සිට තල 10 දක්වා වැඩි කිරීම හා ඊට අනුරූප ව ශ්‍රී ලංකා සුදුසුකම් රාමුව (SLQF) සංශෝධනය කිරීම
- වෘත්තීය අධ්‍යාපන පාඨමාලාවන්ට ව්‍යවසායකත්වය, තොරතුරු තාක්ෂණය, ඉංග්‍රීසි සහ අනෙකුත් භාෂා ඇතුළත් කරමින් විෂය මාලා සංශෝධනයක් සිදු කිරීම

- ජංගම තාක්ෂණික අධ්‍යාපන සේවා මගින් වෘත්තීය පුහුණු අවස්ථා පුළුල් කිරීම
- 10 වසර සිට 13 වසර දක්වා වෘත්තීය අධ්‍යාපන ධාරාව හඳුන්වා දීම හරහා විවිධ කාර්මික ක්ෂේත්‍රවල සේවය කිරීමට සිසුන් සූදානම් කිරීම
- හෙද පාසල්, ජාතික හෙද විශ්වවිද්‍යාලයක් වෙත ඒකාබද්ධ කිරීම
- ජාත්‍යන්තර පර්යේෂණ ආයතන සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණ ආයතනවලට පහසුකම් සැපයීම
- නවෝත්පාදන හා පර්යේෂණ ප්‍රතිඵල ප්‍රයෝජනයට ගැනීම සඳහා කාර්යක්ෂම යාන්ත්‍රණයක් සකස් කිරීම
- විද්‍යාත්මක, කාර්මික හා සමාජ, ආර්ථික පර්යේෂණ හා සංවර්ධන කටයුතු පුළුල් කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම
- නව සොයා ගැනීම් සඳහා ප්‍රජාව යොමු කිරීම සහ පෙලඹවීම
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පරිපාලනයට අයත් රාජ්‍ය විශ්වවිද්‍යාල කළමනාකරණය සහ සංවර්ධනය කිරීම
- විශ්වවිද්‍යාල වෙත ඇතුළත් කර ගැනීමේ දී පවතින ප්‍රමාදයන් තුරන් කිරීම
- තෘතීය අධ්‍යාපන ආයතන සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම
- පශ්චාත් උපාධි අධ්‍යාපන සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සැපයීම
- ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපනයේ ගුණාත්මක අගය වැඩිදියුණු කිරීමේ අරමුණ ඇතිව අන්තර්ජාතික ශාස්ත්‍රීය ආයතන සහ වෙනත් සංවිධාන සමග අනුබද්ධ වීම හා සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීම
- උසස් අධ්‍යාපනය සඳහා වන ප්‍රවේශ මාර්ග පුළුල් කිරීම සඳහා යෝග්‍ය නිර්ණායක හඳුනා ගැනීම හා ක්‍රියාත්මක කිරීම
- දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ ඉලක්ක කර ගනිමින් උපාධිධාරීන් බිහි කිරීම සඳහා සමස්ත අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ප්‍රතිපත්තිය තුළ විෂය මාලා සංශෝධනය කිරීම
- විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ පර්යේෂණ හා නව නිපැයුම් දිරි ගැන්වීම සඳහා පහසුකම් ඇති කිරීම
- ශ්‍රී ලංකාවේ සුදුසුකම් සහිත සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාල සඳහා ප්‍රවේශ වීමට හැකි වන ලෙස ශිෂ්‍යත්ව වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පෞද්ගලික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන නියාමනය සහ ප්‍රතීතනය කිරීම
- බෞද්ධ හා පාලි අධ්‍යාපනය ඉහළ නැංවීම සහ භික්ෂූන් වහන්සේලාගේ උසස් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම

- ගෝලීය අවශ්‍යතාවට ගැළපෙන පරිදි සමස්ත අධ්‍යාපන ක්ෂේත්‍රය ම ආවරණය වන ලෙස අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හඳුන්වා දීම
- තොරතුරු තාක්ෂණය සම්බන්ධ කරමින් දුරස්ථ අධ්‍යාපන අවස්ථා පුළුල් කිරීම
- ඵලදායි ඉගෙනුම් සහ ඉගැන්වීම් ක්‍රියාවලියක් සාක්ෂාත් කිරීම සඳහා අවශ්‍ය ගුරුවරුන් බිහිකිරීම සඳහා ගුරුවරුන් පුහුණු කිරීම හා ඔවුන්ගේ කුසලතා සංවර්ධනය
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතනවල පැවරී ඇති අනෙකුත් සියලු ම විෂයයන්ට අදාළ කටයුතු
- අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් සියලු ම ආයතන අධීක්ෂණය කිරීම

## පාසල් පද්ධතිය පිළිබඳ සංඛ්‍යා දත්ත සැකෙවින් (2024)

**රජයේ මුළු පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 10,076 | 237,787 | 3,816,234 |

**පාසල් වර්ගීකරණය හා පරිපාලනය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසල් වර්ගය | පාසල් සංඛ්‍යාව | | ශිෂ්‍ය සංඛ්‍යාව | | ගුරුවරු සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් | ජාතික පාසල් | පළාත් පාසල් |
| **1AB** | 370 | 639 | 813,039 | 753,666 | 41,437 | 39,020 |
| **1C** | 25 | 1934 | 20,189 | 966,178 | 1,853 | 63,211 |
| **2 වර්ගය** | 1 | 3251 | 10 | 667,725 | 10 | 57,889 |
| **3 වර්ගය** | | 3856 | | 595,427 | - | 34,367 |

**පළාත අනුව රජයේ පාසල් වර්ගීකරණය**

| පළාත | ජාතික පාසල් | පළාත් පාසල් | මුළු රජයේ පාසල් |
|---|---|---|---|
| බස්නාහිර | 79 | 1,260 | 1,339 |
| මධ්‍යම | | 1,455 | 1,511 |
| දකුණ | | 1,030 | 1,100 |
| උතුර | | 945 | 969 |
| නැගෙනහිර | | 1,086 | 1,128 |
| වයඹ | | 1,202 | 1,241 |
| උතුරු මැද | | 789 | 806 |
| ඌව | | 854 | 892 |
| සබරගමුව | | 1,059 | 1,090 |
| **මුළු එකතුව** | **396** | **9,680** | **10,076** |

**පාසලේ පන්ති පරාසය අනුව රජයේ පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පන්ති පරාසය | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-5 | 3,856 | 34,367 | 595,427 |
| 1-9 | 249 | 625 | 28,874 |
| 1-11 | 2,983 | 56,975 | 637,028 |
| 1-13 | 2,003 | 93,626 | 1,648,726 |
| 6-11 | 20 | 299 | 1,833 |
| 6-13 | 965 | 51,895 | 904,346 |

**පාසලේ ශිෂ්‍ය සංඛ්‍යා පරාසය අනුව පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසලේ ශිෂ්‍ය සංඛ්‍යාව | පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|---|
| 1-50 | 1,576 | 8,967 | 47,092 |
| 51-100 | 1,655 | 15,902 | 122,931 |
| 101-200 | 2,147 | 29,543 | 313,999 |
| 201-500 | 2,580 | 55,592 | 821,362 |
| 501-1000 | 1,250 | 48,317 | 858,854 |
| 1001-1500 | 378 | 23,242 | 455,783 |
| 1501-2000 | 194 | 16,771 | 334,020 |
| 2001-3000 | 192 | 22,435 | 461,562 |
| 3001- 4000 | 68 | 10,168 | 229,113 |
| 4000ට වැඩි | 36 | 6,850 | 171,518 |

**ඉගෙනුම් මාධ්‍ය අනුව රජයේ පාසල් සංඛ්‍යාව**

| ඉගෙනුම ලබන මාධ්‍ය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| සිංහල **පමණක්** | 6,204 |
| දෙමළ **පමණක්** | 2,995 |
| සිංහල හා දෙමළ | 36 |
| සිංහල හා ඉංග්‍රීසි | 607 |
| දෙමළ හා ඉංග්‍රීසි | 196 |
| සිංහල, දෙමළ හා ඉංග්‍රීසි | 38 |

**අ.පො.ස.(උසස් පෙළ) එක් එක් විෂය ධාරාව සහිත රජයේ පාසල් සංඛ්‍යාව**

| විෂය ධාරාව | පාසල් |
|---|---|
| විද්‍යා විෂය ධාරාව සහිත මුළු පාසල් | 1,009 |
| ජීව විද්‍යා | 997 |
| භෞතික විද්‍යා | 957 |
| කලා | 2,948 |
| වාණිජ | 1,871 |
| තාක්ෂණ (ජෛව තාක්ෂණය/ ඉංජිනේරු තාක්ෂණය) | 558 |
| පොදු / වෘත්තීය  විෂය ධාරා | 614 |

**පත්වීම් ස්වභාවය අනුව රජයේ පාසල්වල ගුරුවරු සංඛ්‍යාව**

| පත්වීම් ස්වභාවය | පිරිමි | ගැහැණු | එකතුව |
|---|---|---|---|
| පුහුණුව ලත් | 25,906 | 75,355 | 101,261 |
| උපාධිධාරී | 9,278 | 28,517 | 37,795 |
| පුහුණුව ලත් | 20,466 | 73,463 | 93,929 |
| නුපුහුණු | 850 | 3,608 | 4,458 |
| වෙනත් | 70 | 274 | 344 |
| එකතුව | **56,570** | **181,217** | **237,787** |

**රජයේ උපකෘත පෞද්ගලික පාසල් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාසල් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 95 | 8,170 | 137,886 |

**පිරිවෙන් සංඛ්‍යාව, ගුරුවරු සංඛ්‍යාව හා ශිෂ්‍ය සංඛ්‍යාව**

| පිරිවෙන් සංඛ්‍යාව | ගුරුවරු සංඛ්‍යාව | ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| 822 | 7,342 | 69,108 |

| කලාප අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව | කොට්ඨාස අධ්‍යාපන කාර්යාල සංඛ්‍යාව |
|---|---|
| 100 | 312 |

**මූලාශ්‍රය :** සංඛ්‍යාලේඛන ශාඛාව**,** අධ්‍යාපන අමාත්‍යාංශය  පාදක දිනය  : 2024.12.31

## 02. අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ

අධ්‍යාපනය යනු පුද්ගලයෙකුගේ සම්පූර්ණ ජීවිත කාලය පුරා සිදු වන, දැනුම, කුසලතා, ආකල්ප, සාරධර්ම සහ ශක්‍යතා ක්‍රමානුකූල ව වර්ධනය කරවන, සිතීමේ හැකියාව, නිර්මාණශීලීත්වය සහ විචාරාත්මක බුද්ධිය පෝෂණය කරමින්, සමාජයට සහ ලෝකයට ධනාත්මක දායකත්වයක් සැපයීමට සහ තම පූර්ණ විභවය සාක්ෂාත් කර ගැනීමට සවිබල ගන්වන පරිවර්තනීය ක්‍රියාවලියකි. 21 වන සියවසේ සන්දර්භයේ දී ඩිජිටල් සාක්ෂරතාව (තාක්ෂණික දැනුම හා තොරතුරු කළමනාකරණය), විචාරාත්මක චින්තනය (තොරතුරු විශ්ලේෂණය හා ගැටලු විසඳීමේ හැකියාව), චිත්තවේගීය බුද්ධිය (සමාජ කුසලතා හා සංවේදීතාව), අනුවර්තනය වීමේ හැකියාව (වෙනස්වන ලෝකයට ගැළපීමේ කුසලතා), යාවජීව ඉගෙනීම (ජීවිත කාලය පුරා ම නිරන්තර ස්වයං සංවර්ධනය) සහ ගෝලීය පුරවැසිභාවය (බහු සංස්කෘතික අවබෝධය හා පරිසර අවබෝධය) ආදිය අධ්‍යාපනය සමග බැඳී පවතියි.

ශ්‍රී ලාංකේය අධ්‍යාපන ක්‍රමය මුල් ළමා විය, ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය, උසස් අධ්‍යාපනය සහ වෘත්තීය අධ්‍යාපනය වශයෙන් අදියර කිහිපයකින් යුක්ත වේ. ප්‍රවේශය, ගුණාත්මකභාවය, දැරිය හැකි බව සහ අදාළත්වය ආදි විවිධ මාන ඔස්සේ විහිදෙන අධ්‍යාපන පද්ධතියේ ගැටලු සහ අභියෝග රටේ මානව ප්‍රාග්ධනය ගොඩනැගීමට බලපායි. මුල් ළමා විය අධ්‍යාපනයට ඇතුළත් වීමේ ප්‍රතිශතය අඩු වීම, ප්‍රාථමික අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමේ ප්‍රතිශතය ඉහළ නමුත් ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇතුළත් වීමේ පවතින විෂමතා, විශ්වවිද්‍යාල අධ්‍යාපනය සඳහා පවතින ඉල්ලුමට ප්‍රමාණවත් ධාරිතාවක් නොතිබීම සහ වෙළඳපොළ අවශ්‍යතා සපුරාලීමට ප්‍රමාණවත් කාර්මික හා වෘත්තීය අධ්‍යාපන අවස්ථා නොවීම තත්කාලීන අධ්‍යාපන ක්‍රමයේ ගැටලු හා අභියෝග අතර ප්‍රමුඛ වේ. මේවා විසඳීම සඳහා සියලු දෙනා අන්තර්කරණය වූ සහ ප්‍රතිචාරශීලී අධ්‍යාපන ක්‍රමයක් සහතික කිරීම සඳහා අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල අවශ්‍යතාව ඉස්මතු වී ඇත.

රජයේ අධ්‍යාපන ප්‍රතිපත්තියේ අරමුණ වනුයේ දියුණු මානවවාදී හා වගකීම් සහගත පුරවැසි සමාජයක් සඳහා ගුණාත්මක අධ්‍යාපනයක් ලබා දීමයි. එය සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන ක්ෂේත්‍රයට රාජ්‍ය ආයෝජන ඉහළ දමන අතර, දළ ජාතික නිෂ්පාදිතයෙන් අධ්‍යාපනය සඳහා දැනට වෙන් කරනු ලබන ප්‍රමාණය ක්‍රමයෙන් 6% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කෙරේ.

### අධ්‍යාපනයේ ඉදිරි ගමන් මඟ සඳහා පදනම් වන මූලධර්ම

වර්තමාන රජය විසින් ඉදිරිපත් කරන ප්‍රතිපත්තිමය වැඩපිළිවෙළ යටතේ දේශයේ සංවර්ධන ක්‍රියාදාමයේ දී අධ්‍යාපනයට සුවිශේෂ ස්ථානයක් හිමි වේ.

එහි දී නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය, මානව සංවර්ධනයට සහ සේවා නියුක්තියට අදාළතාව, සියල්ලන්ට ම පිළිගත හැකි බව, සමාජයට වග වන පුරවැසියන්, තිරසර බව හා නවෝත්පාදනය සහ යාවජීව අධ්‍යාපනය යන මූලධර්ම පදනම් කර ගැනේ. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ විවිධ අංශ යටතේ පහත සුවිශේෂ ඉලක්ක ඉදිරිපත් කර ඇත.

## 2026 වර්ෂය සහ ඉන් ඉදිරියට අධ්‍යාපනයේ දිශානතිය

'ශිෂ්ට සම්පන්න පුරවැසියෙක් - දියුණු මානව සම්පතක්' යන තේමාව යටතේ පොහොසත් රටක්- ලස්සන ජීවිතයක් ජාතික ප්‍රතිපත්ති රාමුවෙහි අධ්‍යාපන ක්‍රමයේ දිශානතිය පහත ආකාරයෙන් සංගෘහිත ය.

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| **පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය.** | වයස අවුරුදු 03 සිට 05 දක්වා වන සියලු දරුවන්ට උසස් තත්ත්වයෙන් යුතු ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රවේශය ඇති බවට සහතික කිරීම.<br><br>වයස අවුරුදු 05 ට වැඩි දරුවන්, පාසල් ජීවිතයට සාර්ථක ලෙස ඒකාබද්ධ වීම සහතික කිරීම.<br><br>බහු සංස්කෘතික විවිධත්වය සඳහා අනුවර්තනය වීමේ මූලාරම්භය සහතික කිරීම.<br><br>නිරෝගී අනාගත පරපුරක් සහතික කිරීම.<br><br>මුල් ළමාවිය අධ්‍යාපනය සංවර්ධනය නියාමනය කිරීම සඳහා පහසුකම් සැලසීම.<br><br>අධ්‍යාපනඥයින්ට සේවාවට අදාල වෘත්තිය සුදුසුකම් වැඩිදියුණු කරගැනීම සඳහා අවශ්‍ය පුහුණුව අනිවාර්යය කිරීම. | ▪ වයස අවුරුදු 03 සිට 05 දක්වා සියලු දරුවන් සඳහා විධිමත් මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපනයක් ලබා දීම.<br>▪ සෑම දරුවෙකුටම සිය නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර 2 ක් ඇතුළත මුල් ළමාවිය සංවර්ධන අධ්‍යාපන මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>▪ දරුවන්ගේ කායික හා මානසික තත්ත්වයන්ට ගැලපෙන පරිදි සහ සමාජ ජීවිතයට පිවිසීමට අවශ්‍ය වන යහපත් පුරුදු, ආකල්ප, සහ ආචාර ධර්ම වර්ධනය කරන ක්‍රියාකාරකම් ඇතුළත් වන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ මව් භාෂාවට අමතරව කථන සන්නිවේදන භාෂා ලෙස ඉංග්‍රීසි ඇතුළු අනෙකුත් ජාතික භාෂා ඇතුළත් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ බහු සංස්කෘතික විවිධත්වයට කටයුතු කිරීමට හුරුකරවන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ දරුවන්ගේ සෞඛ්‍ය සහ පෝෂණ තත්ත්වය වැඩිදියුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන නියාමනය කිරීම සඳහා මුල් ළමාවිය සංවර්ධන නියාමන ආයතනයක් පිහිටුවීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලක පාලිකාවන් සහ ගුරුවර ගුරුවරියන් සඳහා අවම අධ්‍යාපන සුදුසුකම් සහිත, අනිවාර්යය වෘත්තීය පුහුණුව සහ අවම වැටුපක් හඳුන්වා දීම.<br>▪ මුල් ළමාවිය සංවර්ධන වෘත්තිකයන් පුහුණු කිරීම සඳහා විධිමත් ජාතික ආයතනයක් සහ ශාඛා පද්ධතියක් (branch system) ස්ථාපිත කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
| --- | --- | --- |
| **ප්‍රාථමික සහ ද්විතීයික අධ්‍යාපනය** | අධ්‍යාපනය සඳහා යහපත් සහ සුවපහසු පරිසරයක් පවතින බවට සහතික කිරීම.<br><br>සමාන සහ සියළු දෙනා අන්තර්කරණය වූ අධ්‍යාපනයක් සහතික කිරීම.<br><br>අධ්‍යාපන අවස්ථා සඳහා ප්‍රවේශය සහතික කිරීම.<br><br>අධ්‍යාපනයේ ගුණාත්මක බව තහවුරු කිරීම.<br><br>සිසුන්ගේ දැනුම හා කුසලතා අඛණ්ඩව වර්ධනය කිරීම සහතික කිරීම<br><br>සිසුන්ගේ හැකියාවන් සහ කැමැත්ත මත පදනම්ව සාමාන්‍ය සහ තාක්ෂණ හෝ වෘත්තීය විෂය ධාරාවන් තෝරා ගැනීමට සිසුන් යොමු කරවීම සහතික කිරීම.<br><br>සංස්කෘතිය, සොබාදහම සහ මනුෂ්‍යත්වය පිළිබඳ සංවේදනය සහිත සිසුන් නිර්මාණය කිරීම.<br><br>ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීම සහතික කිරීම. | ▪ තම නිවසේ සිට හෝ දෙමාපියන්ගේ සේවා ස්ථානයේ සිට කිලෝමීටර් 3ක් ඇතුළත ප්‍රාථමික අධ්‍යාපනය සඳහා රජයේ පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ ළමා වියට බාධාවක් නොවන පරිදි බුද්ධිමය කුතුහලය සහ දැනුම වර්ධනය උත්තේජනය කරන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීම.<br>▪ අවම පහසුකම් පවත්වා ගැනීම සඳහා පාසල්වලට භෞතික හා මානව සම්පත් ලබා දීම.<br>▪ ජනගහනය සහ භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගනිමින් ප්‍රාථමික පාසල් 2ක් හෝ 3ක් ආවරණය වන පරිදි කණිෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් සහ ජ්‍යෙෂ්ඨ ද්විතීයික පාසල් පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ නවවන වසරේ පවත්වනු ලබන ජාතික මට්ටමේ විභාගයේ ප්‍රතිඵල සහ පාසල් පාදක අඛණ්ඩ ඇගැයීම් වාර්තා මත පදනම්ව ශිෂ්‍යයාගේ විභවයට සහ රුචිකත්වයට සරිලන පරිදි විද්‍යා, කලා, වාණිජ, සහ තාක්ෂණ වැනි සාමාන්‍ය විෂය ධාරා හෝ වෘත්තීය විෂය ධාරාව (vocational education stream) (සෘජුවම වෘත්තියකට අදාළවන) තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම.<br>▪ අවශ්‍යතාවන් සහ පිළිගත් ප්‍රමිතීන්ට අනුකූලව පාසල් ප්‍රවාහන පද්ධතියක් ස්ථාපිත කිරීම.<br>▪ සමාජ වටිනාකම් සහ පුරවැසි වගකීම් පිළිබඳ අවබෝධය ඇති කිරීම සඳහා අතිරේක විෂයයන් සහ ක්‍රියාකාරකම් හඳුන්වා දීම.<br>▪ සිසුන්ගේ හැකියාවන් සහ විශේෂ කුසලතා අනුව උසස් අධ්‍යාපනය හෝ වෘත්තීය අධ්‍යාපනය සඳහා ප්‍රධාන විෂයයන් තෝරා ගැනීමට ඉඩ ලබා දීම.<br>▪ සිසුන්ට ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යයන කාලය තුළ එක් විෂය ධාරාවකින් තවත් විෂය ධාරාවකට මාරුවිය හැකි නම්‍යශීලී විෂය මාලා හඳුන්වා දීම.<br>▪ සිය ආගම පිළිබඳව අධ්‍යාපනයට අමතරව ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආගම් පිළිබඳව අධ්‍යාපනික වැඩසටහන් සකස් කිරීම.<br>▪ ඒ ඒ වයස් කාණ්ඩයන්ට ගැළපෙන පරිදි ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳ අධ්‍යාපනය ලබා දීම.<br>▪ සංස්කෘතිය, පරිසර හිතකාමීත්වය සහ සොබාදහම සංරක්ෂණය පිළිබඳ ආකල්ප වැඩි දියුණු කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ නවෝත්පාදන, ජීවන කුසලතා සහ සමාජ දායකත්වය සඳහා අවශ්‍ය දැනුම සහ ප්‍රායෝගික කුසලතා සංවර්ධනය කරන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ අධ්‍යාපන විෂය ධාරාවන්ට විශේෂිත වූ විෂයයන් මෙන්ම නිපුණතා වර්ධනය වන තාක්ෂණික සාක්ෂරතාව, භාෂා, ජීවන කුසලතා, සාහිත්‍යය රසවින්දනය සහ මූලික නීතිය ආදී පොදු විෂයයන් තෝරා ගැනීමට අවස්ථාව සලසා දීම.<br>▪ ළමුන්ගේශාරීරික හා මානසික සමබරතාවයන් පවත්වාගෙන යාම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.<br>▪ පිරිවෙන් ඇතුළු රජයේ ආධාර ලබන පාසල් සඳහා ප්‍රමාණවත් මුදල් සහ අනෙකුත් පහසුකම් සපයා අධ්‍යාපනය ශක්තිමත් කිරීම. |
| ජාතික මට්ටමේ ඇගයීම් | විභාග චක්‍රයේ අඩංගු ක්‍රියාවලින්හි නිරවද්‍යතාව සහ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. | ▪ සියලුම තාක්ෂණික සහ අනෙකුත් භෞතික පහසුකම් සහිත ජාතික විභාග ඇගයීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම.<br>▪ ජාතික විභාග ඇගයීම් කටයුතු මාසයක් ඇතුළත අවසන් කිරීම සහ මාස දෙකක් ඇතුළත ප්‍රතිඵල ලබා දිය හැකිවන පරිදි වාර්ෂික පාසල් දින දර්ශනයක් ක්‍රියාත්මක කිරීම.<br>▪ විභාග ඇගයීම් ක්‍රියාවලියට දායකවන පරීක්ෂකවරුන්ගේ බුද්ධිමය දායකත්වයට සරිලන ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම.<br>▪ විෂයමාලා සංවර්ධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, අධ්‍යාපන පර්යේෂණ සහ ප්‍රතිපත්ති සම්පාදනය සඳහා ජාතික අධ්‍යාපන ආයතනයේ කටයුතු නියාමනය සහ පුළුල් කිරීම.<br>▪ ජාතික අධ්‍යාපන ආයතනය තුළ විෂයමාලා සංවර්ධනය කිරීම සඳහා පූර්ණ පහසුකම් සහිත විෂයමාලා සංවර්ධන ඒකකයක් පිහිටුවීම. |
| මානව සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ පවත්වාගෙන යාම | සාමාන්‍ය අධ්‍යාපන ක්‍රමය තුළ ශ්‍රම බලකාය සඳහා හිතකර සේවා පරිසරයක් සහතික කිරීම. | ▪ ගුරු හා විදුහල්පති වැටුප් විෂමතා ඉවත් කිරීම.<br>▪ ගුරු සේවා ව්‍යවස්ථාවක් සහ ගුරු සභාවක් ස්ථාපිත කිරීම.<br>▪ ගුරු වෘත්තිය ඉහළම වැටුප් ලබන වෘත්තීන් 10 අතරට ස්ථානගත කිරීම.<br>▪ ගුරු වෘත්තියට පිවිසීමට පෙර ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය පිළිබඳ වසරක වෘත්තීය පුහුණුවක් ලබා දීම.<br>▪ සියලු අධ්‍යාපන විද්‍යාපීඨ සහ ගුරු අභ්‍යාස විද්‍යාල ඒකාබද්ධ කර ජාතික අධ්‍යාපන විශ්වවිද්‍යාලයක් පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ▪ ගුරුවරුන් සඳහා සෑම වසර තුනකට වරක් පුහුණු වැඩසටහන් පැවැත්වීම.<br>▪ විෂයමාලා සංවර්ධනය, පෙළපොත් සම්පාදනය සහ ඇගයීම් ක්‍රියාවලිය එකිනෙක සම්බන්ධ කොට පවත්වාගෙන යාමට අවශ්‍ය වන ආයතන අතර සම්බන්ධීකරණ ව්‍යුහයක් නිර්මාණය කිරීම.<br>▪ පාසල් පද්ධතිය තුළ සියලු ප්‍රජාවන් මුහුණ දෙන ලිංගික හෝ වෙනත් හිංසනයන් පිටුදැකීම සඳහා ශක්තිමත් ව්‍යුහයක් ඇති කිරීම. |
| වෘත්තීය අධ්‍යාපනය | නිශ්චිත රැකියා ක්ෂේත්‍ර වෙත සිසුන් යොමු කරන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක් සහතික කිරීම. | ▪ පෘථුල වෘත්තීය ක්ෂේත්‍රයන්හි ව්‍යවහාරික දැනුම ලබා ගනිමින් කිසියම් නිශ්චිත රැකියා ක්ෂේත්‍රයකට ශිෂ්‍ය ශිෂ්‍යාවන් යොමු වන වෘත්තීය අධ්‍යාපන ක්‍රියාවලියක් හඳුන්වා දීම.<br>▪ සාමාන්‍ය අධ්‍යාපන ධාරාවට සමාන්තරව 10 වසරේ සිට 13 වසර දක්වා ඉදිකිරීම් සහ යටිතල පහසුකම්, නිර්මාණාත්මක කර්මාන්ත, ප්‍රාථමික කර්මාන්ත, සේවා කර්මාන්ත, සමාජ හා ප්‍රජා සේවා, නිෂ්පාදන සහ තාක්ෂණය වැනි ක්ෂේත්‍රයන්හි නියැළීමට සිසුන් සූදානම් කිරීම සඳහා වෘත්තීය විෂය ධාරාවක් හඳුන්වා දීම.<br>▪ රැකියා වෙළෙඳපොළ ඉල්ලුම සහ ගෝලීය ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ සිදුවිය යුතු ගුණාත්මක හා ප්‍රමාණාත්මක වෙනස්කම් පිළිබඳව නිර්දේශ කිරීම සඳහා කර්මාන්ත හා අධ්‍යාපනික ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් සමන්විත වෘත්තීය අධ්‍යාපන නියාමන දෙපාර්තමේන්තුවක් පිහිටුවීම. |
| උසස් අධ්‍යාපනය | රාජ්‍ය හා රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල පද්ධතිය තුළ තත්ත්ව සහතික (Quality Assurance) ඇති කිරීම.<br><br>රැකියා ඉලක්ක කරගත් උසස් තාක්ෂණික අධ්‍යාපනය සහ පුහුණු වැඩසටහන් සඳහා ප්‍රවේශය ශක්තිමත් කිරීම සහ පුළුල් කිරීම. | ▪ විශ්වවිද්‍යාලවල ස්වාධීනත්වයට ගරු කරමින්, එම විශ්වවිද්‍යාලවල අධ්‍යයන පාඨමාලා ජාතික ප්‍රතිපත්තිවලට අනුකූලව සකස් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මඟපෙන්වීම.<br>▪ සමාජීය විවිධත්වය නියෝජනය සහතික කරමින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම් සභාවේ සභාපතිවරයා සහ අනෙකුත් සාමාජිකයන් පත්කිරීම.<br>▪ විශ්වවිද්‍යාල ගෞරවය ඉහළ නැංවෙන පරිදි උපකුලපතිවරුන් පත් කිරීම.<br>▪ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් විශ්වවිද්‍යාල සඳහා බාහිර පාලක සභා සාමාජිකයන් ලෙස ස්වාධීන පුද්ගලයන් පත් කිරීම.<br>▪ විශ්වවිද්‍යාලවල සෑම පාලක සභාවකම විවිධ වෘත්තීය ක්ෂේත්‍ර සහ ස්ත්‍රී පුරුෂ නියෝජනය සහතික වන පරිදි සාමාජිකයන් පත් කිරීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | විශ්ව විද්‍යාල අධ්‍යාපන ක්‍රමය තුළ රැකියා නියුක්තිය සහ ව්‍යවසායකත්ව කුසලතා වර්ධනය සහතික කිරීම.<br><br>විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පර්යේෂණ සහ නවෝත්පාදන සංස්කෘතිය සහතික කිරීම.<br><br>උසස් අධ්‍යාපන පද්ධතියේ පාලන ආයතනවල තීරණාත්මක සහ ගෞරවනීය නිදහස සහතික කිරීම. | ▪ පාලක සභාවේ සාමාජිකයින් පත් කිරීම සඳහා පිළිගත් වෘත්තීය ආයතනවලින් ලබා ගන්නා පොදු නිර්දේශිත නම් ඇතුළත් සංචිතයක් පිහිටුවීම.<br>▪ කිසියම් විශ්වවිද්‍යාලයකින් විශ්‍රාමලත් තැනැත්තෙකු එම විශ්වවිද්‍යාලයේ පාලක සභාවට පත් කිරීමේ දී අවම වශයෙන් වසර පහකට පෙර විශ්‍රාම ගිය අය පමණක් පත් කිරීම.<br>▪ සුභසාධනය සහ අනෙකුත් ශිෂ්‍ය කටයුතු සඳහා පවතින සීමිත අවකාශය තුළ කටයුතු කිරීම සඳහා ශිෂ්‍ය නියෝජිතයෙක් අදාල විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ ඡන්දයෙන් පාලක සභාවට පත් කිරීම.<br>▪ පාලක සභා සාමාජිකයකුගේ ධූර කාලය උපරිම වශයෙන් අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම.<br>▪ අධ්‍යයන අංශයක අංශාධිපති හෝ වසර තුනක ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධූරයේ සුදුසුකම් ඇති සියලු පීඨ සාමාජිකයින්ට පීඨාධිපති ධූරය සඳහා පත්වීමට අවස්ථාව පැවතීම.<br>▪ පීඨාධිපතිවරයෙකුගේ කාලය උපරිම අඛණ්ඩ වාර දෙකකට සීමා කිරීම.<br>▪ විෂයභාර අමාත්‍යවරයාගේ නිර්දේශ මත අනධ්‍යයන කාර්ය මණ්ඩල බඳවා ගැනීම් අහෝසි කිරීම.<br>▪ සෑම විශ්වවිද්‍යාලයකම අධ්‍යයන, අනධ්‍යයන සහ ශිෂ්‍ය ප්‍රජාවගේ දුක්ගැනවිලි සොයා බලා ඒවාට පිළියම් යෙදීමට සහ සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පීඨ මට්ටමින් සහ විශ්වවිද්‍යාල මට්ටමින් යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීම.<br>▪ විශ්වවිද්‍යාලවලට සිසුන් බඳවා ගැනීමේ ප්‍රමාදයන් ඉවත් කිරීම.<br>▪ එක් එක් පාඨමාලාව සඳහා අවම සුදුසුකම් හඳුනාගෙන, එම සුදුසුකම් සපුරාලන සියලු දෙනාටම අවස්ථාව ලැබෙන පරිදි තෘතීයික අධ්‍යාපන පද්ධතිය ක්‍රමිකව පුළුල් කිරීම.<br>▪ තෘතීයික අධ්‍යාපන ආයතනවල, දේශන ශාලා, පර්යේෂණාගාර, පුස්තකාල සහ ආපනශාලා වල අන්තර්ජාල පහසුකම් නිසි ප්‍රමිතීන්ට අනුකූලව සකස් කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන සැපයීම.<br>▪ ජාත්‍යන්තර විශ්ව විද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යාපනය ලබා ගැනීම සඳහා අවශ්‍ය ඉංග්‍රීසි භාෂා ඇතුළු අනෙකුත් මූලික සුදුසුකම් ලබා ගැනීම සඳහා සෑම තෘතීයික අධ්‍යාපන |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| | | ආයතනයකම විශේෂ ඒකක පිහිටුවීම සහ එම ඒකක හරහා සිසුන්ට ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අවස්ථා ලබා ගැනීමට අවශ්‍ය සබඳතා පුළුල් කිරීම.<br>■ උසස් පෙළ සමත් සිසුන්ට ජාත්‍යන්තර ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල උපාධි හැදෑරීම සඳහා වසරකට ශිෂ්‍යත්ව 200ක් පිරිනැමීම.<br>■ තෘතීයික අධ්‍යාපන ආයතනවල සිදුවන නවක වදය, ලිංගිකත්වය හෝ වෙනත් ආකාරයේ හිංසනයන් වැළැක්වීම සඳහා ඒකාබද්ධ යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම.<br>■ ආබාධ සහිත සිසුන් සඳහා පිළිගත් ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව අධ්‍යාපනය ලැබීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.<br>■ ජීවන වියදමට සාපේක්ෂව මහපොළ සහ ශිෂ්‍යාධාර දීමනාව වැඩි කිරීම.<br>■ පශ්චාත් උපාධි පර්යේෂණ සහ සංවර්ධනය සඳහා විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම.<br>■ පශ්චාත් උපාධි අධ්‍යාපනය සහ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය හා භෞතික සම්පත් සැපයීම.<br>■ කර්මාන්ත හා සේවා ක්ෂේත්‍රවලට අදාළ පර්යේෂණ ශක්තිමත් කිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය දිරිමත් කිරීම.<br>■ ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනයෙන් පසු තෘතීයික අධ්‍යාපන ප්‍රවේශ විභාගය සමත් වන අය සඳහා වෘත්තීය අධ්‍යාපන විශ්වවිද්‍යාල පද්ධතියෙහි ධාරිතාවය වර්ධනය කිරීම.<br>■ හෙද විදුහල් ඒකාබද්ධ කොට ජාතික හෙද විශ්වවිද්‍යාලයක් ස්ථාපිත කිරීම |
| පෞද්ගලික අධ්‍යාපනය | ගුණාත්මකභාවය සහ දැරිය හැකි මිල සහතික කිරීම සඳහා පෞද්ගලික අධ්‍යාපනය විධිමත් කිරීම. | ■ පවතින පෞද්ගලික අධ්‍යාපන ආයතනවල පාඨමාලා නියාමනය කිරීම සඳහා අධ්‍යාපන ආයතන නියාමන ඒකකයක් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ පිහිටුවීම. |

| අවධානිත ක්ෂේත්‍රය /තේමා ක්ෂේත්‍රය | උපායමාර්ගික දිශානතිය | ප්‍රධාන ක්‍රියාකාරකම් |
|---|---|---|
| වැඩිහිටි අධ්‍යාපනය | වැඩිහිටි ජනගහනයේ අවශ්‍යතා සපුරාලීම සඳහා ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලබා ගැනීමේ අවස්ථා ඇති බවට සහතික කිරීම | ▪ ප්‍රාදේශීය අධ්‍යාපනික ආයතන, පුස්තකාල සහ සංස්කෘතික මධ්‍යස්ථාන සමඟ ඒකාබද්ධව අවිධිමත් අධ්‍යාපනය ලබාදීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයක් තුළම ප්‍රජා අධ්‍යාපනික මධ්‍යස්ථාන පිහිටුවීම.<br>▪ පුරවැසියන් සඳහා මූලික නීතිය පිළිබඳ අධ්‍යාපනික වැඩසටහන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂාත්‍රයෙන්ම ක්‍රියාත්මක කිරීම සහ තොරතුරු තාක්ෂණය හා තාක්ෂණික මෙවලම් භාවිතය පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම. |
| විවෘත හා දුරස්ථ අධ්‍යාපනය | විවෘත හා දුරස්ථ අධ්‍යාපනය පුළුල් කිරීම. | ▪ ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ පහසුකම් පුළුල් කිරීම. |

ආචාරධර්මීය ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමට වඩාත් පිරිසිදු භෞතික පරිසරයක් සහ රට පුරා සදාචාරාත්මක කැපවීමක් සඳහා ආමන්ත්‍රණය කිරීම අරමුණු කර ගෙන ආරම්භ කර ඇති Clean Sri Lanka ව්‍යාපෘතිය සමාජීය, පාරිසරික, ආචාරධර්මීය යන කුලුණු තුන මත ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය. පුරවැසියන් අතර වගකීම්, තිරසරභාවය සහ පාරිසරික විඥානය පිළිබඳ ආකල්ප පෝෂණය කරන පිරිසිදු මනසක් සංවර්ධනය කරනු ලබන අධ්‍යාපනික වැඩසටහන්වල නියැලීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. මෙය පුද්ගල මනසින්, පාසල්, විශ්වවිද්‍යාල සහ අනෙකුත් අධ්‍යාපන ආයතන, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ආයතන, පොදු ස්ථානවලින් ආරම්භ වනු ඇති අතර සමස්තයක් වශයෙන්, 'සිනහවෙන් පිරුණු මිනිසුන් වෙසෙන ලස්සන රටක්' ඉලක්ක කර ගනිමින් පිරිසිදු ශ්‍රී ලංකාවක් බවට පත් වීමේ සමස්ත රටේ ම දැක්ම ආවරණය කරයි. බලකිරීමකින් තොර ව, 'පුරුද්දක්' බවට පත් වන පුද්ගල මනෝභාවයක් ඇති කරවන තිරසර පරිචයන් අගයන්නා වූ ක්‍රමවේද නිර්මාණය කිරීම මීට ඇතුළත් වේ. මෙම ව්‍යාපෘතිය දූෂණ විරෝධී ක්‍රියා වෙනුවෙන් පෙනී සිටීම, රාජ්‍ය සම්පත් අවභාවිතය අවම කිරීම සහ සමාජීය හා පාරිසරික මූලාරම්භයන් සඳහා වෙන් කරන ලද අරමුදල් එම අපේක්ෂිත ඉලක්ක වෙත ළඟා වන බව සහතික කරනු ඇත. මේ ක්‍රියාවලියට අනුගත ව අධ්‍යාපන අමාත්‍යාංශයේ 2026 සහ ඉන් ඉදිරියට වැඩසටහන් ක්‍රියාත්මක කෙරෙනු ඇත.

## 2026 වර්ෂය සඳහා වූ ප්‍රධාන / සුවිශේෂී ඉලක්ක

සංවර්ධිත, මානවවාදී සහ වගකිවයුතු සමාජයක් බිහිකරන ගුණාත්මක අධ්‍යාපනයක් සහ සම්පත් කළමනාකරණයක් සහතික කිරීම සඳහා,

- සැමට නිදහස් අධ්‍යාපනය සහ සම ප්‍රවේශය.
- මානව සංවර්ධනය හා සේවා නියුක්තියට අදාළතාවය.
- සියල්ලන්ටම පිළිගත හැකි බව.
- සමාජයට වගවන පුරවැසියන්.
- තිරසර බව හා නවෝත්පාදනය.
- යාවජීව අධ්‍යාපනය.

යන ප්‍රතිපත්ති මූලධර්මයන් තහවුරු කරමින් නව අධ්‍යාපන ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම. ඒ අනුව සාමාන්‍ය අධ්‍යාපනය සඳහා වූ පහත වැඩසටහන් ඉදිරි වසර තුළ දී ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇත.

- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 01 ශ්‍රේණිය සහ 06 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කිරීම.
- අධ්‍යාපන ප්‍රතිසංස්කරණයට අදාළව 02 ශ්‍රේණිය සහ 07 ශ්‍රේණිය විෂයමාලා ප්‍රතිසංස්කරණයට අවශ්‍ය කටයුතු සූදානම් කිරීම.
- 2026 වර්ෂයේ සිට 01 සහ 06 ශ්‍රේණිය සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළව දෙවන හා තෙවන වාර සඳහා මොඩියුල මුද්‍රණය කිරීම සහ ගුරු පුහුණුව ලබා දීමට  අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- ප්‍රාථමික අධ්‍යාපනය තුළ පහත සුවිශේෂ කරුණු 2026 වර්ෂයේ දී ළඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- ♣ ප්‍රාථමික අධ්‍යාපනය ලබාදීම සඳහා පාසලට ආසන්න 3Km තුළ ළඟා වියහැකි පාසලක ඉඩ ප්‍රස්ථා පුළුල් කිරීම.
- ♣ අන්තර්කරණ අධ්‍යාපන පරිසරයක් ඇති කිරීම හා විෂය සමගාමී ක්‍රියාකාරකම් ප්‍රාථමික අධ්‍යාපනය තුළ පුළුල් කිරීම.
- ♣ ප්‍රාථමික පාසල්හි යටිතල පහසුකම් සංවර්ධනය.
- ♣ ඩිජිටල් නවෝත්පාදනය හරහා සිසුන්ගේ වාචික කුසලතාව ශක්තිමත් කිරීම හා ගණිතමය නිපුණතා ඉලක්ක කරගත් ප්‍රතිකාර්යය වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ♣ ප්‍රාථමික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කරගැනීමේ නියාමන රාමුව ශක්තිමත් කිරීම.

ඵලදායී පාසල් ජාලයක් නිර්මාණය කිරීම උදෙසා පාසල් ප්‍රතිසංවිධාන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට සැලසුම් කිරීම.

- ♣ පාසල් සිතියම්කරණය තුළින් පාසල් ප්‍රතිසංවිධානය කිරීම හා පාසල්වල ගුණාත්මකභාවය සහතික කිරීමේ අරමුණින් අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් ඵලදායී පාසල් ජාලයක් ගොඩනැගීම.
- ♣ ඵලදායී පාසල් ජාලයක් ගොඩනැගීම සඳහා තෝරාගත් ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීම.
- ♣ වැඩිදියුණු කළ යුතු ද්විතීයික පාසල් හඳුනා ගැනීම හා අවශ්‍යතා හඳුනා ගැනීම.

- පූර්ව ළමාවිය සංවර්ධන අධ්‍යාපනය අංශ ගණනාවකින් වැඩිදියුණු කිරීමට පියවරයන් ගනිමින් පවතී.
- සාක්ෂරතාව / සංඛ්‍යාත්මක දැනුම / නිර්මාණශීලිත්වය සහ සන්නිවේදන කුසලතා වර්ධනය කිරීමේ අරමුණින් ගුණාත්මක ප්‍රාථමික අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කිරීම සහ ඒ සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.
- කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය බුද්ධිමය තත්ත්වයන් හා කුසලතා වර්ධනය වන ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනයක් තුළින් දරුවන්ගේ කායික හා මානසික තත්වයන්ට උචිත වන පරිදි හා සමාජ ජීවිතයට අවශ්‍ය වන යහපත් පුරුදු , ආකල්ප හා ආචාරධර්ම වර්ධනය කරන ක්‍රියාකරකම් ඇතුළත් වැඩසටහන් තුළින් ලබා දීමට කටයුතු කිරීම හා ගුණාත්මක වෘත්තීය අධ්‍යාපනයක් ලබා දීමට කටයුතු කිරීම.
- ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය, නවෝත්පාදනය / ජීවන නිපුණතා හා සමාජානුයෝජනයට අවශ්‍ය දැනුම හා ප්‍රායෝගික කුසලතා සංවර්ධනය වූ සමබර දරුවෙකු නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය සුනම්‍ය විෂයමාලාවක් යටතේ ක්‍රියත්මක කිරීමට කටයුතු කිරීම.
- නිදහස් අධ්‍යාපන අයිතීන් තවදුරටත් සුරක්ෂිත කිරීම.
- නිදහස් අධ්‍යාපන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී වාර්ෂික ප්‍රතිපාදන යටතේ පහත අවශ්‍යතාවයන් කෙරෙහි ප්‍රමුඛතාවයක් ලබා දීමට අපේක්ෂා කිරීම.
- (නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම / නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, සනීපාරක්ෂක තුවා, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී )
- පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාවය අවම කිරීම හා පාසල් පද්ධතිය කෙරෙහි විශ්වාසය තහවුරු කිරීම.
- විදුහල්පතිවරුන් සහ ගුරුවරුන් සඳහා විධිමත් ධාරිතා පුහුණු වීම් ලබා දීම / පාසල් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ලබා දීම සහ උසස් අධ්‍යාපනය සඳහා අදාළ පහසුකම් ලබා දීම.
- ගුරු පුහුණු / ප්‍රායෝගික කුසලතා සංවර්ධන / දැනුම යාවත්කාලීන කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- විභාග කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය වෙනුවට ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමයක් සකස් කිරීම.
- ආර්ථිකයේ ප්‍රධාන කුලුණු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවයන් සහ අධ්‍යාපනය අතර පවත්නා නොගැළපීම අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- පවිත්‍ර හා හරිත පරිසරයක් තුළ වඩා තිරසර අනාගතයක් නිර්මාණය කිරීම සඳහා පැහැදිලි දැක්මක් සහිතව ක්‍රියාකිරීමටත් කායික හා මානසික වශයෙන් නිරෝගී පුරවැසියකු ලෙස සවිබල ගැන්වීමටත්, සදාචාරාත්මක වගකීම් සඳහා උරදිය හැකි ප්‍රජාවක් නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය අඩිතාලම දැමීම ප්‍රමුඛ අරමුණු කරගනිමින් Clean Sri Lanka ජාතික වැඩසටහන අධ්‍යාපන පද්ධතිය තුළ නව මානයකින් ක්‍රියාත්මක කිරීම.
- තිරසර අනාගතයක් ගොඩනැගීම සඳහා දේශගුණික ක්‍රියාකාරකම්වලට මුහුණ දීම, පාරිසරික සංරක්ෂණය සඳහා අනාගත පරපුර සවිබල ගැන්වීම යටතේ විවිධ වැඩසටහන් හා ව්‍යාපෘතීන් සිදු කිරීමට සැලසුම් කිරීම.
- පෞද්ගලික අධ්‍යාපනය නියාමන ක්‍රමවේදය ශක්තිමත් කිරීම තුළින් එහි ගුණාත්මක භාවය ඉහළ නැංවීම.
- ජාතික මට්ටමේ ඇගයීම් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමඟ අනුගත කිරීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයට අදාළ මානව සම්පත් ප්‍රවර්ධනය හා ආයතන අතර සම්බන්ධීකරණය ශක්තිමත් කිරීම හා වෘත්තීය පහසුකම් සැලසීමට කටයුතු කිරීම
- වෘත්තීය අධ්‍යාපනය, රැකියා වෙළඳපොළ හා ලෝක ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් නිෂ්පාදන හා තාක්ෂණය යන ක්ෂේත්‍ර ඔස්සේ පුළුල් කිරීම.
- උසස් අධ්‍යාපනය ජාත්‍යන්තර මට්ටමේ උසස් වෘත්තීය අධ්‍යාපනයක් ලබාදෙන පරිදි දියත් කිරීමට කටයුතු කිරීම.
- පාසල් දරුවන්ගේ සෞඛ්‍ය හා පෝෂණය ප්‍රවර්ධනය කිරීමට කටයුතු කිරීම.
  - ♣ රජයේ සියලුම ප්‍රාථමික පාසල් සඳහා “ පාසල් ආහාර වැඩසටහන ” ක්‍රියාත්මක කිරීම.
  - ♣ සිසු රක්ෂාණාවරණ ක්‍රියාත්මක කිරීම, ප්‍රජනක සෞඛ්‍ය හා ලිංගික අධ්‍යාපනය පිළිබඳව දැනුවත් කිරීම සහ රජයේ පාසල් සඳහා සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- තාක්ෂණික අධ්‍යාපනයේ ප්‍රායෝගික ක්‍රියාකාරකම් විධිමත් පරිදි පැවැත්වීමට කටයුතු කිරීම.
  - ♣ නව නිපැයුම් ඇගයීමේ වැඩසටහන් පැවැත්වීම.
  - ♣ NVQ සුදුසුකම් ලබාදීමට කටයුතු කිරීම හා තෘතීයික අධ්‍යාපනයට පෙළ ගැසීම.

## ඉලක්කවලට යාමේදී පවත්නා අභියෝග

- පසුගිය වර්ෂවල දේශය මුහුණ දුන් අභියෝග හේතුවෙන් නියමිත කාලයට විභාග පැවැත්වීමට නොහැකි වීම නිසා පාසල් වාර සටහනේ සිදු වූ අක්‍රමවත් බව තුරන් කර නියමිත පරිදි පාසල් පැවැත්වීම සහ විභාග පැවැත්විමේ කටයුතු ක්‍රමයෙන් යථා තත්වයට පත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම.
- අධ්‍යාපන පද්ධතියේ පවතින පුරප්පාඩු පිරවීම පිණිස අදාළ බඳවා ගැනීම් කිරීමට කටයුතු සිදු කිරීම.
- ආර්ථික හා සමාජීය ජීවන තත්වය ඉහළ නැංවීම සඳහා සාමාන්‍ය අධ්‍යාපනය ලබන සිසුන් සඳහා නොමිලේ අධ්‍යාපන අවස්ථා සැලසීම / නොමිලේ පෙළ පොත්, ලිපි ද්‍රව්‍ය , පාසල් පාවහන් , නිල ඇඳුම්, දිවා ආහාර සහ රක්ෂණ පහසුකම් ආදී ප්‍රතිලාභ ලබා දීම තුළින් පාසල් අධ්‍යාපනයේ පවතින අභියෝග අවම කිරීමට කටයුතු කිරීම.
- වසර 13 ක අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග පාසලින් ඉවත්වීමේ ප්‍රතිශතය ඉහළ යාම.
- පාසල් පද්ධතිය තුළ මානව හා භෞතික සම්පත් බෙදීයාමේ විෂමතාවය නිසා පාසල් පද්ධතිය කෙරෙහි ඇති දෙමාපිය විශ්වාසය බිඳවැටීම.
- පළමු වසර සිට ප්‍රථම උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන්ට සිය ආදායමින් ඉහළ වැයබරක් දරන්නට සිදු වීම.
- ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්‍රියාවලිය විසින් ගුණාත්මක පුරවැසියකු බිහිකිරීමට අසමත් වී ඇති බවට පවතින සමාජ විවේචනය.
- ආර්ථිකයේ ප්‍රධාන කුලුනු වන කෘෂිකර්මය, කර්මාන්ත හා සේවා අංශයන්හි රැකියා වෙළඳපොළ අවශ්‍යතාවයන් සහ අධ්‍යාපනය අතර පවත්නා නොගැළපීම.

## 03. 2025 වර්ෂයේ ප්‍රගතිය

### සමාජයට වග වන පුරවැසියන් නිර්මාණයෙහි ලා සැමට නිදහස් අධ්‍යාපනය හා සම ප්‍රවේශය

ජාතික අධ්‍යාපන ක්‍රියාවලියේ උද්ගත වී ඇති ගැටලු අතර, අවම වශයෙන් වසර 13ක පාසල් අධ්‍යාපනය සම්පූර්ණ නොකර අතරමග පාසලින් ඇද හැලීම මෙන් ම පළමු ශ්‍රේණියේ සිට ප්‍රථම උපාධිය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබා දෙන ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වුව ද දරුවන්ගේ අධ්‍යාපනය සඳහා දෙමාපියන්ට ඉහළ වැය බරක් දරන්නට සිදු වීම ද දැකිය හැකි ය. කෙසේ වුව ද, ආර්ථික ගැටලු හේතුවෙන් අධ්‍යාපන ක්‍රියාවලියෙන් ඇද හැලීම වළක්වා නිදහස් අධ්‍යාපනයේ ප්‍රතිලාභ මැනවින් අත්පත් කර ගැනීම උදෙසා දරුවන්ට පහසුකම් සපයනු වස් විවිධ සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

| වැඩසටහන | ආයෝජනය<br>(රුපියල් මිලියන) | ප්‍රතිලාභීන් ගණන |
|---|---|---|
| පාසල් පෙළපොත් | වෙන් කරන ලද මුදල - 15,500,000,000<br>වියදම - 1,787,010,851.88<br>ඉතිරිය - 13,712,989,148.12 | 1 – 13 ශ්‍රේණිවල සියලු ම පාසල් සිසුන් සඳහා |

| වැඩසටහන/ව්‍යාපෘතිය | මූල්‍ය ඉලක්කය/ වෙන් වී ඇති ප්‍රතිපාදන **2025.09.30** දිනට (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | භෞතික ඉලක්කය (ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව/ ඒකක ප්‍රමාණය) | ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව/ ඒකක ප්‍රමාණය |
|---|---|---|---|---|
| **පාසල් ළමුන් සඳහා ආහාර ලබා දීමේ වැඩසටහන** | 81.58 | 35.00 | සිසුන් මිලියන 1.5 | සිසුන් මිලියන 1.5 |
| **සුරක්ෂා සිසු රක්ෂණ වැඩසටහන** | 1,945.71 | 1,375.73 | සිසුන් මිලියන 4.00 | සිසුන් 35,530 |
| **ප්‍රජනන සෞඛ්‍ය වැඩසටහන (UNFPA)** | 2.40 | – | සිසුන් මිලියන 4.00 | – |
| **සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩසටහන (GEMP)** | 6.47 | 1.75 | සිසුන් මිලියන 4.00 | සිසුන් මිලියන 4.00 |
| **පාසල් සිසුවියන් සඳහා සනීපාරක්ෂක තුවා ලබා දීමේ වැඩසටහන** | 1,440.00 | 406.13 | සිසුවියන් මිලියන 1.05 | සිසුවියන් මිලියන 1.05 |

**ශිෂ්‍යාධාර ප්‍රදාන**

| වැඩසටහන | **ප්‍රතිලාභී ශිෂ්‍ය සංඛ්‍යාව** | **ප්‍රතිලාභය (රු.මිලියන)** |
|---|---|---|
| නව නිපැයුම්, සෞන්දර්ය, ක්‍රීඩා යන ක්ෂේත්‍රවල දක්ෂතා දැක්වූ නිපුණයන්ට දෙන සුහග ශිෂ්‍යත්ව | 1000 | 50 |
| අඩු ආදායම්ලාභී පවුල්වල 5 ශ්‍රේණිය ශිෂ්‍යත්වලාභීන් සඳහා ශිෂ්‍යාධාර | උපරිම සිසුන් 160,000 දක්වා | 1593.75 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුන් සඳහා ශිෂ්‍යාධාර | 750 | 10.5 |
| අ.පො.ස. (උසස් පෙළ) තාක්ෂණවේදය හදාරන සිසුවියන්ට සුජාත දියණි ශිෂ්‍යත්ව | 250 | 3.7 |
| අ.පො.ස. (උසස් පෙළ) අඩු ආදායම්ලාභී පවුල්වල සිසුන්ට මහත්මා ගාන්ධි ශිෂ්‍යත්ව | 150 | මූල්‍ය දායකත්වය බාහිර ආයතනයකි |
| අ.පො.ස. (උසස් පෙළ) ගණිත විෂයධාරාවේ සිසුන්ට ඩයලොග් ශිෂ්‍යත්ව | 30 | |

## අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අංශය

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම සඳහා අධ්‍යාපන පද්ධතියේ දැවැන්ත පරිවර්තනීය වෙනසක් සිදු කරමින්, යෝජනා ඉදිරිපත් කරමින් අදාළ අංශ සමඟ ඒකාබද්ධව අවසන් තීරණවලට එළඹීම හා අදාළ පරිපාලන යාන්ත්‍රණයේ ප්‍රධානත්වය දැරීම මෙම අංශයේ කාර්යභාරයයි.

අංශය යටතේ පවතින ශාඛා - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ශාඛාව (අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගේ විෂය පථ යටතේ ක්‍රියාත්මකයි.)

නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ 2026 සිට පාසල් පද්ධතියට...

විසි එක්වන ශතවර්ෂයෙන් හා ඉන් ඔබ්බට ඇතිවන අභියෝගයන්ට මුහුණ දිය හැකි මෙන් ම, තිරසර ජාතික සංවර්ධනයට සහ රටෙහි සාමය උදෙසා දායක විය හැකි පුරවැසියෙකු බිහි කිරීමේ පදනම සකස් කිරීමේ ඉලක්කය පාදක කර ගත් නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් පහත අරමුණු සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂිත ය .

- විෂයමාලාවේ අදාළත්වය සහ ගුණාත්මකභාවය ඉහළ නැංවීම
- දරුවන්ගේ ඉගෙනුම් ඵල ඉහළ නැංවීම
- විද්‍යාව සහ තාක්ෂණ විෂයධාරාවට දරුවන් ඇතුළත්වීම ඉහළ නැංවීම
- තිරසර සංවර්ධන ඉලක්කයන් සහ පුරවැසි අධ්‍යාපනය ප්‍රවර්ධනය
- 21 වන ශතවර්ෂයට අවශ්‍ය කුසලතා දරුවන් තුළ ඇති කිරීම
- සමාජ සාධාරණත්වය සහ අන්තර්කරණය තහවුරු කිරීම
- පාසල් ප්‍රජා සම්බන්ධතා ශක්තිමත් කිරීම
- ජාතික අධ්‍යාපන ඉලක්ක හා අනුගත වීම
- දරුවන් තුළ ව්‍යවසායකත්ව මානසිකත්වය ප්‍රවර්ධනය

මේ ප්‍රතිසංස්කරණවලට අදාළ ව එක් එක් අධ්‍යාපන අදියරවල දී සිදු කිරීමට අපේක්ෂිත ප්‍රධාන වෙනස්කම් පහත දැක්වේ.

| අධ්‍යාපනයේ අදියර | මූලපිරීම්/ප්‍රධාන වෙනස්කම් |
|---|---|
| **ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අදියර 2 (12-13 ශ්‍රේණි)** | හඳුන්වාදීම...<br>- මොඩියුල සහ සම්භාර පාදක විෂයමාලාව<br>- ශාස්ත්‍රීය විෂයධාරාවන් 4ක් සහ වෘත්තීය විෂයධාරාවක් |
| **ජ්‍යෙෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය අදියර 1 (10-11 ශ්‍රේණි)** | හඳුන්වාදීම...<br>- මොඩියුල සහ සම්භාර පාදක විෂයමාලාව<br>- වෘත්තීය සහ වැඩිදුර ඉගෙනුම් විෂයයන් සඳහා ශාස්ත්‍රීය සහ කුසලතා මාර්ග දෙකට හඳුන්වා දීම<br>- විෂයයන් 7ක් සඳහා ජාතික මට්ටමේ ඇගයීම |
| **කනිෂ්ඨ ද්විතීයික අධ්‍යාපනය (6-9 ශ්‍රේණි)** | හඳුන්වාදීම...<br>- මොඩියුල සහ සම්භාර පාදක විෂයමාලාව<br>- අනිවාර්ය ඉගෙනුම් සහ වැඩිදුර ඉගෙනුම් හඳුන්වා දීම<br>- 9 ශ්‍රේණියේ කුසලතා තක්සේරුව හඳුන්වාදීම. |
| **ප්‍රාථමික අධ්‍යාපනය (1-5 ශ්‍රේණි)** | හඳුන්වාදීම...<br>- ක්‍රියාකාරකම් පාදක ඒකාබද්ධ විෂයමාලාව |
| **පූර්ව ළමාවිය අධ්‍යාපනය** | හඳුන්වාදීම...<br>- පූර්ව අධ්‍යාපන ප්‍රතිපත්තිය කෙටුම්පත් කර ඇත. |

මේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ගොඩනැගෙන්නේ පහත දැක්වෙන ප්‍රධාන කුලුනු පහ මත ය.

1. විෂයමාලා සංවර්ධනය
2. මානව සම්පත් සංවර්ධනය
3. යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ
4. තක්සේරු කිරීම සහ ඇගයීම
5. මහජන දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය

ඉහත කුලුනු පහට අදාළ ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

| විෂයමාලා සංවර්ධනය | මානව සම්පත් සංවර්ධනය | යටිතල පහසුකම් සංවර්ධනය සහ අධ්‍යාපන පරිපාලන ප්‍රතිසංස්කරණ | තක්සේරු කිරීම සහ ඇගයීම | මහජන දැනුවත් කිරීම සහ ප්‍රවර්ධනය |
|---|---|---|---|---|
| විෂයමාලා ව්‍යුහය සමාලෝචනය අවසන් කර ඇත.<br><br>1 සහ 6 ශ්‍රේණි සඳහා මොඩියුල කෙටුම්පත්කරණය අවසාන කර ඇත.<br><br>9 ශ්‍රේණිය දක්වා ව්‍යුහය යෝජනා කර ඇත.<br><br>යෝජිත 10-13 ව්‍යුහය උපදෙස් ලබා ගැනීම සඳහා විවෘත කර ඇත.<br><br>1 සහ 6 ශ්‍රේණි සඳහා මොඩියුල සමාලෝචනය සහ සංශෝධනය සිදු කර, පළ කරමින් පවතී.<br><br>ජාතික අධ්‍යාපන ආයතනයේ ආයතන සභාව සහ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. | 2026 වසරට සූදානම් වීම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ කටයුතු (ToT) සිදු වෙමින් පවතී<br><br>ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ නිලධාරීන්, විදුහල්පතිවරුන් සහ පරිපාලකයින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ (ToT) කටයුතු 2025 දී සැලසුම් කර ඇත.<br><br>ගුරු මධ්‍යස්ථාන, ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ (NCOE) වැඩිදියුණු කිරීම (යටිතල පහසුකම්) සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.<br><br>අධ්‍යාපනවේදී උපාධි සහ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ විෂයමාලා සමාලෝචනය යෝජනා කර ඇත.<br><br>අඛණ්ඩ වෘත්තීය සංවර්ධන ක්‍රියාකාරකම් (CPD) සමාලෝචනය යෝජනා කර ඇත. | 2026 සඳහා මාර්ගෝපදේශ සකස් කිරීම අවසන් වෙමින් පවතී<br><br>පාසල් යටිතල පහසුකම්, සනීපාරක්ෂක පහසුකම්, නිම නොකළ වැඩ, නව ගොඩනැගිලි සඳහා අයවැය ප්‍රතිපාදන වෙන් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී<br><br>පූරප්පාඩු තක්සේරු කිරීම සහ වඩාත් ඵලදායී ලෙස ගුරුවරුන් ස්ථානගත කිරීම සඳහා සේවක සංඛ්‍යා සමාලෝචනය සිදු වෙමින් පවතී<br><br>පාසල් තක්සේරුව සිදුවෙමින් පවතී: සැලසුම් අනුමත කිරීම DDC මගින් සිදු වනු ඇත.<br><br>බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා චක්‍රලේඛ සහ මාර්ගෝපදේශ සමාලෝචනය වෙමින් පවතී<br><br>ගුරු අධ්‍යාපන කවුන්සිලයක් ඇති කිරීම සඳහා වන කමිටුව පිහිටුවා ඇත.<br><br>පළාත් සම්බන්ධීකරණය සහ සාකච්ඡා නිතිපතා සිදු කෙරේ.<br><br>ඩිජිටල් අධ්‍යාපනය (DE) සඳහා කාර්යසාධක බලකාය: ඩිජිටල් යටිතල පහසුකම් තක්සේරුව සිදුවෙමින් පවතී | තක්සේරුකරණ සහ ඇගයීම් සැලැස්ම අවසන් කෙරෙමින් පවතී.<br><br>2026 වසරට සූදානම් වීම සඳහා තක්සේරුකරණ සහ ඇගයීම් සඳහා පුහුණුව සිදුවෙමින් පවතී.<br><br>පාසල් පාදක තක්සේරුකරණය (SBA) නියාමනය සහ වාර්තාකරණය සඳහාවන ජාතික පද්ධතිය ස්ථාපිත කිරීම සැලසුම් කර ඇත.<br><br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ (DCE) ධාරිතා සංවර්ධනය සැලසුම් කර ඇත. | පළාත් මට්ටමේ රැස්වීම්, උනන්දුවක් දක්වන කණ්ඩායම් සමඟ රැස්වීම් සහ සාකච්ඡා සිදුවෙමින් පවතී.<br><br>මාධ්‍ය ප්‍රධානීන් (විශ්ව විද්‍යාල ප්‍රජාව, වෘත්තීය සමිති, පෞද්ගලික අංශය පරිත්‍යාගශීලී ප්‍රජාව) සමඟ සාකච්ඡා සිදුවෙමින් පවතී.<br><br>සැප්තැම්බර් මාසයේ දී දියත් කිරීම (Launch) සැලසුම් කර ඇත<br><br>මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සැලසුම් කෙරෙමින් පවතී<br><br>මාධ්‍ය සාකච්ඡා සිදුවෙමින් පවතී. |

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා මාර්ග සිතියම – 2026-2031

| වර්ෂය | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේ මාර්ග සිතියම |
|---|---|
| 2026 | 1 සහ 6 ශ්‍රේණි සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2027 | 2 සහ 7 ශ්‍රේණි සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2028 | 3 සහ 8 ශ්‍රේණි සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම<br>10 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2029 | 4 සහ 9 ශ්‍රේණි සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම<br>9 ශ්‍රේණිය සඳහා ජාතික තක්සේරුකරණ වැඩසටහන ක්‍රියාත්මක කිරීම<br>11 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම<br>11 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව අනුව අ.පො.ස.සා/පෙළ විභාගය පැවැත්වීම |
| 2030 | 12 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම |
| 2031 | 13 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව ක්‍රියාත්මක කිරීම<br>13 ශ්‍රේණිය සඳහා නව විෂයමාලාව අනුව අ.පො.ස. උ.පෙළ විභාගය පැවැත්වීම |

| ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | 2025 වර්ෂය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | 2025.09.30 දිනට ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
| CF | 126-02-07-36-2509-99 | 228.85 | 0.502 | 860 | 807 | නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලිය පිළිබඳ විවිධ පාර්ශ්වයන් දැනුවත් කිරීම |
| | | | 0.1225 | 625 | 625 | නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ව ව්‍යාපෘති කළමනාකරණ වැඩසටහන සහ ප්‍රතිසංස්කරණ කුළුණු යටතේ 2026 වර්ෂය සඳහා සැලසුම් සකස් කිරීම |
| | | | 0.2528 | 285 | 285 | විෂයමාලා ප්‍රතිසංස්කරණ වලට අදාළව 2026 වර්ෂයේ දී 1 සහ 6 ශ්‍රේණිවල ඉගැන්වීම් සිදු කරනු ලබන ගුරු භවතුන් පුහුණු කිරීම සඳහා වන දැනුවත් කිරීමේ රැස්වීම් |
| | | | 0.3421 | 275 | 275 | නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ හා අධ්‍යාපන සංවර්ධනය සම්බන්ධයෙන් ආණ්ඩුකාරවරුන් හා පළාත් බලධාරීන් පළාත් මට්ටමින් දැනුවත් කිරීම |
| (CF) | 126-02-07-36-2509-51 | 15 | 0.139 | 310 | 310 | 9 වන ශ්‍රේණියේ දී ජාතික මට්ටමේ විභාගයක් පැවැත්වීම හා ඉන් පසුව ශිෂ්‍යයන් ශාස්ත්‍රීය හෝ වෘත්තීය අධ්‍යාපන අවස්ථා වෙත ප්‍රවේශ කිරීම සම්බන්ධ රැස්වීම් මාලාව |
| | | | 0.3984 | 842 | 822 | අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සමස්ත ක්‍රියාවලියට අදාළ විවිධ සාකච්ඡා හා රැස්වීම් |
| SESIP | 126-02-07-55-2509 | 4.55 | 0.7605 | 239 | 236 | නව විෂයමාලාවට අනුව මොඩියුල ප්‍රමිතිගත කිරීමේ වැඩමුළු හා ඒ සම්බන්ධ රැස්වීම් |

විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන **අංශය**

විෂය සමගාමී හා ප්‍රාථමික අධ්‍යාපන සංවර්ධන අංශය යටතේ අතිරේක ලේකම් ලෙස **උදාරා ටී. දික්කුඹුර** මහත්මිය කටයුතු කරනු ලබන අතර මෙම අංශය යටතේ ශාඛා හතරක වැඩසටහන් ක්‍රියාත්මක වේ. ඒ අනුව ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධව, විෂය සමගාමී ක්‍රියාකාරකම් සම්බන්ධව,පාසල් ළමුන්ගේ සෞඛ්‍ය හා පෝෂණය සම්බන්ධව, පාසල් ක්‍රීඩා සම්බන්ධව වැඩසටහන් මෙම අංශය මඟින් ක්‍රියාත්මක වේ.

**අංශය යටතේ පවතින ශාඛා**

පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව

ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව

විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව

සෞඛ්‍ය ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා ශාඛාව

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍ර | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | පුහුණු කරන ලද සංඛ්‍යාව | |
| **පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව** | UNFPA | 126-2-7-31-2401-13 | ප්‍රජනන සෞඛ්‍ය සම්බන්ධ-යෙන් දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වීම | – | – | – | – | මේ වන තුරු ප්‍රතිපාදන ලැබී නොමැත. |

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍ර | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | පුහුණු කරන ලද සංඛ්‍යාව | |
| **පාසල් සෞඛ්‍ය හා පෝෂණ ශාඛාව** | WB | 126-2-7-35-2401-12 | මානසික සෞඛ්‍ය සංවර්ධනය කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම | වැඩසටන් 25/ රැස්වීම් 04/ සෞඛ්‍ය කඳවුරු 01 | වැඩසටන් 04/ සාකච්ඡා-වන් 05/ රැස්වීම් 01/ සෞඛ්‍ය කඳවුරු 01 | පාසල් සිසුන්/ ගුරුවරුන් / විදුහල්පති වරුන්/ පළාත් නිලධාරින් /කලාප නිලධාරින් | ගුරු උපදේශකවරු-න් හා කලාප නිලධාරින්- 116/ විදුහල්පතිවරු-න්, ගුරුවරුන් - 290 / වෛද්‍යවරුන්, අධ්‍යාපන උසස් අධ්‍යාපන හා වෘ.අ. අමාත්‍යාංශය, විභාග දෙපා., ජාතික අධ්‍යාපන ආයතනය (මාණ්ඩලික නිලධාරින් දැනුවත් කිරීම) - 210 / බස්නාහිර පළාතේ නිලධාරින් හා අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරින් - 30 / ගුරුවරුන් හා විදුහල්පතිවරු-න් - 200 | ගොනු අංක ED/16 /02/06 /01/04 /2025 හා 2025.08.01 දිනැති ලිපිය මඟින් රු.මි. 5.00 ක ප්‍රතිපාදන ප්‍රමාණයක් නැවත පවරා දෙන ලදි. |

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍ර | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | පුහුණු කරන ලද සංඛ්‍යාව | |
| ප්‍රාථමික අධ්‍යාපන ශාඛාව | UNICEF | | ප්‍රාථමික අධ්‍යාපන විෂයභාර ගුරුවරුන් | ප්‍රාථමික අධ්‍යාපන ගුරු වෘත්තියේ සංවර්ධනය සඳහා වැඩසටහන් සකස් කිරීමේ වැඩසටහනේ පුහුණු කරුවන් පුහුණු කිරීම සඳහා පෙර සැලසුම් සකස් කරමින් පවතියි | | | | |
| ශාරීරික අධ්‍යාපන හා ක්‍රීඩා | ඒකාබද්ධ අරමුදල | 126-2-3-3-1409 | සමස්ත ලංකා පාසල් ක්‍රීඩා | තරග 31 | තරග 31 | | | |
| | GEMP | 126-2-7-35-2509-12 | ක්‍රීඩාවට අදාළව | වැඩසටහන් 10 | වැඩසටහන් 05 | 2000 | 500 | |
| විෂය සමගාමී මාර්ගෝපදේශ හා උපදේශන ශාඛාව | | | | | | | | |

සුබ සාධන වැඩසටහන්

| පාසල් සැපයුම් ශාඛාව | CF | 126-02-03-02-2102 | මිලියන 550 | මිලියන 22.2 | ළමා ඩෙස්ක් පුටු - 32822<br>ගුරු මේස/ගුරු පුටු -1000<br>විධායක මේස- 345<br>විධායක පුටු - 380<br>කාර්යාල මේස - 648<br>කාර්යාල පුටු - 959<br>වානේ අල්මාරි - 309<br>වානේ ලිපිගොනු කබඩ් - 306 | පාසල් 268ක් සඳහා ළමා ඩෙස් පුටු ද පාසල් 120 සඳහා ගුරු මේස ගුරු පුටු | 2024 වර්ෂයේදී ඇණවුම් ලබාදුන් ගුරු මේස, ගුරු පුටු 750ක් සඳහා මිලියන 22.2 ක් 2025 වර්ෂයේදී වැය වී ඇති අතර එම මුදල 2025 වර්ෂයේ ප්‍රතිපාදන වලින් ගෙවීම් කර ඇත |

## පාලන අංශය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ සාමාන්‍ය අධ්‍යාපන අංශයට අයත්වන පාලන අංශය ශාඛා 15කින් සමන්විතය. සාමාන්‍ය අධ්‍යාපන අංශය යටතේ සේවයේ නියුක්ත 1421ක් පමණ වන නිලධාරින්ගේ නිවාඩු, සියලුම වර්ගයේ ණය අනුමත කිරීම, විවිධ දීමනා සහ ගෙවීම් සම්බන්ධ නිර්දේශ සහ අනුමැතීන් ලබා දීම (සන්නිවේදන දීමනා, අතිකාල දීමනා, ගමන් වියදම් දීමනා, නිවාඩු දින වැටුප් දීමනා, සංග්‍රහ දීමනා, ඡායා පිටපත් දීමනා), ඉසුරුපාය පරිශ්‍රයේ නිලධාරින්ට අමතරව සියලුම ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථාන, රජයේ ගුරු විද්‍යාලවල සේවයේ නියුක්ත කාර්යය මණ්ඩලවල නිලධාරින්ගේ කෙටි/ දීර්ඝ කාලීන දේශීය හා විදේශ නිවාඩු සඳහා අනුමැතිය ලබා දීම, සංශෝධනය කිරීම, අවලංගු කිරීම හා දීර්ඝ කිරීමට අදාළ සියලු කටයුතු, වක්‍රලේඛ අංක නිකුත් කිරීම, රාජකාරී හැඳුනුම්පත්, නිදහස් දුම්රිය බලපත්‍ර සහ තෝරාගත් නිලධාරී කාණ්ඩවල තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම සිදු කරනු ලබයි.

තව ද, ඉසුරුපාය පරිශ්‍රයට අදාළ ආරක්ෂක, සනීපාරක්ෂක, විදුලිය, ජලය, දුරකථන, විදුලි සෝපාන හා වායු සමීකරණ (AC) නඩත්තු කටයුතු, විදුලි ජනක යන්ත්‍රවල නඩත්තු කටයුතු, සියලු ම අලුත්වැඩියාවන් ඇතුළු ගොඩනැගිලි නඩත්තු කටයුතු සිදු කරනු ලබයි. අමාත්‍යාංශයට අදාළ තැපැල, ශ්‍රවණාගාර පාලනය, මධ්‍යම ලේඛනාගාරය, භාෂා පරිවර්තන ඒකකය, මහජන දින සම්බන්ධීකරණ කටයුතු, අමාත්‍යාංශය සතු නිල නිවාස සම්බන්ධ කටයුතු යනාදිය ද පාලන අංශයට යටතේ වන කර්තව්‍යයන් වේ. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සහ මැතිවරණ කටයුතුවල දී අදාළ සම්බන්ධීකරණයන් මෙන්ම වත්කම් බැරකම් ප්‍රකාශ සම්බන්ධ කටයුතු ද පාලන අංශය මඟින් මෙහෙයවනු ලබයි.

1961 අංක 8 දරණ උපකෘත පාඨශාලා හා අභ්‍යාස විද්‍යාල පරිපූරක විධිවිධාන පනත යටතේ වන පාසල්වල, ජාතික පාසල්වල සහ ඉඩම් අත්පත් පනත යටතේ කටයුතු කරනු ලබන පාසල්වල ඉඩම් ගැටලුවලට අදාළව ද මෙම අංශය මඟින් කටයුතු සිදු කරනු ලබයි.

තව ද, අධ්‍යාපන අමාත්‍යවරයා විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් මෙන්ම පාර්ලිමේන්තු ප්‍රශ්න සඳහා පිළිතුරු යොමු කිරීම, පාර්ලිමේන්තු උපදේශන කාරක සභා, මහජන පෙත්සම් කාරක සභා, අයවැය කාරක සභා සහ ආංශික අධීක්ෂණ කාරක සභා, මානව හිමිකම් කොමිෂන් සභා සහ පාර්ලිමේන්තු කොමසාරිස් සම්බන්ධ රාජකාරීවලට අදාළ සම්බන්ධීකරණ කටයුතු ද පාලන අංශය යටතට අදාළ ය. ඉසුරුපාය පරිශ්‍රයට අයත් සියලු ම වාහන සම්බන්ධයෙන් වන ප්‍රවාහන රාජකාරි කටයුතු ද පාලන අංශයෙන් මෙහෙයවනු ලබයි.

තව ද, 2016 අංක 12 දරණ තොරතුරු දැන ගැනීමේ පනත යටතේ ඉදිරිපත්වන තොරතුරු ඉල්ලීම් සඳහා ප්‍රතිචාර දැක්වීම, අභියාචනා සඳහා තොරතුරු කොමිෂන් සභාව ඉදිරියේ පෙනී සිටීම, අමාත්‍යාංශය වෙත යොමුවන දුරකථන ඇමතුම් අදාළ අංශ වෙත යොමු කිරීම සහ අදාළ තොරතුරු ක්ෂණික දුරකථන ඇමතුම් පද්ධතිය (Hot Line) ඔස්සේ යොමු කිරීම මෙන්ම සාමාන්‍ය අධ්‍යාපන අංශයට අදාළව යොමුවන සියලුම නීති කෘත්‍යයන්ට අදාළව නීතිපති දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු කිරීම වැනි ඉහත සඳහන් කරනු ලැබූ සියලුම කර්තව්‍යයන්වල වගකීම පාලන අංශය යටතේ පැවරී ඇත.

අංශය යටතේ පවතින ශාඛා :

- සාමාන්‍ය පාලන ශාඛාව
- ගොඩනැගිලි කළමනාකරණ ශාඛාව
- තැපැල් ශාඛාව
- ඉඩම් ශාඛාව
- ප්‍රවාහන ශාඛාව
- ශ්‍රවණාගාරය
- මධ්‍යම ලේඛනාගාරය
- මධ්‍යම පුස්තකාලය
- නිවාඩු සංචිතය
- පාර්ලිමේන්තු කටයුතු ශාඛාව
- නීති අංශය
- ජාතික මෙහෙයුම් මැදිරිය
- RTI තොරතුරු මධ්‍යස්ථානය
- රිසෝග්‍රාෆ් අංශය
- භාෂා පරිවර්තන ඒකකය

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කළ සංඛ්‍යාව | |
| සාමාන්‍ය පාලන, ගොඩනැගිලි, ඉඩම් | ප්‍රාග්ධන | 126-01-02-00-2401-11 | පුහුණු වැඩසටහන් | 9 | 5 | 1500 | 1481 | |
| RTI | ප්‍රාග්ධන | 126-01-02-00-2401 | | 4 | 3 | 760 | 613 | |
| ප්‍රවාහන | ප්‍රාග්ධන | 126-01-02-2003 | | - | - | - | - | |

## විනය හා විමර්ෂන අංශය

අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඒ යටතේ පාලනය වන දිවයින පුරා පිහිටි ජාතික පාසල්, විද්‍යාපීඨ, ගුරු විද්‍යාල සහ ගුරු මධ්‍යස්ථාන ආදී ආයතනවල සේවය කරන විවිධ සේවාවන්ට අයත් නිලධාරින් විසින් ආයතන සංග්‍රහයේ විධිවිධාන සහ උපදෙස් සංග්‍රහ, මුදල් රෙගුලාසි, අධ්‍යාපන අමාත්‍යාංශ චක්‍රලේඛ, කාර්ය පටිපාටික රීති ආදියට පටහැනිව ක්‍රියා කර ඇති අවස්ථාවන්හි දී. ඒ සම්බන්ධව ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයට අනුව මූලික විමර්ශන සිදු කිරීම සහ විෂමාචාර අනාවරණය වන නිලධාරින් සම්බන්ධයෙන් විනය බලධරයා වශයෙන් විනයානුකූලව කටයුතු කිරීම සහ විනය බලධරයා නොවන නිලධාරින් සම්බන්ධයෙන් ඔවුනගේ විනය බලධරයා වෙත තොරතුරු ඉදිරිපත් කිරීම සහ සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම මෙම අංශය විසින් සිදු කරනු ලබයි.

අංශය යටතේ පවතින ශාඛා

i. විනය ශාඛාව

ii. විමර්ශන ශාඛාව

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත සංඛ්‍යාව | සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | අපේක්ෂිත සංඛ්‍යාව | පුහුණු කරන ලද සංඛ්‍යාව |
| විනය ශාඛාව | මානව සම්පත් සංවර්ධනය | 126-1-2-0-2401 | විනය පටිපාටිය සහ මූලික විමර්ශන | 01 | 01 | 19 | 19 |
| විමර්ශන ශාඛාව | | | | | | 18 | 18 |

ඉංජිනේරු අංශය

**ඉංජිනේරු අංශය යටතේ පවතින ශාඛා :**

- ඉංජිනේරු ශාඛාව
- ඉදිකිරීම් සේවා සැපයීම් සහ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ ශාඛාව

## 2025 විශේෂ අයවැය යෝජනාවලට අදාළ ක්‍රියාකාරකම්වල ප්‍රගතිය

| වැඩසටහන හෝ ක්‍රියාකාරකම | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | 2025.08.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2025.09.30 දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| Maintenance - Repair | Consolidated Fund | 126-01-02-00-2001(11) | 180 | 17.48 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Maintenance - New | CF | 126-01-02-00-2104(11) | 240 | 0.15 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Primary Education - Repairs | CF | 126-02-03-01-2001(11) | 150 | 58.1 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Primary Education - New | CF | 126-02-03-01-2104(11) | 30 | - | - |
| Secondary Education - Repairs | CF | 126-02-03-02-2001(11) | 200 | 128.83 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Secondary Education - New | CF | 126-02-03-02-2104(11) | 270 | 121.06 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |

| වැඩසටහන හෝ ක්‍රියාකාරකම | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | **2025.08.30** දිනට මූල්‍ය ප්‍රගතිය | **2025.09.30** දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| Facilitate Education and training of A/L Vocational Stream Students | CF | 126-02-03-04-2001 (11) | 2 | - | - |
| Facilitate Education and training of A/L Vocational Stream Students | CF | 126-02-03-04-2104 (11) | 118 | 56 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Improvement of Sanita-tion Facilities | CF | 126-02-03-25-2104 (11) | 524 | - | - |
| Disaster Mitigation and Safety Improvements in Schools | CF | 126-02-03-26-2001 (11) | 400 | - | - |
| Special Education - Re-pair | CF | 126-02-05-01-2001 (11) | 30 | - | - |
| Special Education - New | CF | 126-02-05-01-2104 (11) | 50 | - | - |
| NPRC Special Education - Repair | CF | 126-02-05-05-2001 (11) | 25 | - | - |
| NPRC Special Education - New | CF | 126-02-05-05-2104 (11) | 5 | - | - |
| Teachers College and Centers - Repair | CF | 126-02-06-01-2001 (11) | 120 | 20.44 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Teachers Collage and Centers - New | CF | 126-02-06-01-2104 (11) | 90 | 2.82 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| National Education of Education - Repair | CF | 126-02-06-02-2001 (11) | 275 | 63.98 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| National Education of Education - New | CF | 126-02-06-02-2104 (11) | 50 | 6.35 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Facility Improvement of National Colleges of Education | CF | 126-02-06-09-2001 (11) | 825 | 3.99 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |

| වැඩසටහන හෝ ක්‍රියාකාරකම | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | **2025.08.30** දිනට මූල්‍ය ප්‍රගතිය | **2025.09.30** දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| Improvement of Teacher Colleges and Centers | CF | 126-02-06-10-2001 (11) | 280 | - | - |
| Providing Electricity Facil-ities (through National Grid or Solar) for the Schools | CF | 126-02-07-14-2506 (11) | 25 | - | - |
| Upgrading Plantation Schools to Secondary Level - Repair | CF | 126-02-07-15-2001 (11) | 17.79 | 9.42 | නියමිත කාල රාමුවට අනුකූලව ක්‍රියාත්මක වෙමින් පවතී |
| Upgrading Plantation Schools to Secondary Level - New** | CF | 126-02-07-15-2104 (11) | 18 | 2.22 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Dental helth Facilities | CF | 126-02-07-17-2104 (11) | 9.21 | - | - |
| Providing Sanitary and Water facilities for all Schools - New | CF | 126-02-07-18-2104 (11) | 50 | - | - |
| Upgrading Facilities of 3577 Primary Schools - New | CF | 126-02-07-19-2104 (11) | 10 | - | - |
| Providing Facilities of Teacher Quarters and Rest Rooms etc.for Rural and Regional Schools | CF | 126-02-07-23-2104 (11) | 10 | 7.93 | නියමිත කාල රාමුවට අනුකූලව ක්‍රියාත්මක වෙමින් පවතී |
| Upgrading facilities of 1000 Secondary Schools - Repairs | CF | 126-02-07-24-2001 (11) | 100 | 24.32 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Upgrading facilities of 1000 Secondary Schools - New | CF | 126-02-07-24-2104 (11) | 910 | 73.98 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Improve Facilities of 1360 Schools which were not included in recent projects - Repairs | CF | 126-02-07-25-2001 (11) | 20 | 3.45 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |

| වැඩසටහන හෝ ක්‍රියාකාරකම | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | වෙන් කරන ලද ප්‍රතිපාදනය | **2025.08.30** දිනට මූල්‍ය ප්‍රගතිය | **2025.09.30** දිනට ප්‍රගතිය |
|---|---|---|---|---|---|
| Improve Facilities of 1360 Schools which were not included in recent projects - New | CF | 126-02-07-25-2104 (11) | 500 | 21.73 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Trilingual education -New | CF | 126-02-07-27-2104 (11) | 300.38 | - | - |
| Trilingual education -New | Indian Grant | 126-02-07-27-2104 (13) | 100 | 100 | සම්පූර්ණ කර ඇත |
| Trilingual education -New | Indian Grant | 126-02-07-27-2104 (17) | 37.62 | 18 | සම්පූර්ණ කර ඇත |
| Upgrading Schools in Plantation Areas (GOSL/India) | CF | 126-02-07-44-2104 (13) | 200 | - | - |
| Upgrading Schools in Plantation Areas (GOSL/India) | CF | 126-02-07-44-2104 (17) | 36 | - | - |
| Teachers Colleges and Centers -Repair (SESIP) | ADB Fund | 126-02-07-55-2001 (11) | 575 | 51.01 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |
| Improvement of Infrastructure Facilities in Schools | CF | 126-02-07-58-2001 (11) | 2000 | 209.03 | තරමක් ප්‍රමාද වුවත් ක්‍රියාත්මක වෙමින් පවතී |

## පිරිවෙන් අධ්‍යාපන අංශය

පිරිවෙන් අධ්‍යාපන අංශය අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර, දිවයින පුරා පිරිවෙන් අධ්‍යාපනය සංවර්ධනය කිරීම හා නඩත්තු කිරීම සඳහා ප්‍රධාන වගකීමක් ඉටු කරයි. මෙය සාම්ප්‍රදායික බෞද්ධ පිරිවෙන් අධ්‍යාපන පද්ධතිය රැක ගැනීමත් සමඟ, නූතන අධ්‍යාපන මාර්ගෝපදේශ හා ජාතික සංවර්ධන ඉලක්කවලට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීම අරමුණු කරගෙන ක්‍රියාත්මක වේ.

**අංශය තුළ ඇති ශාඛා**

- **පාලන ශාඛාව** – කාර්ය මණ්ඩලය, ශිෂ්‍ය කටයුතු සහ පිරිවෙන්වල සාමාන්‍ය මෙහෙයුම් කළමනාකරණය
- **පිරිවෙන් අධ්‍යාපන ශාඛාව** – පිරිවෙන් අධ්‍යාපන පනතට අනුව අධ්‍යයනය පිළිබඳ අධීක්ෂණය හා විධිමත් කිරීම
- **සංවර්ධන ශාඛාව** – පිරිවෙන්වල පවතින සංවර්ධන ව්‍යාපෘති, පුහුණු වැඩසටහන්, මාර්ගෝපදේශ සහ සැලසුම් සැකසීම, ක්‍රියාවට නැංවීම හා නියාමනය කිරීම
- **ගිණුම් ශාඛාව** – මූල්‍ය කළමනාකරණය, අරමුදල් බෙදාහැරීම හා වියදම් පාලනය

ධාරිතා සංවර්ධන වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | ධාරිතා සංවර්ධන ක්ෂේත්‍රය | වැඩසටහන් සංඛ්‍යාව | | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | අපේක්ෂිත | සම්පූර්ණ කළ | අපේක්ෂිත | පුහුණු කරන ලද | |
| පිරිවෙන් | CF | 126-2-05-002-2205 | ශිෂ්‍ය ආකල්ප පුහුණු වැඩසටහන් | 250 | 38 | 2500 | 1225 | දෙවන හා තෙවන අදියර ක්‍රියාත්මක වෙමින් පවතී |
| | | | පිරිවෙන් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන | 19 | 5 | 1650 | 350 | ක්‍රියාත්මක වෙමින් පවතී |
| | | | පරිවේණාචාර්යවරුන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් හා විෂයානුබද්ධ වැඩසටහන් පැවැත්වීම | 125 | 71 | 5106 | 3718 | ක්‍රියාත්මක වෙමින් පවතී |

### සුබ සාධන වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | 2025 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අපේක්ෂිත සංඛ්‍යාව | 2025.09.30 දිනට ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
| පිරිවෙන් | CF | 126-2-05-002-2205 | 82.5 | 12 | 825 | 120 | හතරවන කාර්තුවේ දී සමස්ත ප්‍රදානයන් පිරිවෙන් වෙත මුදාහැරීමට අපේක්ෂා කෙරේ |
| | | 126-2-05-002-1501 | 90 | 90 | 30,000 | | පිරිවෙන් සිසුන් සඳහා පාවහන් වවුචර පත් ලබා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය වෙත වැය ශීර්ෂ යොමු කර ඇත. |
| | | 126-2-05-002-1508 (021) | 310 | 202.90 | 825 | 567 | පිරිවෙන්වල වාර්ෂික ආධාර ප්‍රතිපූරණය |
| | | 126-2-05-002-1201 | 14.31 | 2.2 | 825 | 142 | පිරිවෙන් අධ්‍යාපන ආයතන සඳහා ලිපි ද්‍රව්‍ය ආධාර ලබා දීම |
| | | | 0.71 | | 150 | | ප්‍රාචීන අධ්‍යාපනය සඳහා පොත් මිල දී ගැනීම හා සැපයීම සඳහා වන ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත |

### වෙනත් වැඩසටහන්

| ශාඛාව | ප්‍රතිපාදන මූලාශ්‍රය | වැය ශීර්ෂය | 2025 වර්ෂය සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය (රු.මි) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය (රු.මි) | ප්‍රතිලාභීන් සංඛ්‍යාව | | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|---|---|
| | | | | | අපේක්ෂිත සංඛ්‍යාව | 2025.09.30 දිනට ප්‍රතිලාභීන් සංඛ්‍යාව | |
| පිරිවෙන් | CF | 126-2-05-002-1409 (140) | 2.00 | 2.8 | | | සමස්ත ලංකා සිසු නිපුණතා ඇගයීම වැඩසටහන සංවිධානය හා සහතික පත් ප්‍රදානය කිරීම |
| | | | 4 | | | | ජාතික පිරිවෙන් දින වැඩසටහන |
| | | 126-2-05-002-2509 (034) | 6.70 | | | | රජයේ නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට සමගාමී ව පිරිවෙන් අධ්‍යාපන විෂයමාලාවන්හි ප්‍රතිසංස්කරණ අවශ්‍යතා හඳුනා ගැනීම |
| | | | 3.3 | 3.3 | | | පිරිවෙන් අධ්‍යාපනවේදී උපාධිය සඳහා විෂයමාලා සංශෝධනය සඳහා අවසන් අදියරේ ගෙවීම |

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාවලියේ මූලික සක්‍යතා හා යෝජනා ලබා ගැනීම ආරම්භ කර ක්‍රියාත්මක වෙමින් පවතී.

විදේශාධාර ව්‍යාපෘති පිළිබඳ තොරතුරු **- මහා පරිමාණ/විදේශ අරමුදල් ව්‍යාපෘති සාරාංශය (2025 අගෝස්තු 31 දිනට)**

| | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන වෙන් කිරීම (2025) | කාලසීමාව | භෞතික ප්‍රගතිය (2025) |
|---|---|---|---|---|---|
| 1 | තාක්ෂණික ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම ( KOICA ව්‍යාපෘතිය ) | KOICA/ GOSL | රු.මිලි. 2,496 .00 | 2017-2025 | |
| | 01. තාක්ෂණ ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම KOICA ව්‍යාපෘතිය - **MOE Scope** (දේශීය අරමුදල් මත අධ්‍යාපන අමාත්‍යාංශය මගින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම) | | | | 98% |
| | 02. තාක්ෂණ ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම KOICA ව්‍යාපෘතිය - දේශිය අරමුදල් මත අධ්‍යාපන අමාත්‍යාංශය මගින් විද්‍යා පීඨයේ පිරිමි සහ කාන්තා නේවාසිකාගාර ඉදිකිරීම | | | | 30% |
| | 03. තාක්ෂණ ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම KOICA ව්‍යාපෘතිය - **KOICA Scope** කොරියානු ආධාර මත අධ්‍යයන ගොඩනැගිලි ඉදිකිරීම | | | | 100% |
| | 04. තාක්ෂණ ධාරාව සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සහ ගුරු පුහුණු පද්ධතිය ස්ථාපිත කිරීම KOICA ව්‍යාපෘතිය - **KOICA Scope** (දෙවන අධියර- බහුකාර්ය ගොඩනැගිල්ල සහ නිල නිවාස ඉදි කිරීම ) | | | | 99% |

| | ව්‍යාපෘතිය | අරමුදල් මූලාශ්‍රය | ප්‍රතිපාදන වෙන් කිරීම (2025) | කාලසීමාව | භෞතික ප්‍රගතිය (2025) |
|---|---|---|---|---|---|
| 2 | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන් සඳහා වන ජාතික හා පළාත් සම්පත් මධ්‍යස්ථානය | CF | රු.මි. 33.63 | 2015-2025 | 93% |
| 4 | ද්විතීයික අධ්‍යාපනය තුළ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානයක් පිහිටුවීම (ICT Hub) | EDCF/GOSL | රු.මි. 1100.00 | 2019-2026 | 0.5% |
| 5 | සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (GEMP) | ලෝක බැංකුව | රු.මි. 2000.00 | 2018-2027 | 45% |
| 6 | තාක්ෂණික අධ්‍යාපන සංවර්ධන වැඩසටහන | OFID/GOSL | රු.මි. 2500.00 | 2018-2025 | 80% |
| 7 | ද්විතීයික අධ්‍යාපන ආංශික සංවර්ධන වැඩසටහන (SESIP) | ADB | රු.මි. 3600.00 | 2020-2025 | 53.44% |
| 8 | බහුවාර්ගික හා ත්‍රෛභාෂා අධ්‍යාපනය සහිත ජාතික පාසල පොළොන්නරුව ඉදිකිරීම | ඉන්දියානු අරමුදල් | රු.මි. 100 | 2017-2025 | 100% |
| 9 | UNICEF ව්‍යාපෘතිය (පූර්ව ළමාවිය අධ්‍යාපනය, ඩිජිටල් පුරවැසි කුසලතා, ආදිය) | UNICEF | | 2025 | 30% |
| 10 | ඉන්දියානු අරමුදල් යටතේ වතු පාසල් 9 ක් වැඩිදියුණු කිරීම | ඉන්දියානු අරමුදල් (Indian Grant) / GOSL | රු.මි. 236 | 2020- 2027 | 18 % |

සැ. යු. 1. බොහෝ ව්‍යාපෘති මුල් කාලසීමාවන් දීර්ඝ කර ඇත.

2. ප්‍රගතිය පිළිබඳ දත්ත 2025 **අගෝස්තු** 31 දිනට යාවත්කාලීන කර ඇත.

3. සමහර ව්‍යාපෘති සඳහා වටිනාකම් පසුව සංශෝධනය කර ඇත.

## 04. මූල්‍ය ප්‍රගතිය

අධ්‍යාපන අමාත්‍යාංශය වැය ශීර්ෂය යටතේ ප්‍රාග්ධන වියදම් (2024.08.31 දිනට)

| වැඩසටහන | **2025 ඇස්තමේන්තුව (රු.මි.)** | **2025.08.31 දිනට වියදම (රු.මි.)** |
|---|---|---|
| අමාත්‍ය කාර්යාලය | 10,000,000 | 1,173,520 |
| පරිපාලන හා ආයතන සේවා (සාමාන්‍ය අධ්‍යාපනය) | 790,000,000 | 54,912,668 |
| පරිපාලන හා ආයතන සේවා (උසස් අධ්‍යාපනය) | 1,880,000,000 | 84,732,729 |
| පරිපාලන හා ආයතන සේවා (නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපන) | 1,230,000,000 | 306,758,283 |
| ප්‍රාථමික හා ද්වීතියික අධ්‍යාපනය | 2,824,000,000 | 463,405,933 |
| විශේෂ අධ්‍යාපනය | 351,000,000 | 22,294,321 |
| ගුරු සංවර්ධනය | 1,850,000,000 | 128,027,340 |
| සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | | |
| * විදේශ ආධාර | 8,047,862,000 | 862,987,295 |
| *දේශීය (NSBS) | 1,670,000,000 | 143,075,764 |
| දේශීය | 6,650,000,000 | 1,016,475,039 |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති | 24,770,000,000 | 9,291,245,183 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබාගැනීම | 1,050,000,000 | 415,500,000 |
| වෘත්තීය පුහුණු සහ නිපුණතා සංවර්ධනය | 3,221,300,000 | 589,736,060 |
| එකතුව | **54,344,162,000** | **13,380,324,134** |

**මූලාශ්‍රය : විවිධ ගිණුම් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

**අධ්‍යාපන අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ පුනරාවර්තන වියදම් (2025.08.31)**

| වැඩසටහන | 2025<br>ඇස්තමේන්තුව<br>(රුපියල් ) | 2025.08.31 දිනට වියදම<br>(රුපියල්) |
|---|---|---|
| **අමාත්‍ය කාර්යාලය (126 - 1– 1)** | **100,000,000.00** | **24,352,040.28** |
| **ආයතන හා පරිපාලන කටයුතු (126 - 1– 2) සාමාන්‍ය අධ්‍යාපනය** | **33,600,000,000.00** | **8,675,396,427.39** |
| **ආයතන හා පරිපාලන - උසස් අධ්‍යාපන අංශය (126 - 1– 9)** | **275,000,000.00** | **164,080,052.43** |
| ආයතන හා පරිපාලන - නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපනය (126 - 1– 18) | 6,455,110,000.00 | 3,732,587,374.86 |
| වැඩසටහන 01 | 40,430,110,000.00 | 12,596,415,894.96 |
| ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය (126 -2-3) | 55,284,000,000.00 | 36,001,546,833.01 |
| ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය (126 - 2 - 3 – 1) ප්‍රාථමික 01 | 6,565,000,000.00 | 4,713,169,870.01 |
| ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය (126 - 2 – 3 - 2) ද්විතීයික 02 | 48,099,000,000.00 | 31,112,047,894.63 |
| ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය (126 - 2– 3 ) (3/4/21/22) | 620,000,000.00 | 176,329,068.37 |
| විශේෂ අධ්‍යාපනය (126 - 2– 5) | 10,840,000,000.00 | 6,990,434,198.26 |
| විශේෂ අධ්‍යාපනය (126 - 2– 5)(1/3/4/5) | 3,531,553,000.00 | 2,232,863,188.92 |
| විශේෂ අධ්‍යාපනය (126 - 2– 5)(2-Piriven) | 7,308,447,000.00 | 4,757,571,009.34 |
| ගුරු සංවර්ධනය (126 - 2– 6) | 4,276,000,000.00 | 2,421,763,395.70 |
| ගුරු සංවර්ධනය - (1-ගුරු විද්‍යාල හා ගුරු මධ්‍යස්ථාන) (126 - 2– 6) | 794,800,000.00 | 393,277,759.30 |
| ගුරු සංවර්ධනය (2- ජාතික විද්‍යාපීඨ (/7) | 3,481,200,000.00 | 2,028,485,636.40 |
| උසස් අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘතිය(126-2-10) | 2,875,000,000.00 | 1,352,994,867.40 |
| උසස් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය සඳහා ආයතනික සහය ලබා ගැනීම (126 - 2– 11) | 2,482,550,000.00 | 1,560,398,000.00 |
| නිපුණතා සංවර්ධන හා වෘත්තීය අධ්‍යාපනය(126-2-21) | 900,000,000.00 | 442,095,950.00 |
| වැඩසටහන 02 | 76,657,550,000.00 | 48,769,233,244.37 |
| **පුනරාවර්තන හා වියදම් එකතුව** | **117,087,660,000.00** | **61,365,649,139.33** |

**මූලාශ්‍රය: මුදල් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය**

# 05. ශිෂ්‍ය සාධනය

## ශිෂ්‍ය කාර්යසාධනය

### (අ) පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයේ ශිෂ්‍ය සාධනය

**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව සහ ශිෂ්‍ය සාධනය (2019 – 2024)**




**පස්වන ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගයෙන් ලකුණු 70 ට වඩා ලබා ගත් ශිෂ්‍ය ප්‍රතිශතය (2019– 2024)**

| | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 332,168 | 326,264 | 335,158 | 329,668 | 332,949 | 319,284 |
| ලකුණු 70ට වඩා ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 78.11 | 86.83 | 77.12 | 82.97 | 77.75 | 77.96 |
| මධ්‍යන ලකුණ | 114.38 | 125.65 | 109.31 | 115.11 | 111.74 | 107.25 |

මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2024, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**ආ) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2018 – 2024)

| | **2018** | **2019** | **2020** | **2021** | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 296,029 | 305,427 | 308,134 | 311,321 | 317,326 | 322,537 | 322,704 |
| සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | 222,281 | 225,539 | 236,015 | 231,982 | 236,041 | 244,228 | 237,026 |
| සමත් ප්‍රතිශතය % | 75.09 | 73.84 | 76.59 | 74.52 | 74.38 | 75.72 | 73.45 |




**පළාත් අනුව අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයෙන් අ.පො.ස. (උසස් පෙළ) සඳහා සුදුසුකම්ලත් ශිෂ්‍ය සංඛ්‍යාව සහ ප්‍රතිශතය (2023 - 2024)**

| පළාත | **2023** | | | **2024** | | |
|---|---|---|---|---|---|---|
| | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % | පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ශිෂ්‍ය සංඛ්‍යාව | සමත් ප්‍රතිශතය % |
| දකුණ | 41,302 | 32,301 | 78.21 | 41,909 | 31,702 | 75.64 |
| වයඹ | 38,383 | 28,416 | 74.03 | 39,405 | 28,166 | 71.47 |
| බස්නාහිර | 80,474 | 62,056 | 77.11 | 81,244 | 60,509 | 74.47 |
| ඌව | 22,217 | 16,465 | 74.11 | 21,641 | 15,830 | 73.14 |
| මධ්‍යම | 41,737 | 31,380 | 75.19 | 42,173 | 31,174 | 73,91 |
| සබරගමුව | 30,599 | 23,421 | 76.54 | 30,451 | 22,374 | 73.47 |
| උතුරු මැද | 23,193 | 16,604 | 71.59 | 23,289 | 16,360 | 70.24 |
| නැගෙනහිර | 26,780 | 20,717 | 77.36 | 26,222 | 19,474 | 74.26 |
| උතුර | 17,852 | 12,868 | 72.08 | 16,370 | 11,437 | 69.86 |
| **මුළු එකතුව** | **322,537** | **244,228** | **75.72** | 322,704 | 237,026 | 73.45 |

මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2024, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය (2018 – 2024) ඒ ඒ විෂය සමත් ශිෂ්‍ය ප්‍රතිශතය**

| | සමත් ප්‍රතිශතය | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2021 | 2022 | 2023 | 2024 |
| පළමු බස (සිංහල) | 91.3 | 91.4 | 91.3 | 89.15 | 88.73 | 86.9 | 87.73 |
| පළමු බස (දෙමළ) | 90.08 | 87.05 | 89.22 | 87.02 | 88.27 | 86.06 | 87.03 |
| ඉංග්‍රීසි | 54.9 | 62.36 | 65.78 | 72.86 | 73.5 | 70.6 | 73.82 |
| ගණිතය | 68.3 | 71.08 | 70.52 | 70.03 | 73.36 | 73.16 | 69.07 |
| විද්‍යාව | 69.83 | 65.45 | 69.07 | 70.84 | 72.19 | 72.9 | 71.06 |




මූලාශ්‍රය: ඇගයීම් වාර්තාව 2018 - 2024 , ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**(ඇ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ ශිෂ්‍ය සාධනය (පාසල් අයදුම්කරුවන්) 2019 - 2024**

| | 2019 (නව නිර්දේශය) | 2019 (පැරණි නිර්දේශය) | 2020 (නව නිර්දේශය) | 2020 (පැරණි නිර්දේශය) | 2021 | 2022 | 2023 | 2024 |
|---|---|---|---|---|---|---|---|---|
| පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව | 173,781 | 61,769 | 251,168 | - | 236,035 | 232,797 | 229,057 | 222,774 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් | 108,353 | 46,552 | 165,711 | - | 149,946 | 149,487 | 151,343 | 149,964 |
| විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලත් ශිෂ්‍ය ප්‍රතිශතය (%) | 62.35 | 75.36 | 65.98 | - | 63.53 | 64.21 | 66.07 | 67.32 |

මූලාශ්‍රය: ඇගයීම් වාර්තාව 2024, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**එක් එක් විෂය ධාරාවෙන් විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා සුදුසුකම් ලැබූ ශිෂ්‍ය ප්‍රතිශතය (පළමු වරට පෙනී සිටින 2020 - 2024)**

ජීව විද්‍යාව




භෞතික විද්‍යාව




වාණිජ




කලා




ඉංජිනේරු තාක්ෂණවේදය




ජෛව පද්ධති තාක්ෂණවේදය




පොදු




මූලාශ්‍රය : ඇගයීම් වාර්තාව 2024, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# 06. සාමාන්‍ය අධ්‍යාපන අංශයට අනුබද්ධ ආයතන

## ජාතික අධ්‍යාපන ආයතනය

**2025.09.30 දක්වා භෞතික ප්‍රගතිය**

- ජාතික මුල් ළමාවිය අධ්‍යාපන විෂයමාලා රාමුව මාධ්‍ය තුනෙන් පිළියෙල කර අවසන් කිරීම.
- 2026 පාසල්වල ක්‍රියාත්මක කිරීමට නියමිත, 1 හා 6 ශ්‍රේණිවල ක්‍රියාකාරකම් පොත්, මොඩියුල හා ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ පිළියෙල කර අවසන් කිරීම.

මේ සම්බන්ධයෙන් අත් කරගෙන ඇති ප්‍රගතිය පහත දැක්වෙන පරිදි වේ.

| | ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ සංඛ්‍යාව | ක්‍රියාකාරකම් පොත්/ මොඩියුල සංඛ්‍යාව |
|---|---|---|
| 1 ශ්‍රේණිය | 46 | 49 |
| 6 ශ්‍රේණිය (1 වාරය) | 42 | 112 |
| **එකතුව** | **46** | **161** |

- පළාත් සඳහා, 1 හා 6 ශ්‍රේණිවල විෂයයන් 32ක් වෙනුවෙන් නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අදාළ ව පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම. 1 ශ්‍රේණිය සඳහා පුහුණුකරුවෝ 431ක් ද 6 ශ්‍රේණිය සඳහා පුහුණුකරුවෝ 5,566ක් ද සහභාගි වූහ.
- 10-13 ශ්‍රේණිවල කොරියන් භාෂා ගුරුවරුන් සඳහා මාර්ගගත ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම හා ගුරුවරුන් 69ක් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- 8 ශ්‍රේණිය සඳහා විෂය සමගාමී ක්‍රියාකාරකම් පිළිබඳ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ 66ක් පිළියෙල කර අවසන් කිරීම හා සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයෙහි, පිළියෙල කරන ලද ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ උපයෝගී කර ගනිමින් ගුරුවරුන් 20ක් වෙනුවෙන් ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- විදුහල්පතිවරුන් හා අධ්‍යාපන නිලධාරීන් ද ඇතුළු සහභාගිකයන් 1960ක් සඳහා අධ්‍යාපන පද්ධතියේ පරිණාමනය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- NIE You Tube නාලිකාව සඳහා වීඩියෝ වැඩසටහන් 26ක්, ප්‍රජා සම්ප්‍රජානන වැඩසටහන් 02ක් හා ප්‍රවණතා හා ප්‍රවෘත්ති වැඩසටහන් 30ක් නිපදවීම.
- 'ශ්‍රී ලංකාවේ පූර්ව සේවා පුහුණුව : වැඩිදියුණුව සඳහා අභියෝග, අවස්ථා හා මංපෙත්' පර්යේෂණයට ආධාරක වශයෙන් ගූගල් පත්‍රිකා මගින් දත්ත රැස්කිරීම.
- පවත්නා උපමානවල සමාලෝචනය අනුගමනය කරමින්, විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් ප්‍රධාන ධාරාවට අනුගත කිරීම පිළිබඳ ව ගුරුවරුන් සඳහා මාර්ගෝපදේශවල අවසන් කෙටුම්පත පිළියෙල කිරීම.

- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ විෂයමාලා ප්‍රතිසංස්කරණ සම්බන්ධ සමීක්ෂණයක් පැවැත්වීම.
- ශික්ෂණලාභීන් 4,313කට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව පිරිනැමීම සඳහා 2025 ජූලි 29 සිට 31 දක්වා බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ දී ප්‍රදානෝත්සවයක් පැවැත්වීම.
- විවිධ හේතු නිසා පාසල් අධ්‍යාපනය මගහැරුණු ශිෂ්‍යයනට අධ්‍යාපන මංපෙත් විවර කර දීමේ අරමුණින් විවෘත පාසල් ඒකකය විසින් සාක්ෂරතා, පදනම් හා ද්විතීයික යනුවෙන් දුරස්ථ පාඨමාලා තුනක් පවත්වනු ලැබේ. මේ වන විට දිවයින පුරා විසිරුණු මධ්‍යස්ථාන 23ක ඉගෙනුම්ලාභීහු 4,313 දෙනෙක් එම පාඨමාලා හදාරමින් සිටිති.

- දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය මධ්‍යස්ථාන ඔස්සේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා දර්ශනපති උපාධියේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පාඨමාලා 18ක් ක්‍රියාත්මක කිරීම.

**2025.09.30 දක්වා මූල්‍ය ප්‍රගතිය**

| මූල්‍ය සැපයුම් ප්‍රභවය | පුනරාවර්තන වියදම් | | ප්‍රාග්ධන වියදම් | |
|---|---|---|---|---|
| | ලැබීම් | වියදම | ලැබීම් | වියදම |
| රාජ්‍ය ප්‍රදානය | 507,500,000 | 416,090,792 | 120,000,000 | 16,638,694 |
| GEMP | 50,000,000 | 18,059,190 | - | |
| SESIP | 136,373,000,000 | 27,501,262 | 10,000,000 | |
| ජාතික අධ්‍යාපන ආයතනය ඉපයූ මුදල (ආදායම) | 663,229,000 | 271,225,000 | 116,920,000 | 5,192,245 |
| UNICEF | 5,831,340 | 221,220 | - | |
| UNESCO (KNCU) | 21,700,000 | 14,309,094 | 4,000,000 | 1,909,063 |
| එකතුව | **1,384,633,340** | **747,406,560** | **250,920,000** | **23,740,002** |

**2025 වසර අවසන් වන විට සම්පූර්ණ කිරීමට අපේක්ෂිත කාර්ය**

- නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ 6 ශ්‍රේණිය සඳහා (2 හා 3 වාර) ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා මොඩියුල පිළියෙල කර අවසන් කිරීම.
- නව විෂයමාලා ප්‍රතිසංස්කරණ යටතේ 6 ශ්‍රේණියේ පළමු වාරයට අදාළ ව පුහුණුකරුවන්ගේ ධාරිතා සංවර්ධන වැඩසටහන් පවත්වා අවසන් කිරීම.
- 2 හා 7 ශ්‍රේණි සඳහා ක්‍රියාකාරකම් පොත්, ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ හා මොඩියුල සංවර්ධනය සම්පූර්ණ කිරීම.
- පළාත් මට්ටමේ ගුරු පුහුණු වැඩසටහන් පැවැත්වීම හා අධීක්ෂණය.
- ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථානවල (RESC) වාර්ෂික සම්මන්ත්‍රණය පැවැත්වීම.
- 10 ශ්‍රේණියේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා ඇති ළමයින් ප්‍රධාන ධාරාගත කිරීම සඳහා ගුරු මාර්ගෝපදේශ නිශ්චිත කොට අවසන් කිරීම.
- ජාතික ගුරු සංවර්ධන රාමුව නිශ්චිත කොට අවසන් කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා උසස් ජාතික ශික්ෂණ ඩිප්ලෝමා වැඩසටහන සංවර්ධනය කිරීම.
- ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ සඳහා විෂය නිර්දේශ සතරක් පිළියෙල කිරීම.
- ශ්‍රී ලංකා අධ්‍යාපන පර්යේෂණ ජර්නලය මාධ්‍ය තුනෙන් පිළියෙල කිරීම.
- ආචාර්ය සී.ඩබ්ලිව්.ඩබ්ලිව් කන්නන්ගර අනුස්මරණ දේශනය පැවැත්වීම සංවිධානය.

## 2026 වසර සඳහා සැලසුම් කර ඇති වැඩසටහන්වල සාරාංශය

- විෂයමාලා හා ශික්ෂණ විද්‍යා මධ්‍යස්ථානය විසින් ජාතික අධ්‍යාපන ආයතනයේ විෂයමාලා සංවර්ධනය හා සම්බන්ධ සියලු ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය හා අධීක්ෂණය.
- ජාතික අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන සියලු වැඩසටහන්වල ගුණාත්මය තහවුරු කිරීම සඳහා ගුණාත්මක තහවුරුව සඳහා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- අන්තර්ජාතික කටයුතු ඒකකයක්, වෘත්තීය සංවර්ධන පාඨමාලා සඳහා විෂයමාලා සංවර්ධන මධ්‍යස්ථානයක්, ශිෂ්‍ය කටයුතු ඒකකයක් හා වෘත්තීය සංවර්ධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම.
- පූර්ව ප්‍රාථමික ගුරුවරුන් හා මුල් ළමා විය සුරැකුම් හා සංවර්ධන නිලධාරින් සඳහා ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම.
- අධ්‍යාපන පරිපාලකයින්, විදුහල්පතිවරුන්, ජාතික අධ්‍යාපන විද්‍යා පීඨවල හා ගුරු මධ්‍යස්ථානවල ගුරු අධ්‍යාපනඥයින්, දෙමාපියන්/භාරකරුවන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා අනෙකුත් අදාළ රාජ්‍ය නිලධාරින් වෙනුවෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- විෂයමාලා ප්‍රතිසංස්කරණවලට පහත දැක්වෙන කාර්ය ඇතුළත් වේ.

| | |
|---|---|
| විෂය නිර්දේශ සංවර්ධනය | 12 ශ්‍රේණිය |
| ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ / මොඩියුල සංවර්ධනය | 3, 8 හා 10 ශ්‍රේණි |
| ගුරු මාර්ගෝපදේශ සංග්‍රහ / මොඩියුල අවසන් සැකසුම | 2 හා 7 ශ්‍රේණි |
| ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම | 2 හා 7 ශ්‍රේණි |

- දේශීය, ජාතික හා ජාත්‍යන්තර තලවල අධ්‍යාපන පද්ධතිවල ඵලජනාය හා අන්තර්කරණීයත්වය වැඩිදියුණු කරනු පිණිස සාක්ෂ්‍ය - පාදක නිර්දේශ යෝජනා කිරීම සඳහා ප්‍රතිපත්ති පර්යේෂණ පැවැත්වීම.
- නව විෂයමාලා ප්‍රතිසංස්කරණවලට අදාළ ව පුහුණුකරුවනට මාර්ගෝපදේශය සහ උපදේශනය හා ද්විභාෂා අධ්‍යාපනය පිළිබඳ ධාරිතා වර්ධන වැඩසටහන් පැවැත්වීම.
- අධ්‍යාපන ක්ෂේත්‍රයේ වෘත්තිකයන් සඳහා දර්ශනපති (අධ්‍යාපන) උපාධියේ සිට සහතික පත්‍ර පාඨමාලා දක්වා පාඨමාලා 20ක් පැවැත්වීම.
- දිවා සුරැකුම් මධ්‍යස්ථානයක් සහිත ආදර්ශ පෙර පාසලක් ස්ථාපිත කිරීමට ගොඩනැගිලි සංකීර්ණයක් සම්පූර්ණ කිරීම.
- NIE Alpha U දෘශ්‍ය ගුවන්විදුලි නාලිකාව වෙනුවෙන් ගුවන්විදුලි අධ්‍යාපන වැඩසටහන් නිෂ්පාදනය කිරීම.
- ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපනය සඳහා භාවිත කළ හැකි ශ්‍රව්‍ය හා දෘශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය.
- විවෘත පාසල් ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ඉගෙනුම්ලාභීන් 1500ක් සඳහා පාඨමාලා තුනක් (සාක්ෂරතා, පදනම් හා ද්විතීයික) පැවැත්වීම.

# 2025/ 2026 අයවැය කාරක සභා අවස්ථාව සඳහා

# ඉදිරිපත් කරනු ලබන

# ප්‍රගති වාර්තාව

## අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව

## හැඳින්වීම

අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව (EPD) පාසල් පෙළපොත් සහ අනෙකුත් අත්‍යවශ්‍ය ඉගෙනුම් ද්‍රව්‍ය සංවර්ධනය, මුද්‍රණය සහ බෙදාහැරීම සඳහා කටයුතු කිරීමෙන් ජාතික අධ්‍යාපන පද්ධතිය තුළ වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන මෙම ආයතනය, රජයේ සහ රජයේ අනුමත පාසල්වල සියලුම සිසුන්ට උසස් තත්ත්වයේ, විෂයමාලාවට අනුකූල ප්‍රකාශන නියමිත වේලාවට ලැබෙන බව සහතික කරන අතර එමඟින් දිවයින පුරා සම සාධාරණ ඉගෙනුම් අවස්ථා සඳහා සහාය වේ.

### පසුබිම් තොරතුරු

1965 මාර්තු 27 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනය මඟින් වෙනම වැය ඒකකයක් ලෙස සහ 1966 සැප්තැම්බර් මස 30 දිනැති අතිවිශේෂ ගැසට් නිවේදනයකින් එවකට පැවති අධ්‍යාපන හා සංස්කෘතික අමාත්‍යාංශය යටතේ කටයුතු කරන දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිස්ථාපනය කෙරිණි.

1965 දී" බී" ශ්‍රේණියේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපනය කළ අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2004. 07. 14 දින සිට අධිශ්‍රේණිගත දෙපාර්තමේන්තුවක් ලෙස ප්‍රතිස්ථාපනය කර දෙපාර්තමේන්තු ප්‍රධාන තනතුරු නාමය අධ්‍යාපන ප්‍රකාශන කොමසාරිස් ජනරාල් ලෙස සංශෝධනය කොට අමාත්‍යාංශයේ අතිරේක ලේකම් තනතුරකට සමාන වන සේ ඉහළ නංවන ලදි.




## 1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, සහ අරමුණු

### ආයතනයේ දැක්ම

**අන්තර්ජාතික අධ්‍යාපනික සංවර්ධනය හා අනුගත වන ඉහළ ගුණාත්මක බවකින් යුතු පෙළපොත් සම්පාදනය කිරීමෙන් සැමට අධ්‍යාපනය ලබා දීම සහතික වීම.**

## ආයතනයේ මෙහෙවර

**රජය මගින් නොමිලේ පෙළපොත් ලබා දීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමෙන් ද අධ්‍යාපන ක්‍රියාවලිය සඳහා අවශ්‍ය සෙසු පෙළපොත්, වැඩපොත්, පරිවර්තන ග්‍රන්ථ, පාරිභාෂික ශබ්දමාලා, අතිරේක කියවීම් පොත්, කෝෂ ග්‍රන්ථ හා ශ්‍රව්‍ය දෘශ්‍ය උපකරණ ඇතුළු අනෙකුත් ආධාරක සම්පාදනය කොට සැපයීමෙන් ද අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීම ඔස්සේ රටට වැඩදායී ගුණවත්, නැණවත් පුරවැසි පිරිසක් බිහිකරලීමට දායක වීම.**

## අරමුණු

අධ්‍යාපනයේ ගුණාත්මක බව වර්ධනය කිරීමෙන් රටට වැඩදායී නැණවත්, ගුණවත් පුරවැසි පිරිසක් බිහි කිරීම

- රජයේ පාසල් හා පිරිවෙන්වල ඉගෙන ගන්නා 1 සිට 11 දක්වා සියලු ම ශ්‍රේණිවල දරුවන් සඳහා අවශ්‍ය වන පාසල් පෙළපොත්/මොඩියුල නොමිලේ ලබා දීම.
- උසස් පෙළ හා විශ්වවිද්‍යාල මට්ටමේ අතිරේක කියවීම් පොත් සම්පාදනය මඟින් පාසල් විෂයමාලාවට අදාළ දැනුම හා අතිරේක දැනුම සිසුන්ට ලබා දීම.
- විෂය නිර්දේශයට අදාළ ඉගෙනුම වඩාත් සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය ඉගෙනුම් ආධාරක සම්පාදනය.
- ප්‍රශ්නෝත්තර පොත් මුද්‍රණය මඟින් ප්‍රසිද්ධ විභාගවලට පෙනී සිටින සිසුන්ට විභාගයට මුහුණ දීම සඳහා සූදානමක් ඇති කිරීම.
- ගුරු මාර්ගෝපදේශ මුද්‍රණය කිරීම හා බෙදා හැරීම මඟින් විෂය නිර්දේශ පිළිබඳ දැනුම ගුරුවරුන් වෙත ලබා දීම.

### 1.3 ප්‍රධාන කාර්යයන්

අංක 14, 715/3 1966 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා දිනැති ලංකාණ්ඩුවේ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් පහත දැක්වෙන කාර්යන් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

- මූලික, ද්විතීයක හා උසස් අධ්‍යාපනයේ භාවිතය උදෙසා සම්මත පොත් පරිවර්තනය කිරීම, ප්‍රසිද්ධ කිරීම, බෙදාහැරීම හා විකිණීම, ප්‍රකාශන හිමිකම් මිලට ගැනීම
- අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය පාඩම් පොත්, පාරිභාෂික ශබ්ද මාලා, කෝෂ ග්‍රන්ථ හා වෙනත් පොත් නිෂ්පාදනය, ප්‍රසිද්ධ කිරීම, බෙදා හැරීම හා විකිණීම

- ශික්ෂණාධාර, ශ්‍රව්‍ය දෘශ්‍ය හා වෙනත් උපකරණ නිෂ්පාදනය, බෙදා හැරීම හා විකිණීම
- කියවන ද්‍රව්‍ය නිෂ්පාදනය උනන්දු කිරීම

## 2.0 2025 වර්ෂය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ( 2025.09.30 දිනට) හා ඉදිරි ක්‍රියාමාර්ග

පාසල් දරුවන් සඳහා ගුණාත්මක ඉගෙනුම් ද්‍රව්‍ය සැපයීමේ අරමුණින්, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව 2025 වර්ෂයේ මුල් කාර්තු තුන තුළ ක්‍රියාත්මක කර ඇති සහ ඉදිරි කාර්තුවේ දී ක්‍රියාත්මක කිරීමට නියමිත වැඩසටහන් පහත දක්වා ඇත.

### 2.1 පෙළපොත් සහ මොඩියුල නිෂ්පාදනය

2026 වර්ෂයේ සිට පාසල් අධ්‍යාපන පද්ධතිය සඳහා නව විෂයමාලාවක් හඳුන්වා දීමට අධ්‍යාපන අමාත්‍යාංශය අවශ්‍ය පියවර ගෙන ඇති අතර, මෙය 1 සහ 6 ශ්‍රේණිවලින් ආරම්භ වේ. මෙම නව විෂය මාලාවේ දී, 1 සහ 6 ශ්‍රේණි සඳහා පෙළපොත් වෙනුවට ජාතික අධ්‍යාපන ආයතනය විසින් සකස් කරන ලද නව ඉගෙනුම් ද්‍රව්‍ය හඳුන්වා දෙනු ලැබේ. ඒ අනුව 2025 දී, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකීම් දරයි.

- දැනට ක්‍රියාත්මක වන විෂයමාලාව මත පදනම්ව 2, 3, 4, 5, 7, 8, 9, 10 සහ 11 ශ්‍රේණි සඳහා පාසල් පෙළපොත් මුද්‍රණය කිරීම.

- නව විෂයමාලාව මත පදනම්ව 1 ශ්‍රේණිය සඳහා ක්‍රියාකාරකම් පොත් සහ 6 ශ්‍රේණිය සඳහා මොඩියුල මුද්‍රණය කිරීම.

- පෙළපොත් හා මොඩියුල හි තත්ත්ව පරීක්ෂාව අධ්‍යාපන පරිපාලන සේවා නිලධාරීන් මඟින් සිදු කිරීම.

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

2,3,4,5,7,8,9,10 සහ 11ශ්‍රේණි සඳහා පෙළපොත් 334 ක් සහ 1 සහ 6 ශ්‍රේණි සඳහා ක්‍රියාකාරකම් පාදක ඉගෙනුම් පොත් සහ මොඩියුල 106 ක්, මුද්‍රණය කිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

වගුව **1.0:** මුද්‍රණය සඳහා ඉදිරිපත් කර ඇති පොත් පිළිබඳ විස්තර

| පොත් වර්ගය | පොත් සංඛ්‍යාව | පිටපත් ගණන |
|---|---|---|
| පෙළපොත් | 334 | 21,966,750 |
| මොඩියුල | 106 | 9,563,700 |

- 2025 වර්ෂය සඳහා මුළු මුද්‍රණ අවශ්‍යතාවෙන් 18% ක් සෘජු ප්‍රසම්පාදනය මඟින් රාජ්‍ය මුද්‍රණ සංස්ථාවට (SPC) පවරා ඇත. ඉතිරි 82% විවෘත තරගකාරී ටෙන්ඩර් ක්‍රියාවලියක් මඟින් රජයේ සහ පෞද්ගලික අංශයේ මුද්‍රණකරුවන් වෙත ද ලබා දී ඇත.
- සෘජු ප්‍රසම්පාදනය යටතේ රාජ්‍ය මුද්‍රණ සංස්ථාව වෙත පවරා ඇති පෙළපොත් 78න් පොත් 42ක් දැනටමත් මුද්‍රණය කර අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ගබඩාව වෙත ලබා දී ඇත. ඉතිරි පෙළපොත් මුද්‍රණය සඳහා සූදානම් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර, 2025 ඔක්තෝබර් 07 දින වන විට නිම කිරීමට අපේක්ෂා කෙරේ.
- විවෘත ටෙන්ඩර් ක්‍රියාවලිය මඟින් ප්‍රදානය කළ පෙළපොත් සඳහා, මූලික මුද්‍රණ කටයුතු ආරම්භ කර ඇති අතර, 2025 නොවැම්බර් 17දින වන විට එය නිම කිරීමට ද අපේක්ෂා කෙරේ.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- සියලුම පෙළපොත්, ක්‍රියාකාරකම් පොත් සහ මොඩියුල මුද්‍රණ කටයුතු නිම කිරීම සහ වසර අවසානයේ දී මුද්‍රණකරුවන් විසින් එම පොත් මධ්‍යම ගබඩා වෙත භාරදීම සහතිකවීම

## 2.2 පෙළපොත් සහ මොඩියුල බෙදාහැරීම

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- පෙළපොත් මධ්‍යම ගබඩාවේ සිට ප්‍රාදේශීය මධ්‍යස්ථානවලට සහ පාසල්වලට බෙදාහැරීම ආරම්භ කර ඇත. මේ වන විට අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ ලොරි රථවලින් පෙළපොත් බෙදාහැරීම සිදුකරන අතර පෙළපොත් බෙදාහැරීමේ ප්‍රතිශතය 1% ක් පමණ වේ.
- පොත් බෙදාහැරීම සඳහා පෞද්ගලික ලොරි රථ කුලී පදනම මත ලබාගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ලංසු ඇගයීම් පියවරෙහි පවතී.
- 2024 වර්ෂය සඳහා පෙළපොත් බෙදාදීමට අදාළ ව පළාත් අධ්‍යාපන නිලධාරින්ට සහ විදුහල්පතිවරුන් සඳහා ලබා දෙන දීමනා වවුචර්පත් මේ වන විට ලැබෙමින් පවතී. එම වවුචර්පත් ගෙවීම් සඳහා යොමු කර ඇත.
- පෙළපොත්/ මොඩියුල ප්‍රාදේශීය මධ්‍යස්ථානවල ගබඩාකිරීම, බෙදාහැරීම, පාසල්වල දී භාවිතය, නැවත භාවිතය සහ පෙළපොත්/මොඩියුල බෙදාහැරීම සඳහා සකස් කර ඇති ස්වයංක්‍රීය පද්ධතිය පිළිබඳව මේ වන විට පළාත් 07ක අදාළ නිලධාරින් 850 ක් පමණ දැනුවත් කිරීම් සිදු කර ඇත.
- පොත් බෙදාහැරීම සඳහා අනියම් සේවක නිලධාරින් බඳවාගැනීම සඳහා අවශ්‍ය පූර්ව කටයුතු සිදුකර ඇත.

## 2.3 බ්‍රේල් පොත් මුද්‍රණය සහ බෙදාහැරීම

**දෘශ්‍යාබාධිත සිසුන්ගේ අවශ්‍යතාවය මත බ්‍රේල් පෙළපොත් බෙදාහැරීම**

බ්‍රේල් පෙළපොත් ඇණවුම් ලේඛනවලට අනුව,

1. 2025 වර්ෂයේ දී දිවයින පුරා අධ්‍යාපනය ලබන දෘශ්‍යාබාධිත සිසු දරුදැරියන් වෙනුවෙන් ලබා දීමට අවශ්‍ය බ්‍රේල් පෙළපොත් පිටපත් සංඛ්‍යාව 11,780 ක් පමණ වේ.
2. බ්‍රේල් පෙළපොත් බෙදාහරින ලද විශේෂ අධ්‍යාපන පාසල් සංඛ්‍යාව 14 කි.
3. කලාප අධ්‍යාපන කාර්යාලය යටතේ පවතින විශේෂ අධ්‍යාපන ඒකක සංඛ්‍යාව 43 කි.
4. බ්‍රේල් පෙළපොත් ඉල්ලුම් කළ දෘශ්‍යාබාධිත සිසුන් සංඛ්‍යාව 371 ක් පමණ වේ.

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- 2025 හා 2026 වර්ෂ සඳහා බ්‍රේල් පොත් මුද්‍රණයට අවශ්‍ය කඩදාසි මිලදී ගැනීම.
- 2025 සහ 2026 වර්ෂ සඳහා බ්‍රේල් පෙළපොත් සහ මොඩියුල මුද්‍රණය කරමින් පවතී.
- බ්‍රේල් පොත් මුද්‍රණය සඳහා දැනට භාවිතයට ගත හැකි එක් බ්‍රේල් මුද්‍රණ යන්ත්‍රයක් පමණක් පවතින අතර, එම යන්ත්‍රය මගින් දිනකට පොත් 30 ක් පමණ මුද්‍රණය කෙරේ.
- බ්‍රේල් පොත් මුද්‍රණ යන්ත්‍රයක් සහ අමතර බැටරියක් (ups එකක්) අලුතින් මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සම්පූර්ණ කර ඇණවුම ලබා දීමට කටයුතු කරමින් පවතී.
- පැරණි බ්‍රේල් පොත් මුද්‍රණ යන්ත්‍ර 02ක් අලුත්වැඩියා කටයුතු සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකරමින් පවතී.
- 2026 වර්ෂයට අදාළ 1 ශ්‍රේණියේ ක්‍රියාකාරකම් පොත් සහ 6 ශ්‍රේණියේ මොඩියුල, බ්‍රේල් පෙළපොත් බවට පරිවර්තනය කිරීම සඳහා අදාළ පරිවර්තකයින් බඳවා ගැනීම සිදුකර ඇත.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- සියලුම බ්‍රේල් පෙළපොත්, ක්‍රියාකාරකම් පොත් සහ මොඩියුල 2025 වර්ෂය අවසන් වීමට ප්‍රථම මුද්‍රණය කර, විශේෂ පාසල් සහ රජයේ පාසල්වල පිහිටුවා ඇති විශේෂ අධ්‍යාපන ඒකක වෙත බෙදාහැරීම.
- නව බ්‍රේල් පොත් මුද්‍රණ යන්ත්‍රය මිලදී ගෙන අදාළ මුද්‍රණාලය තුළ ස්ථාපිත කිරීම.
- පැරණි බ්‍රේල් පොත් මුද්‍රණ යන්ත්‍ර 02ක් අලුත්වැඩියා කර නිම කිරීම.

## 2.4 පොත් අලෙවි ප්‍රවර්ධනය

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන මගින් පාසල් පෙළපොත්, අතිරේක කියවීම් පොත්, පාරිභාෂිත ශබ්දමාලා සහ පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර මිලදී ගැනීමට අවස්ථාව සලසා ඇත.

- මරදාන විද්‍යෝදය පිරිවෙන, ඉසුරුපාය, මහරගම ජාතික අධ්‍යාපන ආයතනය, මීපේ ගුරුපුහුණු මධ්‍යස්ථානය, නාරාහේන්පිට රජවාසල වෙළෙඳ සංකීර්ණය සහ යාපනය මධ්‍ය විද්‍යාලය යන ස්ථානවල දෙපාර්තමේන්තුවේ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන පවත්වා ගෙන යනු ලැබේ.
- අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල රාජකාරි කරන නිලධාරින් සඳහා අදාළ පුහුණුවීම් මෙම වසරේ දී ලබාදී ඇත.
- 2025 වර්ෂය සඳහා සැලසුම් කරන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් 4න් 3ක් ක්‍රියාත්මක කෙරිණි.

  පොත් ප්‍රදර්ශනය - නුවර

  පොත් ප්‍රදර්ශනය - මීරිගම

  පොත් ප්‍රදර්ශනය - BMICH

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවට අයත් අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථානවල අලෙවිය සංවර්ධනය සඳහා කටයුතු කිරීම.

## 2.5 අතිරේක කියවීම් පොත් සම්පාදනය

පහත සඳහන් අතිරේක කියවීම් පොත් මේවන විට සම්පාදනය කරමින් පවතී.

- සම්භාවිතාව හා සංඛ්‍යානය (සි)
- අ.පො.ස. (උ/පෙළ) අනුක්‍රම හා ශ්‍රේණි අතිරේක ග්‍රන්ථය (ඉ)
- පාසල්වල අතිරේක පොත් අවශ්‍යතාව පිළිබඳ සමීක්ෂණය
- අ.පො.ස. (උ/පෙළ) ජීව විද්‍යාව ව්‍යවහාරික ජීව විද්‍යාව
- අ.පො.ස. (උ/පෙළ) ජීව විද්‍යාව (ජීව විද්‍යාව හැඳින්වීම) (ඉ)
- අ.පො.ස. (උ/පෙළ) ජීව විද්‍යාව පරිණාමය හා ජීවීන්ගේ විවිධත්වය
- අ.පො.ස. (උ/පෙළ) ජීව විද්‍යාව (ජීව විද්‍යාව හැඳින්වීම) (ඉ)
- අ.පො.ස. (උ/පෙළ) ජීව විද්‍යාව (ප්‍රවේණිය හා අණුක ජීව විද්‍යාව)

පහත සඳහන් අතිරේක කියවීම් පොත් මේ වන විට සම්පාදනය කර ඇති අතර, මුද්‍රණ කටයුතු සිදුකිරීමට නියමිතයි.

- නිෂ්පාදනය, පිරිවැය හා වෙළෙඳපොල ආකෘති
- පුරාතන පද්‍ය ගුත්තිල කාව්‍ය, පුරාතන ගද්‍ය නිර්දිෂ්ය කෙටි කතා

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

දැනට සම්පාදිත අතිරේක කියවීම් පොත් මුද්‍රණය කර, අලෙවිය සඳහා ඉදිරිපත් කිරීම

දැනට ලියමින් පවතින අතිරේක කියවීම් පොත් සම්පාදනය කර අවසන් කිරීම.

## 2.6 තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සංවර්ධන වැඩසටහන්

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- ලෝක බැංකු ණය ආධාර යටතේ ක්‍රියාත්මක වන සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය (General Education Modernization Project – GEMP) යටතේ ක්‍රියාත්මක වූ වැඩසටහනක් ලෙස අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ සියලුම කාර්යන් ඵලදායී ව හා කාර්යක්ෂම ව සිදුකර ගැනීම සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් (Automated System) සකස් කර ඇත.
- පොත් සම්පාදනයේ සිට පාසල් දක්වා බෙදාහැරීමේ ක්‍රියාවලි ඩිජිටල්කරණය කරන අතර, මේ වන විට ස්වයංක්‍රීය පද්ධතියේ 90% ක පමණ කාර්යන් නිම කොට දත්ත ඇතුළත් කිරීම සඳහා කටයුතු යොදා ඇත.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ දැනට පවතින වෙබ් පිටුව (Web – Site) අක්‍රීය තත්ත්වයේ පවතින බැවින්, නව වෙබ් අඩවියක් සකස් කිරීම සඳහා මූලික පියවර ගෙන ඇත.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- 2025 වර්ෂයේ අවසානය වන විට ස්වයංක්‍රීය පද්ධතිය 100% කින් නිම කර, අදාළ කාර්යයන් සඳහා යොදා ගැනීමට අවශ්‍ය කටයුතු ඉටු කිරීම.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවිය සකස් කර නිම කිරීම.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා In- design මෘදුකාංගය මිලදී ගැනීම.

## 2.7 ධාරිතා සංවර්ධන වැඩසටහන්

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- බෙදාහැරීම් අංශයේ නිලධාරින් සහ අලෙවි ප්‍රවර්ධන අංශයේ නිලධාරින් සඳහා එක් ධාරිතා සංවර්ධන වැඩසටහනක් බැගින් ක්‍රියාත්මක කර ඇත.
- හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව, අදාළ පරිදි සියලු ම අංශයන්හි නිලධාරින් පුහුණුව සඳහා යොමු කර ඇත.
- පෙළපොත් සම්පාදනය කරන සියලුම මාණ්ඩලික නිලධාරින් In-design මෘදුකාංගය යොදා ගැනීම පිළිබඳව පුහුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසුම් කර ඇත. නිපුණතා පියස මගින් මෙම කාර්යය ඉටුකර ගැනීම සඳහා පුහුණු කිරීමට අදාළ ව යෝජනාවලියක් සහ මිලගණන් කැඳවීමක් සිදු කර ඇත.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

නිෂ්පාදන, ප්‍රකාශන හා බෙදාහැරීම් අංශයේ සියලුම නිලධාරීන් රාජකාරි කටයුතු පිළිබඳව පුහුණු කිරීමේ වැඩමුළුවක් පැවැත්වීම.
සියලුම මාණ්ඩලික නිලධාරීන් In- design මෘදුකාංගය යොදාගැනීම පිළිබඳව පුහුණු කිරීම.
හඳුනාගත් පුහුණු අවශ්‍යතා අනුව, නිලධාරීන් අදාළ පුහුණු පාඨමාලා වෙත යොමු කිරීම.
භාණ්ඩ සමීක්ෂණ කටයුතු හා බඩු වට්ටෝරු පොත් පවත්වාගැනීම පිළිබඳව පුහුණු වැඩමුළුවක් පැවැත්වීම.

## 2.8 මේ වන විට ක්‍රියාත්මක වන වෙනත් වැඩසටහන්

- නිර්මාණාත්මක කතන්දර ලිවීමේ තරඟය (ඉංග්‍රීසි)
- පාසල්වල අතිරේක පොත් අවශ්‍යතාවය පිළිබඳ සමීක්ෂණය

## 2.9 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සහ ඊට අනුබද්ධ අංශවල යටිතල පහසුකම් සංවර්ධනය

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ අංශ, ගබඩා සහ අලෙවි ප්‍රවර්ධන මධ්‍යස්ථාන සඳහා කාර්යාල උපකරණ හා ලී බඩු මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය සිදුකරමින් පවතියි.
- පිටිපන පිහිටි A, B, C යන ගබඩා තුනෙහිම අත්‍යවශ්‍ය නඩත්තු සහ අලුත්වැඩියා කටයුතු සිදුකිරීම සඳහා ඇස්තමේන්තු සකසා නිමකර ඇති අතර ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- පිටිපන A, B, C යන ගබඩා තුනෙහි CCTV කැමරා පද්ධති සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සහ සැලැස්ම සකස් කර නිම කර ඇති අතර, ප්‍රසම්පාදන ක්‍රියාවලිය ආරම්භ කර ඇත.
- යන්ත්‍රෝපකරණවල නඩත්තු සේවා සඳහා අදාළ පරිදි ආයතන සමඟ ගිවිසුම් ගත වී ඇත.
- අත්‍යවශ්‍ය වාහන අලුත්වැඩියා කටයුතු සිදු කර ඇත.
- අලෙවි මධ්‍යස්ථාන ස්ථාපිත කර ඇති ගොඩනැගිලි සඳහා අදාළ මාසික කුලී මෙම වසර සඳහා ගෙවා ඇත.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- උක්ත සඳහන් ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ පවතින සියලුම කාර්යයන් ක්‍රියාත්මක කර නිම කිරීම.
- ඉදිරියේ දී ඇතිවන වාහන, ගොඩනැගිලි සහ යන්ත්‍රෝපකරණ නඩත්තු කාර්යයන් ක්‍රියාත්මක කිරීම.

## සැලසුම්කරණය සහ නියාමනය

**2025 සැප්තැම්බර් 30 දක්වා ප්‍රගතිය:**

- 2025 වර්ෂයේ වාර්ෂික අයවැය ප්‍රතිපාදන අනුව, 2025 වර්ෂයේ සමස්ත සැලැස්ම සකස් කර ක්‍රියාත්මක කිරීම.
- 2026 වර්ෂයේ වාර්ෂික සැලැස්මේ කෙටුම්පත සකස් කිරීම හා ඒ අනුව 2026 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව සකස්කර මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කර ඇත.
- 2026 – 2030 කාලය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව වෙත අවදානම් කළමනාකරණ රාමුව සකස් කර ඇත.
- 2026 – 2030 කාලය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මධ්‍යකාලීන ක්‍රමෝපායික සැලැස්ම කෙටුම්පත් කර ඇත.
- 2026 – 2028 කාලරාමුව සඳහා ප්‍රධාන කාර්යසාධක දර්ශක හඳුනා ගනිමින්, නියාමන හා ඇගයීම් රාමුවක් කෙටුම්පත් කර ඇත.

- කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම නියාමනය හා ප්‍රතිපෝෂණය ලබා දීම සඳහා කටයුතු කර ඇත.

**2025 වසර අවසානයේ දී අපේක්ෂිත කාර්යසාධනය:**

- 2026 -2030 කාලය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ මධ්‍යකාලීන ක්‍රමෝපායික සැලැස්ම සකස් කර නිම කිරීම.
- මධ්‍යකාලීන ක්‍රමෝපායික සැලැස්මට සමගාමීව, 2026 – 2030 වර්ෂ සඳහා නියාමන හා ඇගයීම් රාමුවක් සකස්කිරීම.
- අනුමත අයවැය ප්‍රතිපාදන මත 2026 වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම සකස් කිරීම.
- ඉදිරි කාර්තුවේ වාර්ෂික ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම නියාමන සහ අදාළ පරිදි ප්‍රතිපෝෂණ සැපයීම.

## 3.0 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ වාර්ෂික සැලැස්මේ මූල්‍ය ප්‍රගතිය

## (2025.09.30 දින දක්වා)

**ශීර්ෂ - 126, 213 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව**
**මාසික වියදම් වාර්තාව- 2025**

රු.ශත.

| වැය ශීර්ෂ ය | වැය විෂය අංකය | වෙන් වී ඇති ප්‍රතිපාදනය පිළිබඳ වැය විස්තරය | වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය | සමුච්චිත එකතුව 2025.09.30 | ඉතිරිය | වියදමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| **126** | **පුනරාවර්තන වියදම්** | | **15,500,000,000.00** | **1,787,010,851.88** | **13,712,989,148.12** | **11.53** |
| **213** | | | **115,000,000.00** | **68,465,448.74** | **46,534,551.26** | 59.54 |
| | | **පුද්ගල පඩිනඩි** | | | | |
| 213 | 1001 | වැටුප් හා වේතන | 36,000,000.00 | 32,454,739.96 | 3,545,260.04 | 90.15 |
| 213 | 1002 | අතිකාල හා නිවාඩු දින වැටුප් | 3,000,000.00 | 1,440,479.25 | 1,559,520.75 | 48.02 |
| 213 | 1003 | වෙනත් දීමනා | 27,000,000.00 | 16,428,326.56 | 10,571,673.44 | 60.85 |
| | | **ගමන් වියදම්** | | | | |
| 213 | 1101 | දේශීය | 1,500,000.00 | 585,552.00 | 914,448.00 | 39.04 |
| | | **සැපයීම්** | | | | |
| 213 | 1201 | ලිපිද්‍රව්‍ය හා කාර්යාලීය අවශ්‍යතා | 7,000,000.00 | 1,608,403.34 | 5,391,596.66 | 22.98 |
| **213** | **1202** | **ඉන්ධන** | **10,000,000.00** | **5,630,331.09** | **4,369,668.91** | **56.30** |
| 213 | 1202-002 | ඉන්ධන දීමනාව | 2,000,000.00 | 1,468,978.39 | 531,021.61 | 73.45 |
| 213 | 1202-009 | සංචිත වාහන සඳහා ඉන්ධන | 6,000,000.00 | 3,948,025.00 | 2,051,975.00 | 65.80 |
| 213 | 1202-010 | වෙනත් කටයුතු සඳහා ඉන්ධන | 2,000,000.00 | 213,327.70 | 1,786,672.30 | 10.67 |
| 213 | 1203-002 | නිල ඇඳුම් | 50,000.00 | 44,000.00 | 6,000.00 | 88.00 |
| | | **නඩත්තු වියදම්** | | | | |
| 213 | 1301 | වාහන | 6,200,000.00 | 1,988,065.89 | 4,211,934.11 | 32.07 |
| 213 | 1302 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 3,000,000.00 | 455,789.88 | 2,544,210.12 | 15.19 |
| 213 | 1303 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 1,000,000.00 | 183,780.00 | 816,220.00 | 18.38 |
| 213 | 1304 | මෘදුකාංග නඩත්තු | 200,000.00 | 0.00 | 200,000.00 | 0.00 |

| | | | | | | රු.ශත. |
|---|---|---|---|---|---|---|
| වැය ශීර්ෂය | වැය විෂය අංකය | වෙන් වී ඇති ප්‍රතිපාදනය පිළිබඳ වැය විස්තරය | වෙන් වී ඇති ප්‍රතිපාදන ප්‍රමාණය | සමුච්චිත එකතුව | ඉතිරිය | වියදමේ ප්‍රතිශතය |
| | | <u>සේවා</u> | | | | |
| 213 | 1401 | ප්‍රවාහන | 2,500,000.00 | 1,716,071.43 | 783,928.57 | 68.64 |
| 213 | 1402 | තැපැල් හා සන්නිවේදන | 2,000,000.00 | 1,063,110.23 | 936,889.77 | 53.16 |
| 213 | 1403 | විදුලිය හා ජලය | 6,000,000.00 | 654,881.30 | 5,345,118.70 | 10.91 |
| 213 | 1404 | බදු කුලී සහ පළාත් පාලන ආයතන බදු | 200,000.00 | 6,422.76 | 193,577.24 | 3.21 |
| 213 | 1407 | ආරක්ෂක සේවා | 4,450,000.00 | 1,569,823.57 | 2,880,176.43 | 35.28 |
| **213** | **1409** | **වෙනත් දීමනා** | **3,400,000.00** | **1,852,759.03** | **1,547,240.97** | **54.49** |
| 213 | 1409-138 | යන්ත්‍ර හා කාර්යාල උපකරණ සේවා ගිවිසුම් | 2,500,000.00 | 1,342,587.10 | 1,157,412.90 | 53.70 |
| 213 | 1409-139 | වාහන රක්ෂණය | 400,000.00 | 189,346.93 | 210,653.07 | 47.34 |
| 213 | 1409-140 | විවිධ සේවා වියදම් | 500,000.00 | 320,825.00 | 179,175.00 | 64.17 |
| | | <u>මාරු කිරීම්</u> | | | | |
| 213 | 1506 | රජයේ සේවකයින් සඳහා දේපළ ණය පොළී | 1,500,000.00 | 782,912.45 | 717,087.55 | 52.19 |
| 126 | 1501 | පෙළපොත් මුද්‍රණය හා බෙදාහැරීම | 15,500,000,000.00 | 1,787,010,851.88 | 13,712,989,148.12 | 11.53 |
| | | <u>මූලධන වියදම්</u> | 59,733,005.00 | 10,931,602.57 | 48,801,402.43 | 18.30 |
| | | <u>මූලධන වියදම් පුනරුත්තාපනය හා වැඩිදියුණු කිරීම</u> | | | | |
| 213 | 2001 | ගොඩනැගිලි හා ඉදිකිරීම් | 17,500,000.00 | 0.00 | 17,500,000.00 | 0.00 |
| 213 | 2003 | වාහන | 3,000,000.00 | 1,159,182.57 | 1,840,817.43 | 38.64 |
| | | <u>මූලධන වත්කම් අත්පත් කර ගැනීම</u> | | | | |
| 213 | 2102 | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,800,000.00 | 0.00 | 1,800,000.00 | 0.00 |
| 213 | 2103 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 21,200,000.00 | 0.00 | 21,200,000.00 | 0.00 |
| 213 | 2106 | මෘදුකාංග සංවර්ධනය | 500,000.00 | 0.00 | 500,000.00 | 0.00 |
| | | <u>හැකියා වර්ධන</u> | | | | |
| 213 | 2401 | කාර්ය මණ්ඩල පුහුණු | 1,000,000.00 | 306,410.00 | 693,590.00 | 30.64 |
| 213 | 2509 | වෙනත් දීමනා | 14,733,005.00 | 9,466,010.00 | 5,266,995.00 | 64.25 |
| | | මුළු එකතුව | 15,674,733,005.00 | 1,866,407,903.19 | 13,808,325,101.81 | 89.37 |

## 4.0 ඉදිරි ගමන් මඟ : 2026 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

- 2027 වර්ෂයේ 3,4,5,8,9,10,11 ශ්‍රේණි සඳහා පෙළපොත් මුද්‍රණය කර පාසල් හා ප්‍රාදේශීය පෙළපොත් මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීම.
- 2027 වර්ෂයේ 1,2 ශ්‍රේණි සඳහා ක්‍රියාකාරකම් පොත් සහ 6,7 ශ්‍රේණි සඳහා මොඩියුල මුද්‍රණය කර පාසල් හා ප්‍රාදේශීය පෙළපොත් මධ්‍යස්ථාන සඳහා බෙදාහැරීම.
- අතිරේක කියවීම් පොත් සම්පාදනය, මුද්‍රණය සහ අලෙවි මධ්‍යස්ථාන වෙත බෙදාහැරීම.
- නව විෂය නිර්දේශයට අදාළ ගුරු මාර්ගෝපදේශ මුද්‍රණය සහ පාසල් වෙත බෙදාහැරීම.
- දෘශ්‍යාබාධිත සිසුන්ට අවශ්‍ය බ්‍රේල් පෙළපොත්, ක්‍රියාකාරකම් හා මොඩියුල සම්පාදනය සහ බෙදාහැරීම.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවේ පිටිපන පිහිටි මධ්‍යම ගබඩා තුනෙහි අලුත්වැඩියා කටයුතු සිදුකිරීම.
- අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය ලී බඩු සහ යන්ත්‍රෝපකරණ මිලදී ගැනීම.

## ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

**විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය**

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ප්‍රසිද්ධ විභාග පැවැත්වීම සම්බන්ධව නෛතික බලතල ඇති එකම ආයතනය බවට පත්විය. එදින සිට මේ දක්වා විභාග දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වඩාත් පුළුල් වී ඇත.

විභාග දෙපාර්තමේන්තුව රහස්‍යභාවය, නිවරදිතාවය, සර්ව සාධාරණ බව, ඒකාග්‍රතාවය සහ වගවීම යන වටිනාකම් පාදක කොටගෙන ජාතික මෙහෙවරක් ඉටුකෙරෙන ආයතනයකි.

අ.පො.ස (උසස් පෙළ), අ.පො.ස (සාමාන්‍ය පෙළ), 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය සහ සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය මෙම දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන ප්‍රධාන පාසල් විභාග වේ. ඊට අමතරව දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විභාග පහත පරිදි වර්ග කළ හැකිය.

- බඳවා ගැනීමේ විභාග
- සහතික පත්‍ර විභාග
- කාර්යක්ෂමතා කඩඉම් විභාග
- උසස් කිරීමේ විභාග
- ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා අවසාන පරීක්ෂණය
- ගුරු විද්‍යාල අවසාන විභාගය

වසරක් පාසා ලක්ෂ සංඛ්‍යාත විභාග අපේක්ෂකයින් පිරිසක් සඳහා වඩාත් නිවැරදිව රහස්‍යභාවය සුරකිමින් සාධාරණ ලෙස විභාග පවත්වා ප්‍රතිඵල ලබාදීම තුළින් සිසුන්ගේ අනාගත අපේක්ෂා සඳහා මාර්ග විවර කරදීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන වගකීම වේ.

විභාග පරිපාලනය සඳහා කාර්ය මණ්ඩල ලෙස ලක්ෂ දෙකකට අධික ගුරුවරු සහ විදුහල්පතිවරු විභාග ක්‍රියාවලිය හා සම්බන්ධ වී විභාග පරිපාලන රාජකාරි ඉටුකරති.

විභාග පරිපාලනය වඩාත් ඵලදායි හා කාර්යක්ෂම කිරීම උදෙසා විභාග කාර්ය මණ්ඩලය සඳහා සුදුසුකම් ඇති පුද්ගලයන්ගේ සංචිතයක් පිහිටුවා ඔවුන්ට විධිමත් පුහුණුවක් ලබාදීමේ වැඩපිළිවෙලක් විභාග දෙපාර්තමේන්තුව නිරන්තරයෙන් ක්‍රියාත්මක කර ඇත. එම සංචිතය මගින් විභාග පරිපාලන කාර්ය මණ්ඩලය පත්කර ගැනීම මගින් විභාග පැවැත්වීමේදී උද්ගතවිය හැකි ගැටළු අවම කර ගැනීමට හැකි වී ඇත.

නූතන අවශ්‍යතා අනුව වඩාත් නිවැරදිවත්, කාර්යක්ෂමවත් තම කාර්යභාරය ඉටුකිරීම සඳහා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් විභාග අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් කැඳවීම,විභාග ප්‍රවේශපත්‍ර බාගත කර ගැනීමට පහසුකම් සැපයීම, උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගෙන් අයදුම්පත් කැඳවීම, නැවත සමීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවීම, විභාග ප්‍රතිඵල බාගත කර ගැනීමට විදුහල්පතිවරුන්ටත්, පෞද්ගලික අයදුම්කරුවන්ටත් අවස්ථාව ලබාදීම වැනි විභාග චක්‍රයේ ක්‍රියා පිළිවෙලෙහි ඇතැම් පියවර ඩිජිටල්කරණය කර ඇත. අඩු කාලයකින් නිවැරදිව එම කාර්යයන් ඉටුකර ගත හැකි ලෙස එම ක්‍රියාවලීන් සංවර්ධනය කර ඇති අතර, මින් ඉදිරියටද දෙපාර්තමේන්තුව එම ඩිජිටල්කරණ ක්‍රියාවලිය අඛණ්ඩව සිදුකිරීමට අපේක්ෂා කරයි.

විභාග පැවැත්වීමේදී විශේෂ අවශ්‍යතා සහිත පාසල් අයදුම්කරුවන්ට සහන සැලසීමටද විභාග දෙපාර්තමේන්තුව කටයුතු කරයි. ඒ සඳහා විදුහල්පතිවරු මාර්ගයෙන් අයදුම්පත් කැඳවා එම විභාග අපේක්ෂකයින් හට සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සහන නිර්දේශ කොට අදාළ මධ්‍යස්ථානයේ ශාලාධිපතිවරු දැනුවත් කිරීම මගින් එම සහන ලබාදීම සිදුකරයි.

දේශීය හා විදේශීය අවශ්‍යතා සඳහා විභාග සහතික පත්‍ර නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබන ප්‍රධාන කාර්යයක් වන අතර, මේ වන විට මාර්ගගත ක්‍රමය හා විද්‍යුත් තැපැල මගින් සහතික පත් නිකුත් කිරීම ප්‍රවර්ධනය වී ඇත. සාමාන්‍යයෙන් දිනකට දහසකට අධික පිරිසක් මෙම සේවාවන් ලබා ගනිති. තවද, රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයින්ගේ විභාග ප්‍රතිඵල සනාථ කිරීමද දෙපාර්තමේන්තුව මගින් සිදුකරනු ලබයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විභාග පැවැත්වීමට පමණක් සීමා නොවී පාසල් පද්ධතිය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා වැඩකටයුතු රාශියක් සිදුකරයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ අනුව හෝ නව විෂයයන් හඳුන්වාදීමේදී හෝ විෂය නිර්දේශ සංශෝධනය කිරීමේ දී හෝ ඊට අනුකූලව ප්‍රශ්න පත්‍ර ව්‍යුහය තීරණය කර මූලාකෘති ප්‍රශ්න සකස් කර ඒ පිළිබඳව පාසල් පද්ධතිය දැනුවත් කොට සිසුන් විභාගයට සූදානම් කිරීම සඳහා පාසල් ප්‍රජාව දැනුවත් කිරීමද සිදුකරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්මේන්තුව පාසල් අධ්‍යාපනයේ සංවර්ධනය උදෙසා අ.පො.ස (උසස් පෙළ), අ.පො.ස (සාමාන්‍ය පෙළ) හා 5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය වැනි ජාතික මට්ටමේ විභාගවල සිසු සාධනය සම්බන්ධයෙන් පළාත් සහ කලාප මට්ටමින් විශ්ලේෂණ වාර්තා සකස් කර ඒවා පාසල් පද්ධතිය වෙත බෙදා හැරීම මගින් සිසුන්ගේ ප්‍රබලතා හා දුර්වලතා හඳුනාගෙන ඒ අනුව සංවර්ධන වැඩසටහන් සැලසුම් කිරීමට අධ්‍යාපන කලාපවල නිලධාරින්ට තොරතුරු සපයයි. අ.පො.ස (උසස් පෙළ) හා අ.පො.ස (සාමාන්‍ය පෙළ)විභාගවල තෝරාගත් විෂයයන් සඳහා ඇගයීම් වාර්තා සකස් කර ඒවා පාසල්වලට ලබාදීම මගින් ගුරුවරුන්ට ඉගැන්වීම සඳහාත් සිසුන්ට පිළිතුරු ලිවීම සඳහාත් මගපෙන්වීම සිදුකරයි.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ආයතනික විභාග පැවැත්වීමද ප්‍රශස්ත ආකාරයට සිදුකර ඇති අතර, විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම තුළින් මහජන විශ්වාසය ඉතා ඉහළ මට්ටමෙන් දිනාගත් රාජ්‍ය ආයතනයක් බවට පත්ව ඇත.

සියළුම අභියෝග වලට සාර්ථකව මුහුණ දෙමින් ඉදිරියේදී ද, විශ්වසනීයතාව හා රහස්‍යභාවය සුරකිමින් ඉතා නිවැරදිව විභාග ක්‍රමවේද නවීකරණය කරමින් විභාග පැවැත්වීම තුළින් සිසු දරුවන්ට, රාජ්‍ය සේවයට ඇතුළත්වීමට අපේක්ෂා කරන විභාග අපේක්ෂකයින්ට හා මහජනතාවට වඩාත් ඵලදායි සේවාවක් සැපයීම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ අභිලාෂයයි.

## 02. "පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන/ ක්‍රියාත්මක කිරීමට නියමිත කාර්යයන්

"පොහොසත් රටක් ලස්සන ජීවිතයක්" යන රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය අනුව ශ්‍රී ලංකාවේ අධ්‍යාපන ක්ෂේත්‍රයේ ප්‍රතිසංස්කරණ රැසක් සිදුකිරීමට සැලසුම් සකස් කර ඇත. එම ප්‍රතිසංස්කරණවලට අනුගත වෙමින් ජාතික විභාග සඳහා ප්‍රතිසංස්කරණ හඳුන්වාදීමට ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව කටයුතු සිදුකරමින් පවතී. රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව පහත සඳහන් ඉලක්ක ළඟාකර ගැනීමට අපේක්ෂා කරයි.

| අනු. අංකය | ඉලක්කය (රජයේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුකූලව) |
|---|---|
| 1 | සියලු තාක්ෂණික හා භෞතික යටිතල පහසුකම් සහිත ජාතික ඇගයීම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම. |
| 2 | ජාතික විභාග ඇගයීම් කටයුතු මාසයක් ඇතුළත අවසන් කර මාස දෙකක් ඇතුළත ප්‍රතිඵල ලබා දීම සහතික කිරීම සඳහා වාර්ෂික පාසල් දින දර්ශනයක් සඳහා පහසුකම් සැලසීම |
| 3 | විභාග ඇගයීම් ක්‍රියාවලියට සම්බන්ධ වන පරීක්ෂකවරුන්ගේ බුද්ධිමය දායකත්වය පිළිබිඹු කරන ගෙවීම් ක්‍රමයක් හඳුන්වා දීම මේ යටතේ පරීක්ෂකවරුන් පමණක් නොව විභාගවලට බුද්ධිමය දායකත්වය ලබාදෙන සියළු පාර්ශව වෙත ගෙවීම් යාවත්කාලීන කොට ලබාදීම. |
| 4 | නවවන ශ්‍රේණියේ දී පැවැත්වීමට නියමිත ජාතික මට්ටමේ භාෂා හා ගණිතමය සාක්ෂරතාවය පිළිබඳ කුසලතා පරීක්ෂණය නියමිත ප්‍රමිතීන්ට අනුව පැවැත්වීම සහතික කිරීම සඳහා තාක්ෂණික උපදෙස් හා මෙහෙයුම් කටයුතු සඳහා අවශ්‍ය සහාය ලබා දීම. |

## 03. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 2025.01.01 දින සිට 2025.09.30 දින දක්වා වන ප්‍රගතිය

### 3.1 පාසල් විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම

රට තුළ පැවති කොවිඩ් 19 තත්වය හේතුවෙන් හා ඉන් අනතුරුව පැවති ආර්ථික හා සාමාජීය අර්බුධ හමුවේ එක් එක් වර්ෂයන්හි පැවැත්වීමට නියමිතව තිබූ ජාතික මට්ටමේ විභාග සැලසුම් කළ පරිදි පැවැත්වීමට නොහැකි වූ අතර, 2024 වර්ෂයට අදාළ විභාග 2025 වර්ෂයේදීපවත්වන ලද අතර, 2025 වර්ෂයේ පැවැත්වීමට නියමිත අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගය2026 වර්ෂයේදීද පැවැත්වීමට නියමිතය.

**අ. පො. ස (උසස් පෙළ) විභාගය - 2024 (2025)**

- විභාගය පැවැත්වූ දිනය - 2024.11.25 සිට 2024.12.20 දක්වා
- ප්‍රතිඵල නිකුත් කළ දිනය - 2025.04.26
- විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් ගණන - 274,361
- විභාගය සමත් අපේක්ෂකයින් ගණන - 177,588

| | අයදුම්කරුවන් සංඛ්‍යාව | | | | මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|---|
| | පාසල් | | පෞද්ගලික | | සංඛ්‍යාව | ප්‍රතිශතය |
| | ගැහැණු | පිරිමි | ගැහැණු | පිරිමි | | |
| විෂයන් 03 ක් සඳහා පෙනී සිටි අයදුම්කරුවන් සංඛ්‍යාව | 134,900 | 87,874 | 32,270 | 19,317 | 274,361 | - |
| විශ්ව විද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමට අවශ්‍ය අවම සුදුසුකම් ලැබූ සංඛ්‍යාව | 97,045 | 53,243 | 18,486 | 9,146 | 177,920 | 53.96% |

***අ. පො. ස (සාමාන්‍ය පෙළ) විභාගය - 2024 (2025)***

විභාගය පැවැත්වූ දිනය - 2025.03.17 සිට 2025.03.26
ප්‍රතිඵල නිකුත් කළ දිනය - 2025.07.11
විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් ගණන - 425,155
ගණිතය හා සිංහල ඇතුළුව විෂයන් 6 ක් සමත් අපේක්ෂකයින් ගණන - 223,944
උසස් පෙළ සඳහා සුදුසුකම් ලැබූ අපේක්ෂකයින් ගණන (ගණිතය හෝ සිංහල ඇතුළුව සම්මාන 3ක් සහිතව විෂයන් 5ක් සමත්) - 245,735

**5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය - 2025**

විභාගය පැවැත්වූ දිනය - 2025.08.10
ප්‍රතිඵල නිකුත් කළ දිනය - 2025.09.03
විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් ගණන - 303,670
විභාගය සමත් අපේක්ෂකයින් සංඛ්‍යාව - 51,969

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2023,2024 (2025)**

| | | |
|---|---|---|
| විභාගය පැවැත්වූ දිනය | - | 2025.03.03 |
| ප්‍රතිඵල නිකුත් කළ දිනය | - | 2025.08.26 |
| විභාගය සඳහා පෙනී සිටි අපේක්ෂකයින් ගණන | - | 235,038 |

**ආයතනික විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම - ප්‍රගතිය (2025.01.01 සිට 09.30 දක්වා)**

| විභාග වර්ගය | පැවැත්වූ විභාග සංඛ්‍යාව | ප්‍රතිඵල නිකුත් කළ විභාග සංඛ්‍යාව |
|---|---|---|
| බඳවා ගැනීමේ විභාග | 29 | 31 |
| සහතික පත්‍ර විභාග | 12 | 10 |
| කාර්යක්ෂමතා කඩඉම් විභාග | 24 | 28 |
| උසස් කිරීමේ විභාග | 06 | 01 |
| වෙනත් විභාග | - | 07 |
| **එකතුව** | **71** | * |

** 2024 වර්ෂයේදී පැවැත්වූ විභාග කිහිපයක ප්‍රතිඵල 2025 වර්ෂයේදී නිකුත් කර ඇත.*

**3.3 සහතික පත්‍ර නිකුත් කිරීම (මුල් පිටපත් හා දෙවන පිටපත්) හා විභාග ප්‍රතිඵල සනාථ කිරීම**

| සේවා | සංඛ්‍යාව |
|---|---|
| **සහතික පත්‍ර නිකුත් කිරීම** | **227,980** |
| එක්දින සේවය | 104,945 |
| සාමාන්‍ය සේවය | 968 |
| මාර්ගගත සේවය | 122,067 |
| **ප්‍රතිඵල සනාථ කිරීම** | **25,978** |
| රාජ්‍ය | **18,609** |
| පෞද්ගලික | **7,369** |
| **විභාග අංක සෙවීම** | **5,402** |

**3.4 ධාරිතා සංවර්ධන වැඩසටහන්**

- අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලැබූ වැඩසටහනකට අනුව මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින් 15 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය මගින් මෙහෙයවනු ලබන "Advanced Certificate Course in Monitoring & Evaluation " පාඨමාලාව සඳහා යොමු කරන ලදී.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරින්,තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරින්, සංවර්ධන නිලධාරින් සහ කළමනාකරණ සේවා නිලධාරින් 35 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මගින් මෙහෙයවනු ලැබූ "Digital Empowerment for Administrative Excellence"පරිගණක පාඨමාලාව සඳහා යොමු කරන ලදී.

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා නිලධාරින්ගේ හා සංවර්ධන නිලධාරින්ගේ පරිගණක භාවිත කුසලතා ඔප් නැංවීමේ අරමුණින් නිලධාරින් 40 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය මගින් මෙහෙයවනු ලැබූ“Advanced Office Applications & Google Workspace Tools” පුහුණු පාඨමාලාව සඳහා යොමු කරන ලදී.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ තනතුරුවල සේවයේ නියුතු නිලධාරින්ගේ කාර්යක්ෂමතා කඩඉම් විභාග සඳහා සහය දැක්වීමේ අරමුණින් මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යය පටිපාටික රීති ඇතුළත් පාඨමාලා 02 ක් සංවිධානය කරනු ලැබීය.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සේවා සහ සංවර්ධන නිලධාරින් 34 කින් යුතු කණ්ඩායමක් සඳහා, ශ්‍රී ලංකා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ සම්පත් දායකත්වයෙන් යුතුව ''විශ්‍රාම වැටුප් ක්‍රියාවලිය'' සම්බන්ධයෙන් පුහුණු වැඩමුළුවක් සංවිධානය කරන ලදී.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ නිලධාරින්ගේ රාජ්‍ය වත්කම් කළමනාකරණය සම්බන්ධ දැනුම වර්ධනය කිරීමේ අරමුණින් මාණ්ඩලික නිලධාරින් හා කළමනාකරණ සේවා නිලධාරින් 6 කින් සමන්විත කණ්ඩායමක් “රාජ්‍ය වත්කම් කළමනාකරණය” පිළිබඳ පුහුණු වැඩමුළුවකට යොමු කරන ලදී.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රවාහන අංශයේ සේවයේ නියුතු රියදුරු මහතුන්ගේ විනයානුකූලව හා ආරක්ෂිකව රිය පැදවීමේ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා රියදුරු මහතුන් 07 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් ''ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය'' මගින් මෙහෙයවනු ලබන “විනයානුකූල ආරක්ෂිත රිය පැදවීම” නම් පුහුණු පාඨමාලාවට යොමු කර පුහුණුව ලබා දෙන ලදී.

- ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මුද්‍රණ සේවයේ නියුතු මුද්‍රණ නිමැවුම්කරුවෙකු ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් සංවිධානය කරනු ලබන “Book Binding & Finishing”පාඨමාලාව සඳහා සම්බන්ධ කරනු ලැබීය.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග ක්‍රියාවලිය ISO 9001 ප්‍රමිතීන්ට අනුව ප්‍රමිතිකරණය කිරීමේ අරමුණින්, එහි මූලික පියවරක් ලෙස දෙපාර්තමේන්තු නිලධාරින් 80 දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් සඳහා ප්‍රමිති ආයතනයේ සම්පත්දායකත්වයෙන් විභාග ක්‍රියාවලීන් ප්‍රමිතිකරණය කිරීම සඳහා පුහුණු වැඩසටහනක් පවත්වන ලදී.

## 3.5 ගුණාත්මක සංවර්ධන වැඩසටහන්

- අ.පො.ස. (උසස් පෙළ) 2020 විභාගයේ ඇගයීම් වාර්තා සකස් කර සංස්කරණය කරන ලදී.
- අ.පො.ස. (උසස් පෙළ) 2021 විභාගයේ ඇගයීම් වාර්තා සකස් කර සංස්කරණය කරන ලදී.
- අ.පො.ස. (උසස් පෙළ) 2022 විභාගයේ ඇගයීම් වාර්තා සකස් කර සංස්කරණය කරන ලදී.

### 3.6 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම්

- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට අදාළව පාසල් මට්ටමේ තක්සේරුකරණය හා ජාතික මට්ටමේ තක්සේරුකරණය සමාලෝචනය හා යාවත්කාලීන කිරීම.
- සාමාන්‍ය අධ්‍යාපනයේ තක්සේරුකරණය හා ඇගයීම් පිළිබඳ මාර්ගෝපදේශ සකස් කිරීම.
- පාසල් හා ජාතික මට්ටමේ තක්සේරුකරණය හා ඇගයීම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධ නියාමන හා ඇගයීම් රාමුවක් සකස් කිරීම.
- පාසල් පාදක වෘත්තීය ගුරු සංවර්ධන වැඩසටහන මගින් තක්සේරුකරණය හා ඇගයීම් පිළිබඳව ගුරුවරුන්ගේ වෘත්තීය සංවර්ධනය ඇති කිරීමට අදාළ මාර්ගෝපදේශ සකස් කිරීම.
- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීමේදී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ස්ථාපිත කිරීමට යෝජිත සහායක පද්ධති (අර්ධ ස්වයංක්‍රීය පරීක්ෂණ ජනන පද්ධතිය, පාසල් මට්ටමේ තක්සේරුකරණ සම්පත් සංචිතය, ශිෂ්‍ය තක්සේරුකරණ කළමනාකරණ තොරතුරු පද්ධතිය) සංවර්ධනය සඳහා මෙහෙයුම් කමිටුව පිහිටුවීම, මෙහෙයුම් කමිටු රැස්වීම පැවැත්වීම හා ආශ්‍රිත ක්‍රියාකාරකම් සැලසුම් කිරීම.

## 04. **2025.09.30 දින සිට 2025.12.31 දින දක්වා සිදු කිරීමට අපේක්ෂිත කාර්යයන්**

### 4.1 පාසල් විභාග පැවැත්වීම

**අ. පො. ස (උසස් පෙළ) විභාගය - 2025**

| | | |
|---|---|---|
| විභාගය පැවැත්වීමට නියමිත දිනය | - | 2025.11.10 |
| විභාගය අවසන් වීමට නියමිත දිනය | - | 2025.12.05 |
| අයදුම්පත් කැඳවූ දිනය | - | 2025.06.26 සිට 2025.07.21දක්වා |
| ප්‍රතිඵල නිකුත් කිරීමට සැලසුම් කර ඇති දිනය | - | 2026.03.10 |

| අයදුම්කරුවන් ප්‍රමාණය | | එකතුව |
|---|---|---|
| පාසල් අයදුම්කරුවන් ප්‍රමාණය | 246,521 | **340,525** |
| පෞද්ගලික අයදුම්කරුවන් ප්‍රමාණය | 94,004 | |

**සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය - 2025**

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2025.12.06
විභාගය අවසන් වීමට නියමිත දිනය - 2025.12.06

**4.2 ආයතනික විභාග පැවැත්වීම**

| මාසය | පැවැත්වීමට සැලසුම් කර ඇති විභාග සංඛ්‍යාව | වෙනත් |
|---|---|---|
| සැප්තැම්බර් 15 සිට 30 දක්වා | 4 | දැනටමත් විභාග කාල සටහන අනුමත කරගෙන ඇති බැවින් අනිවාර්යයෙන් පැවැත්වීමට නියමිතය |
| ඔක්තෝබර් | 12 | |
| නොවැම්බර් | 8 | අ.පො.ස (උ/පෙළ) විභාගය පැවැත්වීමට නියමිත බැවින්, මෙම විභාග පැවැත්වෙන ප්‍රමාණය වෙනස්විය හැක. |
| දෙසැම්බර් | 10 | |

**4.3 ධාරිතා සංවර්ධන වැඩසටහන් පැවැත්වීම**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන් හා දත්ත විශ්ලේෂණය සම්බන්ධ රාජකාරි කටයුතු වල නිරතවන නිලධාරීන් 30 ක කණ්ඩායමක් (මාණ්ඩලික නිලධාරීන්ද ඇතුළුව) සඳහා SPSS පාඨමාලාවක් පැවැත්වීමට නියමිතය.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන්, සංවර්ධන නිලධාරීන්, කළමනාකරණ සේවා නිලධාරීන් හා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා නිලධාරීන් 35 දෙනෙකුගෙන් යුතු කණ්ඩායමක් සඳහා AI ආශ්‍රිත නවෝත්පාදන පරිගණක දැනුම භාවිතය සම්බන්ධයෙන් පුහුණු පාඨමාලාවක් පැවැත්වීමට නියමිතව ඇත.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂ (තොරතුරු තාක්ෂණ), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී සහ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර නිලධාරීන් පිරිසක් Full Stack Web Development පුහුණු පාඨමාලාවක් සඳහා යොමු කිරීමට නියමිතව ඇත.

විභාග ආශ්‍රිත විමර්ශන කටයුතු සිදු කරන නිලධාරීන් සඳහා විධිමත් විමර්ශන ක්‍රියාවලිය සම්බන්ධ පුහුණු වැඩමුළුවක් පැවැත්වීමට සැලසුම් කර ඇත.

**4.4 ගුණාත්මක සංවර්ධන වැඩසටහන් පැවැත්වීම**

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) 2024 විභාගයේ සහ අපො.ස. (උසස් පෙළ) 2024 විභාගයේ ඇගයීම් වාර්තා සකස් කිරීම හා සංස්කරණය කිරීම.

අ.පො.ස.(සාමාන්‍ය පෙළ) 2019, 2020, 2021, 2022, 2023 හා 2024 සහ අ.පො.ස. (උසස් පෙළ) 2020, 2021 හා 2024 විභාගවල ඇගයීම් වාර්තා ප්‍රකාශයට පත් කිරීම.

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2024 හි විශ්ලේෂණ වාර්තා පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම.

## 4.5 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ක්‍රියාකාරකම්

ජාතික ශිෂ්‍ය තක්සේරුකරණ රාමුවට අදාළ අවසන් ලේඛනය සකස් කිරීම.

සහායක පද්ධති සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සඳහා උපාංග මිල දී ගැනීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීම

## 4.6 දෙපාර්තමේන්තුව මඟින් 2025 වසරේ දී ක්‍රියාත්මක කර ඇති වසර අවසාන වන විට නිම කිරීමට අපේක්ෂිත සංවර්ධන ව්‍යාපෘතීන්

- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ A හා B ගොඩනැගිලිවල වැසිකිළි පද්ධතිය නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය ආරම්භ කර ඇති අතර, මෙම වර්ෂය අවසානයේදී මෙම ව්‍යාපෘතිය සාර්ථකව අවසන් කිරීමට නියමිතය.
- රහස්‍ය මුද්‍රණාලයේ සිවිලිම අළුත්වැඩියා කිරීමේ කාර්යය මෙම වර්ෂය තුළ අවසන් කිරීමට නියමිතය.
- එක්දින සේවා පරිශ්‍රයේ නවීකරණ කටයුතු සිදුකර අවසන් කිරීමට නියමිතය.
- ආතර් වෙදමුල්ල ශාලාවේ අළුත්වැඩියා කටයුතු මෙම වර්ෂය තුළ සිදුකිරීමට නියමිතය.
- දත්ත සටහන් ශාඛාවේ අළුත්වැඩියා කටයුතු සිදුකිරීමට නියමිතය.
- රහස්‍ය නොවන මුද්‍රණාලය වායු සමීකරණය කර නවීකරණය කිරීමට නියමිතය.
- වාහන නැවැත්වීමේ අංගනය හා රියදුරු විවේකාගාරය නවීකරණය කර අවසන් කිරීමට නියමිතය.
- දෙපාර්තමේන්තු මධ්‍යගත වායු සමීකරණ පද්ධතිය අළුත්වැඩියා කර අවසන් කිරීමට නියමිතය.
- දෙපාර්තමේන්තුවේ ශාඛා වලට අයත් කාර්යාලීය උපකරණ මිල දී ගැනීම.
- දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා 1000kw විදුලි ජනක යන්ත්‍රයක් මිල දී ගැනීමට නියමිතය.
- දෙපාර්තමේන්තු අවශ්‍යතා සඳහා Server යන්ත්‍රයක් මිල දී ගැනීමට නියමිතය.
- ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රධාන පරිගණක පද්ධතිය වන AS 400 පද්ධතිය සංවර්ධනය කිරීමේ කටයුත්ත මෙම වර්ෂය අවසාන වන විට සිදුකිරීමට නියමිතය.
- දෙපාර්තමේන්තු පැරණි විභාග ප්‍රතිඵල සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ පළමු අදියර 2025 වර්ෂයේදී අවසන් වීමට නියමිතය.

**5. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ 2025 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රගතිය**

| වැය විෂය | 2025 ඇස්තමේන්තුව (රු.) | 2025.09.30 දිනට මූල්‍ය ප්‍රගතිය | 2025.12.31 දිනට අපේක්ෂිත මූල්‍ය වියදම |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **11,610,000,000.00** | **6,728,762,530.27** | **11,610,000,000.00** |
| පුද්ගලික වැටුප් ගෙවීම | 659,000,000.00 | 452,204,409.45 | 659,000,000.00 |
| ගමන් වියදම් | 3,000,000.00 | 652,258.00 | 3,000,000.00 |
| සැපයීම් | 877,650,000.00 | 206,549,563.31 | 877,650,000.00 |
| නඩත්තු වියදම් | 115,300,000.00 | 31,077,379.05 | 115,300,000.00 |
| සේවා | 9,950,850,000.00 | 6,035,700,543.61 | 9,950,850,000.00 |
| මාරුවීම් | 4,200,000.00 | 2,578,376.85 | 4,200,000.00 |
| **ප්‍රාග්ධන වියදම්** | **750,000,000.00** | **24,703,619,26** | **750,000,000.00** |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය කිරීම හා වැඩිදියුණු කිරීම | 154,000,000.00 | 20,774,237.01 | 154,000,000.00 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම | 70,000,000.00 | 1,476,676.25 | 70,000,000.00 |
| ධාරිතා සංවර්ධනය | 5,000,000.00 | 2,452,706.00 | 5,000,000.00 |
| සංවර්ධන සැලැස්ම | 0 | 0 | 0 |
| අධ්‍යාපන ප්‍රතිසංස්කරණ | 0 | 0 | 0 |
| මුද්‍රණ යටිතල පහසුකම් සංවර්ධනය | 324,000,000.00 | 0 | 324,000,000.00 |
| දත්ත ආරක්ෂණය වැඩිදියුණු කිරීම | 97,000,000.00 | 0 | 97,000,000.00 |
| පැරණි විභාග ප්‍රතිඵල සංරක්ෂණ ව්‍යාපෘතිය | 100,000,000.00 | 0 | 100,000,000.00 |
| **එකතුව** | **12,360,000,000.00** | **6,753,466,149.53** | **12,360,000,000.00** |

## 6. 2026 වර්ෂයේ අපේක්ෂිත ඉලක්ක

### 6.1 පාසල් විභාග පැවැත්වීම

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය 2025 (2026)

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2026.02.17

විභාගය අවසන් වීමට නියමිත දිනය - 2026.02.26

5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය 2026

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2026.08.09

විභාගය අවසන් වීමට නියමිත දිනය - 2026.08.09

අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2026

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2026.08.10

විභාගය අවසන් වීමට නියමිත දිනය - 2026.09.05

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2026.10.24

විභාගය අවසන් වීමට නියමිත දිනය - 2026.10.24

අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය 2026

විභාගය පැවැත්වීමට නියමිත දිනය - 2026.12.08

විභාගය අවසන් වීමට නියමිත දිනය - 2026.12.17

කොරෝනා වසංගතය හේතුවෙන් ප්‍රමාද වූ විභාග කැලැන්ඩරය විභාග 4ක් පවත්වා 2026 වර්ෂයේ දී යථා තත්ත්වයට පත් කර ගැනීමට නියමිතය.

### 6. 2 ආයතනික විභාග පැවැත්වීම

**6.3 2026 වර්ෂය සඳහා සිදු කිරීමට නියමිත ගුණාත්මක සංවර්ධන වැඩසටහන්**

අ.පො.ස. (උසස් පෙළ) විභාගය 2022, 2023, 2024 හා 2025 හි තෝරාගත් විෂයන් සඳහා ඇගයීම් වාර්තා සකස් කිරීම.

අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය 2023, 2025 හි තෝරාගත් විෂයන් සඳහා ඇගයීම් වාර්තා සකස් කිරීම.

නීති විද්‍යාල ප්‍රවේශ විභාගයෙහි පර්යේෂණ හා විශ්ලේෂණ වාර්තා සකස් කිරීම.

සාමාන්‍ය තොරතුරු තාක්ෂණ විභාගය 2026 සඳහා දත්ත විශ්ලේෂණ වාර්තා සකස් කිරීම.

05 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පදනම් කරගෙන සිදු කරන පර්යේෂණයේ ඉදිරි කටයුතු සිදු කිරීම.

පාසල් හා ආයතනික විභාග සම්බන්ධව සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීම.

පාසල් හා ආයතනික විභාග සම්බන්ධ දත්ත ඇසුරෙන් සිදු කරන විශ්ලේෂණ කටයුතු.

**6.4 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අදාළ ක්‍රියාකාරකම්**

- නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට අදාළව ක්‍රියාත්මක කිරීමට යෝජිත 9 ශ්‍රේණියේ ජාතික මට්ටමේ විභාගය සඳහා තක්සේරුකරණ ආකෘති සකස් කිරීමේ වැඩමුළු පැවැත්වීම හා ඊට අදාළ කටයුතු සංවිධානය කිරීම.
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගයේ තක්සේරුකරණ රාමුව යාවත්කාලීන කිරීම සහ මුලාකෘති ප්‍රශ්න පත්‍ර සකස් කිරීම.
- අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට අදාළව නියමු ව්‍යාපෘති සිදු කිරීම.
- අ.පො.ස (සාමාන්‍ය පෙළ) විභාගය ජාත්‍යන්තර විභාග සමඟ සංසන්දනාත්මක අධ්‍යයනයක් සිදු කිරීම.
- පාසල් මට්ටමේ තක්සේරුකරණය සඳහා පාසල් මට්ටමේ තක්සේරුකරණ සම්පත් සංචිතයට අදාළව තක්සේරුකරණ සහයක පද්ධති සැලසුම්කරණය, නිර්මාණය, සංවර්ධනය කිරීම සහ පරීක්ෂා කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම. (අවශ්‍ය මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන සිදු කිරීම)

**6.5 2026 වර්ෂය තුළ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක කිරීමට නියමිත සංවර්ධන ව්‍යාපෘතීන්**

| අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත වියදම (රු. මිලියන) |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ අභ්‍යන්තර අධීක්ෂණය වඩාත් ශක්තිමත් කිරීම සඳහා නව CCTV පද්ධතියක් ස්ථාපනය කිරීම | 9.5 |
| 02 | රහස්‍ය ලේඛන සඳහා QR කේතය එක් කරන ලද ආරක්ෂිත මුද්‍රණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | 28 |
| 03 | නවීන තාක්ෂණය ඔස්සේ ප්‍රශ්න පත්‍ර ඇසුරුම් කිරීම හා බෙදාහැරීමේ ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීම | 5 |

| අංකය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තු ගත වියදම (රු. මිලියන) |
|---|---|---|
| 04 | විදේශීය පුහුණු  පුහුණු වැඩසටහනක් හරහා දෙපාර්තමේන්තු නිලධාරින් සම්භවන ඇගයීම් පිළිබඳව ධාරිතා සංවර්ධනය | 20 |
| 05 | පරිගණක ශාඛාවේ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය | 10.2 |
| 06 | මෙහෙයුම් කාර්යක්ෂමතාව වර්ධනය කිරීම සඳහා කාර්යාලීය උපකරණ මිලදී ගැනීම | 15 |
| 07 | බ්‍රේල් ප්‍රශ්න පත්‍ර පරිවර්තනය සහ මුද්‍රණය කිරීම සඳහා පද්ධතියක් ක්‍රියාත්මක කිරීම | 9.5 |
| 08 | දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර server ස්ථාපනය කිරීම | 37 |
| 09 | මුද්‍රණ උපකරණ යනාදිය මිල දී ගැනීම හරහා යටිතල පහසුකම් ශක්තිමත් කිරීම | 57 |
| 10 | දෙපාර්තමේන්තුව සඳහා සම්පූර්ණ ERP (Entity Resource Plan)පද්ධතියක් සංවර්ධනය කිරීම | 98 |
| 11 | පර්යේෂණ සහ සංවර්ධන ශාඛාවේ පුස්තකාලය නවීකරණ ව්‍යාපෘතිය | 34.7 |
| 12 | ආයතනික විභාග අංශය සඳහා ගෙවීම් වවුචර පද්ධතිය ඩිජිටල් කිරීම | 3.4 |
| 13 | දෙපාර්තමේන්තුවේ A ගොඩනැගිල්ලේ වහලය මත සම්පත්දායකයින්ට ආහාර ගැනීම සහ විවේකීව සිටීම සඳහා සුදුසු ස්ථානයක් ස්ථාපිත කිරීම. | 5 |
| 14 | දෙපාර්තමේන්තුවේ බාහිර පින්තාරු කිරීමේ ව්‍යාපෘතිය | 30 |
| 15 | දෙපාර්තමේන්තුවේ ඇගයීම් පහසුකම් පුළුල් කිරීම | 17 |
| 16 | දෙපාර්තමේන්තුව තුළ රහස්‍යභාවය වර්ධනය කිරීම | 9.5 |
| 17 | දෙපාර්තමේන්තුවේ ගොඩනැගිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය | 98 |
| 18 | පැරණි විභාග ප්‍රතිඵල සංරක්ෂණය කිරීමේ ව්‍යාපෘතියේ දෙවන අදියර ක්‍රියාත්මක කිරීම | 200 |

## යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව

**<u>2025 අයවැය කාරක සභා අවස්ථාව සඳහා ඉදිරිපත් කරනු ලබන යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභා ප්‍රගති වාර්තාව</u>**

යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභා කාර්යාලය නිරන්තරයෙන් යුනෙස්කෝ ප්‍රධාන කාර්යාලය ශ්‍රී ලංකාවේ යුනෙස්කෝ නිත්‍ය නියෝජිත කාර්යාලය යුනෙස්කෝ ක්ෂේත්‍ර කාර්යාල 58 සහ යුනෙස්කෝ සාමාජික රටවල් 194 සමග නිරන්තර ගණුදෙණු කරන කාර්යාලයකි.

මෙවැනි ලොව පුරා විහිදුණු ජාලගත කාර්යාල පද්ධතිය මගින් නිර්මාණය වන රාජකාරි වැඩසටහන් ප්‍රතිපත්තිමය කාරණා සන්නිවේදන සම්බන්ධීකරණ නියෝජිතයන් යොමු කිරීම නියෝජිත ආයතන දැණුවත් කිරිම හා ක්‍රියාත්මක කිරිම යන කරුණු සියල්ලද ශ්‍රී ලංකා රජය නියෝජනය කරන එකම හා ප්‍රධානතම ආයතනය වන යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාව විසින් දෛනිකව ඉටුකළ යුතුව ඇත.

තවද යුනෙස්කෝ ශ්‍රී ලංකා ජාතික කොමිෂන් සභාවේ විෂය පථයට අදාල විෂය ක්ෂේත්‍ර යන් පහම ආවරණය වන පරිදි යුනෙස්කෝ කොමිෂන් සභාව තුල ඇති සියලුම අමාත්‍යාංශ දෙපාර්තමේන්තු සහ අනෙකුත් ආයතන සම්බන්ධීකරණය දැණුවත් කිරීම යන කරුණු මෙමගින් ඉටුවේ.

**සංස්කෘතික අංශය**

- 2025 අප්‍රේල් 1 වන දින යුනෙස්කෝ මූලස්ථානයේ පැවති අනුරාධපුර පූජනීය නගරය පිළිබඳ ජාත්‍යන්තර විශේෂඥ සමුළුවට සහභාගී වීම සඳහා අධ්‍යාපන උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යවරිය යුනෙස්කෝ මූලස්ථානය වෙත යාම.
- අනුරාධපුර පූජනීය නගරය පිළිබඳ සංවර්ධන සැලැස්ම යුනෙස්කෝ සංවිධානයට ඉදිරිපත් කිරීමෙන් පසු ඒ පිළිබඳ අධීක්ෂණ කටයුතු සඳහා යුනෙස්කෝ කලාපීය කාර්යාලයේ අධ්‍යක්ෂක ටිම් කර්ටිස්ට් මහතා ශ්‍රී ලංකාවට පැමිණීම. මේ සම්බන්ධ සම්බන්ධීකරණ නටයුතු සිදුකිරීම.
- යුනෙස්කෝ කලාපීය කාර්යාලයේ සංස්කෘතික අංශයේ ප්‍රධානී ජුන්හි හැන් මහත්මිය ඇතුළු නිලධාරින් සමඟ ශ්‍රී ලංකාවේ සංස්කෘතික කටයුතු සම්බන්ධයෙන් මාර්ගතව සාකච්ඡා පැවැත්වීම.
- ආසියනු සංවර්ධන බැංකු ණය පහසුකම යටතේ ක්‍රියාත්මක වන තිරසාර නගර සංවර්ධන ව්‍යාපෘතිය හා ඒ අනුව සිගිරි සියවස් මාවත සංවර්ධනය කිරීම සහ සිගිරි වැව ප්‍රතිසංස්කරණය කිරීම වෙනුවෙන් යුනෙස්කෝ මූලස්ථානය දැනුවත් කිරීම සහ ඒ පිළිබඳ නිර්දේශ ලබාගැනීම වෙනුවෙන් නාගරික සංවර්ධන අමාත්‍යංශ නිලධාරින් සමඟ සාකච්ඡා පැවැත්වීම.
- සංස්කෘතික අමාත්‍යාංශයේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව සමඟ අස්පර්ශනීය සංස්කෘතික උරුමයන් ලැයිස්තුගත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීම සහ ඉදිරි කටයුතු සැලසුම් කිරීම.

**අධ්‍යාපන අංශය**

- මිට්සුබිෂි ආසියානු ළමා එනික්කි ෆෙස්ටා 2024-2025- සම්මාන උළෙල-භෞතික ප්‍රගතිය 100% මූල්‍ය ඉලක්කය - පිරිවැය - රු. 2,170,175.00
- හරිතකරණ අධ්‍යාපන හවුල්කාරිත්වය- ශ්‍රී ලංකාවේ හරිත ගොඩනැගිලි කවුන්සිලය සමඟ කෙටුම්පත් කරන ලද අවබෝධතා ගිවිසුම සහ ඒ සඳහා අනුමැතිය අධ්‍යාපන ලේකම්වරයාගෙන් ලබා ගැනීම
- 2030 සඳහා තිරසාර සංවර්ධනය සඳහා අධ්‍යාපනය (ESD) පිළිබඳ යුනෙස්කෝ ධාරිතා සංවර්ධන වැඩමුළුව - පී.කේ. ප්‍රියංගිකා මහත්මිය, නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, කෘෂිකර්ම සංවර්ධන ශාඛාවක් එම්.කේ.ඒ.යූ. මහත්මිය. ආනන්ද (නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, සැමට අධ්‍යාපන ශාඛාව) **සමීක්ෂණ**
- 2025 ජුනි 20 වන දින වන විට තරුණ හා ශිෂ්‍ය සහභාගීත්වය පිළිබඳ යුනෙස්කෝ සමීක්ෂණය - අතිරේක ලේකම් (ප්‍රතිපත්ති සැලසුම් සහ කාර්ය සාධන සමාලෝචන ශාඛාව) වෙත යොමු කරන ලදී
- "21 වන සියවසේ ඉගැන්වීම 3.0" ගෝලීය තරඟයට සහභාගී වීම බෙදා හැරීම සහ දිරිමත් කිරීම සඳහා පාසල් කටයුතු ශාඛාවෙන් ඉල්ලා සිටියේය
- හොංකොං හි අස්පෘශ්‍ය සංස්කෘතික උරුමය (ICH) අධ්‍යාපනය පිළිබඳ යුනෙස්කෝ ASP net ගුරු වෘත්තීය සංවර්ධන වැඩසටහනට සහභාගී වීම සහ සම්බන්ධීකරණය කරන ලද "කවියක් තෑගි කරන්න" වැඩසටහන

**ස්වාභාවික විද්‍යාව**

- Man and the Biosphere Programme – (MAB) මිනිසා සහ ජෛවගෝල වැඩසටහන ජාතික කමිටුව කැඳවා, හි සභාපති සහ ලේකම් සමඟ සාකච්ඡා කරන්න. සහ SLNCU අරමුදල් සමඟ ආවර්තිතා සමාලෝචනය කිරීමට තීරණය කළා.
- ආවර්තිතා සමාලෝචනය සඳහා කොමිෂන් සභා පත්‍රිකාව කොමිසම විසින් ඉදිරිපත් කර අනුමත කර ඇත.
- භූ විද්‍යාව සහ භූ උද්‍යානය සඳහා වූ ජාතික කමිටුව - භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය සමඟ යුනෙස්කෝ නවදිල්ලි ප්‍රාදේශීය කාර්යාලයේ ස්වාභාවික විද්‍යා විශේෂඥ ආචාර්ය බෙනෝ බෝර් සමඟ මූලික සාකච්ඡා පැවැත්විණි.
- **යුනෙස්කෝ මූලස්ථානය වෙත 2025 වර්ෂය සඳහා ගෙවන ලද දායක මුදල් වැය ශීර්ෂය 126-01-02-0-1505 යටතේ**

| | |
|---|---|
| • යුනෙස්කෝ දායක මුදල | රු. 38,787,057.40 |
| ලෝක උරුම සුරැකීමේ අරමුදල | රු. 395,547.60 |
| අශ්පශ්වනීය ලෝක අරුම අරමුදල | රු. 395,547.60 |
| ICCROM ආයතන සඳහා | රු. 620,768.15 |
| මුළු ගෙවීම් | රු. 40,198,920.75 |

## යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල

- යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල් කළමනාකරණ කමිටු රැස්වීමේදී ගන්නා ලද තීරණ ක්‍රියාත්මක කරමින් යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල යාවත්කාලින කරමින් පවත්වා ගැනීමට අදාළ පියවර ගනිමින් පවතී. ඒ අනුව,
- යුනෙස්කෝ ශිෂ්‍යයත්ව අරමුදල නමින් පැලවත්ත ලංකා බැංකු ශාඛාවේ වන ස්ථාවර තැන්පතුව නැවත ආයෝජනය හා 2023.12.04 දිනට ස්ථාවර තැන්පතු මගින් ලද පොළී ආදායමින් 25% ක මුදලක් නව ස්ථාවර තැන්පතුවක ආයෝජනය කිරීමට කටයුතු කිරීම.
- නොවිධිමත් හා විශේෂ අධ්‍යාපනක ඒකකය වෙත ශිෂ්‍යත්වලාභින්ගේ දත්ත ගබඩාවක් සකස් කිරීමට උපදෙස් ලබා දී ඇත.
- ශිෂ්‍යත්වලාභින්ගේ පාසල් අධ්‍යාපනය ලැබීම පාසල් විදුහල්පති විසින් තහවුරු කර ඇති ශිෂ්‍යත්වලාභින් සඳහා 2024 වර්ෂයේ ගෙවීම් සිදු කර ඇත.
- 2023.10.12 වන දින පැවති යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලේ කළමනාකණ තීරණ පරිදි ශ්‍රී ලංකා යුනෙස්කෝ ජාතික කොමිෂන් සභාව යටතේ ස්ථාපිත කර ඇති යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදලට අරමුදල් තරකර ගැනිමේ අරමුණින් මුද්‍රණය කළ කොඩි අළෙවි කිරීම ආරම්භ කරන ලදී.
- 2015 වර්ෂයේ සිට යුනෙස්කෝ ශිෂ්‍යත්ව අරමුදල සඳහා අවසාන ගිණුම් සකස් කර නොතිබූ අතර 2015 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා සකස් කරන ලද අවසාන ගිණුම් රජයේ විගණන අංශය වෙත ඉදිරිපත් කරන ලද අතර නැවත අඩුපාඩු සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමට උපදෙස් ලබා දුන් බැවින් ඊට අදාල කටයුතු සිදු කරමින් පවතී.
- 2024.12.31 දිනට අවසාන ගිණුම් සකස් කර ඇති අතර ඉදිරියේදී කළමනාකරණ මණ්ඩලයේ අනුමැතියට ඉදිරිපත් කිරීමට නියමිත වේ.
- **2026 ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘති**
- ඒ එස් පී පාසල් ජාලයට උතුර සහ නැගෙනහිර පාසල් එක් කරගැනීම.
- හරිත සංකල්ප පාසල් ව්‍යාපෘතිය දියත් කිරීම.
- ලෝක උරුම තාවකාලික ලේඛනයෙහි ඇති (Tentative List) ස්ථානයක් ලෝක උරුමයක් ලෙස නම් කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම.

- ශ්‍රී ලංකා අශ්පර්ෂණීය උරුම ලේඛනය සකස් කිරීම කඩිනම් කිරීම සහ යුනෙස්කෝ ස්වභාවික විද්‍යා අංශය යටතේ මිනිසා සහ ජෛවගෝල වැඩසටහන වෙනුවෙන්, නියමිත සහ සෑම වසර දහයකට වරක් සිදුකල යුතුවන ජෛවගෝල රක්ෂිත හතරෙහි කලාවර්තිත වාර්තාකරණ සමාලෝචන ක්‍රියාවලිය සිදුකිරීම.
- I C H හි ජාතික ලැයිස්තුව යාවත්කාලීන කිරීම සඳහා ජාත්‍යන්තරය සමඟ අස්පෘශ්‍ය සංස්කෘතික උරුමයන් (ICH) පිළිබඳ වැඩමුළු පැවැත්වීම.
- ලෝක උරුමය ලැයිස්තුවට ඇතුළත් කිරීම සඳහා සංස්කෘතික හා සංස්කෘතික උරුමයන් පිළිබඳ තවත් අයිතම කිහිපයක් නම් කිරීම.
- **මිට්සුබිෂි ආසියානු ළමා එනික්කි ෆෙස්ටා 2024-2025- සම්මාන උළෙල**

## රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව

| අනු අංකය | විස්තරය | 2025 දී තත්ත්වය | 2026 සඳහා යෝජිත |
|---|---|---|---|
| 01 | සියලුම ගොඩනැගිලිවල පිටත තීන්ත ආලේපනය කිරීම | අවසන් කර ඇත | ගොඩනැගිලි ඇතුළත තීන්ත ආලේපනය කිරීමට යෝජනා කර ඇත |
| 02 | සංස්ථාවේ ඇතුළත මාර්ග පද්ධතියේ කොටසක් ප්‍රතිසංස්කරණය කිරීම | අවසන් කර ඇත | ඉතිරි කොටස ප්‍රතිසංස්කරණය කිරීමට යෝජනා කර ඇත |
| 03 | ගිනි නිවන උපකරණ නැවත පිරවීම සහ ස්ථාපනය කිරීම | අවසන් කර ඇත | |
| 04 | විදුලි පද්ධතිය වැඩිදියුණු කිරීම | ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී | |
| 05 | ආපනශාලා පරිශ්‍රයක් ඉදිකිරීම | ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී | |
| 06 | ලිතෝ සහ බන්ධන කර්මාන්තශාලාවල වහල අලුත්වැඩියා කිරීම | ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී | |
| 07 | වැසිකිළි පද්ධති හා විවේකාගාර ප්‍රතිසංස්කරණය කිරීම | ප්‍රසම්පාදන කටයුතු කරමින් පවතී | |
| 08 | 5S ක්‍රියාත්මක කිරීම | කටයුතු කරමින් පවතී | |
| 09 | නිෂ්පාදන බෙදාහැරීමේ ජාලය ස්ථාපිත කිරීමෙන් වෙළඳපල කොටස පුළුල් කිරීම | කටයුතු කරමින් පවතී | |
| 10 | SPC නැවත සන්නාමකරණය සහ ප්‍රචාරණය | යෝජනා කර ඇත | |
| 11 | SPC ලිපි ද්‍රව්‍ය නිෂ්පාදන කළඹ පුළුල් කිරීම | යෝජනා කර ඇත | |
| 12 | නව භූ-දර්ශන නිර්මාණය (Landscape Designing) | යෝජනා කර ඇත | |
| 12 | ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රති-ඉන්ජිනේරුකරණය (Business Process Re-engineering) | යෝජනා කර ඇත | |
| 13 | විස්තීර්ණ ERP විසඳුමක් හඳුන්වා දීම | | යෝජනා කර ඇත |
| 14 | Expanding the production line of the stationery factor; නව ස්වයංක්‍රීය අභ්‍යාස පොත් මුද්‍රණ යන්ත්‍රයක් මිලදී ගැනීම. | යෝජනාව භාර දී ඇත | 2026 අයවැය කතාවට යෝජනාව ඉදිරිපත් කර ඇත |
| 15 | "SmartPrint Initiative" – ඊ-ආරක්ෂක මුද්‍රණ අංශයක් (ඒකාබද්ධ ව්‍යාපාරයක්) ස්ථාපිත කිරීම | විස්තීර්ණ යෝජනාවක් සකස් කරමින් පවතී | 2026 අයවැය කතාවට යෝජනාව ඉදිරිපත් කර ඇත |

**2025.09.30 දිනට අයවැය ප්‍රතිපාදනවල ප්‍රගතිය**

| වියදම | මුළු වෙන් කිරීම - 2025 (රු. මිලියන) | 2025.09.30 දිනට වියදම (රු. මිලියන) | මූල්‍ය ප්‍රගතිය (%) |
|---|---|---|---|
| පුනරාවර්තන | 1220 | 756.2 | 61.98% |
| ප්‍රාග්ධන | 203 | 8.74 | 4.31% |
| අමුද්‍රව්‍ය වියදම් | 1570 | 595.4 | 37.92% |
| එකතුව | **2993** | **1360.34** | **45.45%** |

**2025.09.30 දිනට ආදායම් උත්පාදනය**

| | 2025.09.30 දිනට | | | 2025.012.31 දිනට අපේක්ෂිත කාර්ය සාධනය |
|---|---|---|---|---|
| උපායමාර්ගික ව්‍යාපාර ඒකක | සැලසුම් කළ වටිනාකම (රු.) | ලබා කරගත් වටිනාකම (රු.) | (%) | |
| **සුරක්ෂා මුද්‍රණ** | 373,000,000.00 | 389,854,832.00 | 104.52% | 500,000,000.00 |
| **පෙළපොත් මුද්‍රණය** | 1,137,000,000.00 | 872,938,767.63 | 76.78% | 1,600,000,000.00 |
| **වාණිජ මුද්‍රණය** | 195,000,000.00 | 167,415,198.01 | 85.85% | 300,000,000.00 |
| **අලෙවිසැල් අලෙවිය (ලිපි ද්‍රව්‍ය, වෙනත්, ප්‍රකාශන)** | 194,823,730.31 | 99,431,323.26 | 51.04% | 551,000,000.00 |
| **අනෙකුත් මෙහෙයුම් ආදායම** | 50,716,678 | 20,833,152.00 | 41.08% | 67,622,237.00 |
| **මූල්‍ය ආදායම** | 2,175,000 | 1,863,524.00 | 85.68% | 2,900,000.00 |
| එකතුව | **1,901,041,115.31** | **1,601,509,092.90** | **79.50%%** | **3,021,522,237.00** |

මෙම ප්‍රගතිය, වසර මැද ප්‍රගති ඇගයීමෙන් පසු සිදු කරන ලද අයවැය සංශෝධනයෙන් පසු සංඛ්‍යා නිරූපණය කරයි.

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

| | ක්‍රියාකාරකම | අපේක්ෂිත කාර්යසාධනය 30.09.2025 | | 2025.12.31 වන විට අපේක්ෂිත කාර්යසාධනය |
|---|---|---|---|---|
| | | භෞතික | භෞතික % | |
| 01 | පළමුවන ශ්‍රේණියට ඇතුළත්වන දරුවන්ගේ පාසලට සූදානම පිළිබඳ ප්‍රාථමික පාසල් ගුරුවරුන්ගේ සංජානන | • පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ අදහස් ලබාගනිමින් ඔවුන් සමග එක්ව පළමුවනශ්‍රේණියේ ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලියක් සකස් කිරීම.<br>• ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තුමේන්තුවේ සංඛ්‍යානඥයෙකුගේ සහාය ඇතිව පර්යේෂණය මෙහෙයවීම සඳහා පළාත් නවයම නියෝජනය වන පරිදි දිවයින පුරා පාසල් 337ක් නියෝජනය වන පරිදි ගුරුවරුන් 581 ක නියැදියක් තෝරාගැනීම.<br>• ප්‍රශ්නාවලියේ වලංගුතාව තහවුරු කර ගැනීම සඳහා තෝරාගත් පාසල් 11 ක ප්‍රශ්නාවලි ලබාදෙමින් නියමු අධ්‍යයනය සිදු කර සුදුසු පරිදි සංශෝධනයන් සිදු කිරීම.<br>• සංශෝධිත අවසන් ප්‍රශ්නාවලිය තැපැල් මාර්ගිකව අදාළ පාසල් වෙත යොමු කොට දත්ත රැස් කිරීම. (ගුරුවරුන් 488 ක ගේ (84%) ප්‍රතිචාර ලැබී ඇත.)<br>• දත්ත විශ්ලේෂණය සිදු කිරීම | අවසන් වාර්තාව සැකසීම මේ වන විට සිදු කරමින් පවතී. අධ්‍යයනයෙන් 80% පමණ අවසන්ව ඇත. | අවශ්‍ය සංශෝධන කටයුතු සිදුකර වාර්තාව අවසන් කිරීම |

| | ක්‍රියාකාරකම | අපේක්ෂිත කාර්යසාධනය 30.09.2025 | | 2025.12.31 වන විට අවසන්කර ඇති ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|
| | | භෞතික | භෞතික % | |
| 02 | ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාතේ 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ වත්මන් තත්ත්වය පිළිබඳ ඇගයීම. | • අවුරුදු 13ක වසරක අඛණ්ඩ අධ්‍යාපන වැඩසටහනේ වත්මන් තත්ත්වය තේරුම් ගැනීම සඳහා, ව්‍යුහගත ප්‍රශ්නාවලි දෙකක් සකස් කරන ලදී.<br>• එම ප්‍රශ්නාවලි වල අදාළත්වය තහවුරු කිරීම සඳහා, වෘත්තීය අධ්‍යාපන ක්ෂේත්‍රයේ නිරත ගුරුවරුන්ගේ සහභාගීත්වය සමඟ අවධාන කණ්ඩායම් සාකච්ඡා පවත්වන ලදී.<br>• ශ්‍රී ලංකාවේ බස්නාහිර පළාත තුළ පිහිටි 13 වසරක අඛණ්ඩ අධ්‍යාපනයේ ඉගැන්වෙන පාසල් 89 ක් අධ්‍යයන ජනගහණය ලෙස හඳුනාගෙන ඇත. මෙයින් විවිධ අධ්‍යාපන කලාපයන්හි සිටි පාසල් 70 ක් යාන්ත්‍රිකව තෝරාගෙන සමීක්ෂණ නියැදි සාම්පලය ලෙස භාවිතා කරන ලදී.<br>• වැඩි දියුණු කරන ලද ප්‍රශ්නාවලිය ඉන්පසුව තෝරාගත් පාසල් වෙත බෙදා හරින ලදී. ලැබුණු ප්‍රතිචාර දත්ත විශ්ලේෂණය සඳහා භාවිතා කරන ලදී.<br>• මෙම අධ්‍යයනයට අදාළ අධ්‍යයන වාර්තාව සකස් කර ඒ සඳහා අවශ්‍ය සංශෝධන කිරීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ සභාපතිතුමා වෙත ඉදිරිපත් කරන ලදී.<br>• දැනුම ප්‍රචාරණය සඳහා මෙම පර්යේෂණ වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. | පර්යේෂණ වාර්තාව ජාතික අධ්‍යාපන කොමිෂන් සභා නිල වෙබ් අඩවියට ඇතුළත් කර ඇත.<br><br>අධ්‍යයනය 100 % අවසන්ව ඇත. | අධ්‍යයනය නිම කර ඇත. |

| | ක්‍රියාකාරකම | අපේක්ෂිත කාර්යසාධනය 30.09.2025 | | 2025.12.31 වන විට අපේක්ෂිත කාර්යසාධනය |
|---|---|---|---|---|
| | | භෞතික | භෞතික % | |
| 03 | පාසල්වල 11 ශ්‍රේණියේ සිසුන්ගේ වෘත්තීය සූදානම පිළිබඳ පර්යේෂණය | • අධ්‍යාපන අමාත්‍යාංශයේ සහ ජාතික අධ්‍යාපන ආයතනයේ උපදේශන හා මාර්ගෝපදේශ විෂයය සම්බන්ධව කටයුතු කරන නිලධාරින් සමග එක්ව ප්‍රශ්නාවලි 2ක් සකස් කිරීම.<br>• එකොළහ ශ්‍රේණියේ සිසුන් සඳහා ප්‍රශ්නාවලිය<br>• ශිෂ්‍ය උපදේශන හා මාර්ගෝපදේශ ගුරුවරුන් සඳහා ප්‍රශ්නාවලිය<br>• විදුහල්පතිවරුන්, උපදේශන හා මාර්ගෝපදේශ විෂයය සම්බන්ධව කටයුතු කරන පළාත් සහ කලාප අධ්‍යාපන කාර්යාල නිලධාරින් සහ ගුරුවරුන් කණ්ඩායමක් සමඟ ප්‍රශ්නාවලියේ වලංගුතාව තහවුරු කර ගැනීම සඳහා වැඩමුළුවක් පැවැත්වීම.<br>• ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තුමේන්තුවේ සහය ඇතිව මෙම ප්‍රශ්නාවලි පළාත් 9 තුළ බෙදා දීමට සුදුසු නියැදිය සකස් කිරීම.<br>• තෝරාගත් පාසල් කිහිපයක නියමු අධ්‍යයනය සිදු කර ප්‍රශ්නාවලි යාවත්කාලීන කිරීම.<br>• දිවයින පුරා තෝරාගත් නියැදියට අදාළ පාසල් සඳහා ප්‍රශ්නාවලි බෙදා හැරීම. මෙහිදී අධ්‍යයන නියැදිය ලෙස පාසල් 490 ක එකොළහ ශ්‍රේණියේ සිසුන් 8738 කට ප්‍රශ්නාවලියක් ලබා දෙන ලදී.<br>• පාසල් 490 ක ගුරුවරු සහ සිසුන්ගෙන් දත්ත එක්රැස් කිරීම සහ දත්ත පරිගණකගත කිරීම.<br>• දත්ත විශ්ලේෂණය කිරීම | අවසන් වාර්තාව සැකසීම මේ වන විට සිදු කරමින් පවතී. අධ්‍යයනයෙන් 80% පමණ අවසන්ව ඇත | අවශ්‍ය සංශෝධන කටයුතු සිදුකර වාර්තාව අවසන් කිරීම |

2025 වසර සඳහා වැඩමුළු සඳහා කාර්ය මණ්ඩලය සහභාගීකරවීම් සම්බන්ධ තොරතුරු

| අංකය | නිලධාරියාගේ නම | පාඨමාලාව | පාඨමාලාව පවත්වා ඇත/නැත | ගාස්තුව (රු. ශත) | ගෙවීම් කර ඇත/නැත |
|---|---|---|---|---|---|
| 01 | ඩබ්ලිව්. ඒ. ඩී.ටී. ජයසිංහ මිය | Master of Public Administration in Education Management | ඇත | 155,500.00 | √ |
| 01 | එච්. ඩී. කත්‍රිආරච්චි මිය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2025 වැඩමුළුව | ඇත | 42,000.00 | √ |
| 02 | ඊ. ජී. අයි ගමගේ මිය | | | | |
| 03 | එම්. ඇලෙක්ස් පිගුරාඩෝ මහතා | | | | |
| 04 | ජී. එල් නිමේෂා මිය | පැය 150 දෙමළ පාඨමාලාව | ඇත | 1,500.00 | √ |
| 05 | එන්. පී. ජේ. හේවගේ මහතා | පැය 200 දෙමළ පාඨමාලාව | ඇත | 5,338.99 | √ |
| 06 | ආචාර්ය ආර්. කේ. ආර්. එස්. රණසිංහ මිය | | | | |
| 07 | ආචාර්ය ඩබ්. ඩබ්. පී. එන්. වීරකෝන් මිය | | | | |
| 08 | එම්. ඇලෙක්ස් පිගුරාඩෝ මහතා | පැය 150 සිංහල පාඨමාලාව | ඇත | _ | X |
| 09 | කේ. අයි.ආර්. කේ. පෙරේරා මයා | පැය 100 දෙමළ පාඨමාලාව | ඇත | _ | X |
| | | එකතුව | | 204,338.99 | |

| Name of the Research | Total Allocation accoring to Action Plan (Rs.) | Total Expendi-rure(Rs.) | Balance (Rs.) | Percent-age of Ex-penditure |
|---|---|---|---|---|
| Present Status Assesment of the 13 - year Guaranteed Edu-cation Programme (Continuation) | 200,000.00 | - | 200,000.00 | - |
| Primary School Teachers' Perception on Readiness for Schooling of Children Entering Grade 1 (Continuation) | 1,400,000.00 | - | 1,400,000.00 | - |
| Teenage Career Readiness: An Assessment of Career Readi-ness of Senior Secondary Students (Continuation) | 1,700,000.00 | 847,040.00 | 852,960.00 | 49.80% |
| Review of the National Preschool Policy (2025) | 1,500,000.00 | - | 1,500,000.00 | - |
| Evaluation of the Current Digital Education in Sri Lanka (2025) | 2,500,000.00 | - | 2,500,000.00 | - |
| Others | | 75,000.00 | | - |
| **Total** | **7,300,000.00** | **922,040.00** | **6,452,960.00** | **12.63%** |